# වාර්ෂික කාර්යසාධන වාර්තාව

# 2022

කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය

# වාර්ෂික කාර්යසාධන වාර්තාව
# 2022

කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය

# වාර්ෂික කාර්යසාධන වාර්තාව - 2022

## වැය ශීර්ෂ අංක 193

*සියලු හිමිකම් ඇවිරිණි*

2023 මැයි

**ප්‍රකාශනය**
කම්කරු හා විදේශ රැකියා  අමාත්‍යාංශය
7 මහළ, “මෙහෙවර පියෙස”
නාරාහේන්පිට
කොළඹ 05
දුරකථනය: 0112 581 991

**මුද්‍රණය**
ප්‍රින්ටෙක් එෂ්ටැබ්ලිෂ්මන්ට් පුද්ගලික සමාගම - 0112 815 816



## කම්කරු හා විදේශ රැකියා
## ගරු අමාත්‍යතුමාගේ පණිවිඩය

කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය 2022 වර්ෂය තුළ අත්පත් කරගත් ප්‍රගතිය ඇතුළත් කාර්යසාධන වාර්තාවට පණිවුඩයක් එක් කිරීමට ලැබීම පිළිබඳව මම අතිශයින් සතුටු වෙමි.

දෙස් විදෙස් රැකියා වෙළඳපොළ වෙත නිපුණ මානව සම්පත සැපයීම සහ කාර්මික සාමය හා සහයෝගීතාව, සමාජ සුරක්ෂිතතාවය, කම්කරු අයිතිවාසිකම් ආරක්ෂා කිරීම හා ඵලදායිතාව ප්‍රවර්ධනය තුළින් සමාජ ආර්ථික සංවර්ධනයට දායක වීම සුවිශේෂී ප්‍රමුඛතා ලෙස හඳුනා ගනිමින් කටයුතු කිරීමේ වගකීම, කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය හා ඊට අනුබද්ධිත ආයතන වන කම්කරු දෙපාර්තමේන්තුව, මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය, කම්කරු වන්දි කොමසාරිස් කාර්යාලය, ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය, ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය, ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය, ශ්‍රම වාසනා අරමුදල හා විදේශ රැකියා ඒජන්සිය යන ආයතන වෙත පවරා ඇත.

රටේ පවතින වර්තමාන ආර්ථික අභියෝග හමුවේ විදේශ විනිමය ඉපැයීම් වැඩි කරගැනීම හා ජාතික ආර්ථිකය ශක්තිමත් කර ගැනීම සඳහා විදේශ රැකියා අවස්ථා බහුල කිරීම, ප්‍රවර්ධනය කිරීම හා එම රැකියාවන් සඳහා අවශ්‍ය නිපුණතාවන් වැඩිදියුණු කිරීම, විදේශගත ශ්‍රමිකයින්ගේ ආරක්ෂාව සහතික කිරීම සඳහා අවශ්‍ය නීතිමය හා නියාමන ක්‍රියාවලීන් හඳුන්වාදීම, විදේශගත ශ්‍රමිකයින්ට විදේශ විනිමය ශ්‍රී ලංකාව තුළ ඉතිරි කිරීමට හා ආයෝජනය කිරීමට විශේෂ පහසුකම් සැපයීම සඳහා විදෙස් ශ්‍රමිකයින් උපයන මුදල් නීත්‍යානුකූල මාර්ගවලින් ශ්‍රී ලංකාවට ප්‍රේෂණය කිරීම ප්‍රවර්ධනය සඳහා ආකර්ෂණීය වැඩපිළිවෙලක් අප අමාත්‍යාංශය විසින් දියත් කර තිබේ. එම වැඩසටහන්වල ප්‍රතිඵලයක් ලෙස 2022 වර්ෂයේ අප්‍රේල් මස වන විට ඇ.එ.ජ.ඩො. මිලියන 249ක්ව පැවති විදේශ ප්‍රේෂණ ප්‍රමාණය 2023 අප්‍රේල් වන විට ඇ.එ.ජ.ඩො. මිලියන 454 දක්වා 82%කින් වර්ධනය කර ගැනීමට හැකි වී ඇත. මීට අමතරව, කම්කරු ජනතාවගේ අයිතිවාසිකම් සුරක්ෂිත කිරීමට, රට තුළ ආයෝජන හිතකාමී පරිසරයක් ඇති කිරීමට මෙන්ම අනාගත අභියෝගයන්ට සාර්ථකව මුහුණ දීමට හැකි වන සේ යල්පැන ගිය කම්කරු අණපනත් වර්තමානයට ගැලපෙන පරිදි සංශෝධනය කරමින් සේව්‍ය - සේවක ප්‍රජාවට ලැබෙන ප්‍රතිලාභ පුළුල් කිරීමට කටයුතු කරමින් පවතින බවත් සතුටින් ප්‍රකාශ කරමි.

අමාත්‍යාංශය විසින් ලබා දෙනු ලබන සේවාවන් තව දුරටත් මහජනතාවට සමීප කිරීමට නවීන තාක්ෂණය භාවිතයෙන් කම්කරු දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් සපයනු ලබන සේවාවන් ඩිජිටල්කරණය සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. එසේම, වර්තමාන සමාජය තුළ නිල් කරපටි රැකියාවන් වශයෙන් හඳුන්වා දී ඇති රැකියාවන්හි ගුණාත්වය ඉහළ නංවා ඔවුන්ගේ රැකියා අභිමානය ඉහළ නැංවීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලැබේ. එමෙන්ම, වර්තමාන වැඩ ලෝකයට ඉතාම

වැදගත් වන ශ්‍රම වෙළඳපොළ තොරතුරු පද්ධතියක් ස්ථාපනය සඳහා මූලික අඩිතාලම යොදන ලදී.

ගරු ජනාධිපතිතුමන්ගේ ප්‍රතිපත්තීන් තුළ හිඳිමින් රටේ ආර්ථිකයට පිටිබලයක් ලබාදීම සඳහා දිස්ත්‍රික් මට්ටමින් ජංගම සේවා වැඩසටහන් මාලාවක් සංවිධානය කිරීමේ මූලික අඩිතාලම 2022 වර්ෂයේ ආරම්භ කරන ලද අතර ඒ ඔස්සේ දේශීය හා විදේශීය රැකියා අවස්ථා හඳුන්වා දෙමින් සේවා වියුක්තිය අවම කිරීමටත් වැඩකරන කම්කරු ජනතාවගේ ගැටළුවලට විසඳුම් ලබා දීම හා අයිතිවාසිකම් සුරක්ෂිත කිරීමටත් කටයුතු කරමින් පවතී.

2022 වර්ෂය තුළ විශිෂ්ඨ කාර්යසාධනයක් අත්පත් කර ගැනීමට කටයුතු කිරීමෙහිලා උරදෙන විදේශ රැකියා ප්‍රවර්ධන ගරු රාජ්‍ය අමාත්‍ය ජගත් පුෂ්පකුමාර මැතිතුමන්ට හා අමාත්‍යාංශ ලේකම් ආර් පී ඒ විමලවීර මහතා ඇතුළු සමස්ත කාර්ය මණ්ඩලයටත් අමාත්‍යාංශය යටතේ පවතින සියලුම ආයතනවල ප්‍රධානීන් ඇතුළු කාර්ය මණ්ඩල නිලධාරීන්ටත් මාගේ කෘතඥතාවය පිරිනමමි.

**මනුෂ නානායක්කාර (පා. ම.)**
කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය



# විදේශ රැකියා ප්‍රවර්ධන
# ගරු රාජ්‍ය අමාත්‍යතුමාගේ පණිවිඩය

ශ්‍රී ලංකාවේ ආර්ථිකයට විදේශ රැකියා අංශයෙන් ලැබෙන ප්‍රතිලාභ දෙආකාරයකින් වැදගත් වේ. එක් අතකින් රටට අවශ්‍ය විදේශ විනිමය සපයන අතර, අනෙක් අතින් රටේ විරැකියාවට පිළිතුරු ලබාදෙයි. ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ පුරෝකථනවලට අනුව ඉදිරි දශකය තුළ ශ්‍රී ලංකාවේ වයස අවුරුදු 20 - 30ත් අතර ජනගහණයේ කැපී පෙනෙන වැඩිවීමක් පෙන්නුම් කරයි. මෙතරම් විශාල පිරිසක් ශ්‍රම බලකායට එකතුවීම නිසා ඔවුන්ට දේශීයව රැකියා සැපයීම ගැටලුකාරී විය හැකි ය. තව ද දැනට රට මුහුණ පා ඇති ආර්ථික අර්බුදය නිසා රටේ ආර්ථිකය හැකිලීමට ලක් වී ඇති බැවින් ඉදිරියේ දී දේශීය රැකියා වෙළඳපළේ වැඩි වන ශ්‍රම බලකාය සඳහා රැකියා ලබාදීම වඩාත් අභියෝගාත්මක තත්ත්වයකට පත්විය හැකි වේ.

දැනට රජය විසින් විදේශ රැකියාවල නිරතව රටට අවශ්‍ය විදේශ විනිමය පිළිගත් බැංකු පද්ධතිය හරහා ප්‍රේෂණය කරන විගමනික ශ්‍රමිකයන්ට ප්‍රතිලාභ සැපයීම සඳහා විවිධ වැඩසටහන් ආරම්භ කර ඇත. එසේ ආරම්භ කර ඇති විද්‍යුත් වාහන ආනයන බලපත් ක්‍රමය, විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය හා අනිකුත් ප්‍රතිලාභ නිසා මෙම ක්ෂේත්‍රය පිළිබඳ ජනතාවගේ විශාල උනන්දුවක් ඇති වී තිබේ. පසුගිය අප්‍රේල් මාසයේ ඩොලර් මිලියන 249ක් වැනි අවම මට්ටමක පසු වූ විදේශ ප්‍රේෂණ ප්‍රමාණය 2023 අප්‍රේල් මස වන විට ඩොලර් මිලියන 454 දක්වා වැඩි වී ඇති අතර ඒ සඳහා ඉහත වැඩසටහන් හේතු වී ඇත.

2022 වසරේ රැකියා සඳහා විදේශ ගතවීම් 311,161 පමණ වාර්තා වී ඇති අතර, ඉන් බහුතරයක් ගෘහ සේවා හා නුපුහුණු ශ්‍රමිකයින් වේ. ඔවුන්ගෙන් වැඩි කොටසක් ජීවත්වන්නේ පහසුකම් අඩු ග්‍රාමීය ප්‍රදේශවල වේ. මනා පුහුණුවක් නොමැතිකම නිසා ඔවුන් විදේශ ගතවීම් වල දී වඩාත් ම කරදර හා පීඩාවලට පත්වන බව වාර්තා වේ. ඊට හේතු වන්නේ විදේශ රැකියා සඳහා යොමු වන පිරිස් වෙනුවෙන් රජය මඟින් ක්‍රියාත්මක විවිධ වැඩසටහන් පිළිබඳ ඔවුන්ට ප්‍රමාණවත් දැනුමක් නොමැති වීමයි. අමාත්‍යාංශයේ පිහිටුවා ඇති ප්‍රාදේශීය පරිපාලන ව්‍යුහය හරහා ඔවුන්ට හා ඔවුන්ගෙන් යැපෙන්නන්ට මනා සේවාවන් ලබාදිය හැකි ය. මේ සඳහා මෙම නිලධාරීන් දිස්ත්‍රික් මට්ටමෙන් හමු වී ඒකාබද්ධ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය පසු විපරම් කළ යුතු අතර, ඒ සඳහා මේ වන විට පියවර ගෙන ඇති අතර පළාත් මට්ටමින් ප්‍රගති සමාලෝචන රැස්වීම් පවත්වනු ලැබේ.

**ඒ.පී. ජගත් පුෂ්පකුමාර (පා.ම.)**
විදේශ රැකියා ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍ය



## කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශ ලේකම්තුමාගේ පණිවිඩය

වැඩකරන ජනතාවගේ අයිතිවාසිකම් ආරක්ෂා කරදීම, ඔවුන්ගේ සේවා සුරක්ෂිතතාවය සලසා දීම හා රට තුළ කාර්මික සාමය ස්ථාපනය සහ විදේශීය රැකියා වෙළඳපළ වෙත නිපුණ ශ්‍රමිකයින් යොමු කිරීම යන ක්ෂේත්‍රයන් ඔස්සේ කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය විසින් 2022 වර්ෂය තුළ සිදු කළ ඵලදායී කාර්යභාරය හා 2023 වර්ෂයට සැලසුම්ගත කාර්යභාර්යන් පිළිබඳව සකස් කරනු ලබන කාර්යසාධන වාර්තාව ඔබ වෙතට පත් කරන්නේ මහත් අභිමානයෙනි.

රටේ පවතින වර්තමාන අර්බුදකාරී තත්වය හමුවේ විදේශ විනිමය ඉපැයීම් වැඩි කරගැනීම ජාතික ආර්ථිකය ශක්තිමත් කර ගැනීම සඳහා අත්‍යවශ්‍ය කරුණකි. එසේම, රට තුළ කාර්මික සාමය ආරක්ෂා කර ආයෝජන හිතකාමී පරිසරයක් ඇති කිරීම තුළින් දේශීය නිෂ්පාදන ඉහළ නැංවීම ද පවතින ආර්ථික අර්බුදය සමනය කර ගැනීම සඳහා ඉවහල් වන බැවින්, මෙම අමාත්‍යාංශය විසින් නව වැඩසටහන් රැසක් අරඹා ඇත.

වර්තමාන මෙන්ම අනාගත අභියෝගවලට මුහුණ දීම සඳහා මෙන්ම වැඩකරන ජනතාවගේ අයිතිවාසිකම් තහවුරු කිරීමට සහ පනත් අතර පවතින සංකීර්ණතා ඉවත් කර සරල කරමින් සියලු පාර්ශවයන්ට ප්‍රතිලාභ සහතික කිරීම සඳහා අණපනත් සංශෝධනය කිරීමට කටයුතු කරනු ලැබේ. එසේම, කම්කරු දෙපාර්තමේන්තුව විසින් සේවාලාභීන් වෙත සිය සේවා කාර්යක්ෂමව සැපයීමේ අරමුණ පෙරදැරිව දෙපාර්තමේන්තුවේ ඩිජිටල්කරණ කටයුතු වේගවත් කරමින් පෞද්ගලික සහ අර්ධ රාජ්‍ය අංශයේ සියලුම සේවකයන් සේවයට බැඳුනු දින සිට විශ්‍රාම ලබා ගන්නා තෙක් කම්කරු දෙපාර්තමේන්තුව විසින් සපයනු ලබන සියලු සේවා ඩිජිටල්කරණය කිරීමේ මූලික කටයුතු දැනටමත් ආරම්භ කර ඇත.

මෙරටට වැඩි වශයෙන් විදේශ විනිමය ලබා ගැනීමේ අරමුණින් 2022 වසර තුළ ශ්‍රී ලාංකිකයින් 300,000කට වැඩි ප්‍රමාණයක් බලපත්‍රලාභී විදේශ රැකියා නියෝජිතායතන මඟින් විදේශ රැකියා සඳහා යොමු කර ඇත. විදේශ රැකියා අවස්ථා ප්‍රවර්ධනය කිරීම සඳහා සහ විදේශ රැකියාවේ නියුක්ත ශ්‍රී ලාංකිකයින් විසින් තමා උපයන මුදල් නීත්‍යානුකූල මාර්ගවලින් ශ්‍රී ලංකාවට ප්‍රේෂණය කිරීම දිරිමත් කිරීමට පූර්ණ විද්‍යුත් වාහන ආනයනය කිරීම සඳහා බලපත්‍ර ලබාදීම, විදේශගත ශ්‍රමිකයින් සඳහා දායකත්ව විශ්‍රාම වැටුප් ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම හා විවිධ සුභසාධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම වැනි ක්‍රියාමාර්ග රැසක් ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් ගෙන ඇත.

ශ්‍රී ලංකාවේ වැඩකරන ජනතාවගේ වෘත්තීය සුරක්ෂිතතාවය හා ආරක්ෂාව සම්බන්ධයෙන් රැකියා නිසා සිදුවන අනතුරු හා ලෙඩ රෝග වැළැක්විම තුළින් සුරක්ෂිත වැඩබිමක් හා නිරෝගිමත් ශ්‍රම බලකායක් නිර්මාණය කිරීමේ කාර්යය තවදුරටත් පුළුල් කරමින් ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය 2023 වර්ෂයේ සිට මහා භාණ්ඩාගාර අරමුදල් ලබා නොගෙන ස්වයං මූල්‍ය ආයතනයක් ලෙස ස්ථාවරව පවත්ගෙනයාමටත් ආයතනය

වෘත්තීය සුරක්ෂිතතාවය හා සෞඛ්‍ය පිළිබඳව ජාත්‍යන්තර තලයේ ආයතනයක් බවට පත් කිරීමටත් අපේක්ෂිතය.

රටෙහි පවත්නා  අර්බුදකාරී තත්වය හමුවේ වුවද වැඩකරන කම්කරු ජනතාවගේ අයිතිවාසිකම් සුරක්ෂිත කිරීමට ප්‍රමුඛතාවයක් දී කටයුතු කර ඇති අතර පවත්නා මූල්‍ය අභියෝග හමුවේ පවා පීඩාවට පත්ව සිටින සේවායෝජක ප්‍රජාවද ආරක්ෂා කිරීමට හැකි සෑම උත්සාහයක්ම ගෙන ඇත. ගරු කම්කරු හා විදේශ රැකියා අමාත්‍යතුමාගේ උපදෙස් හා මඟ පෙන්වීම යටතේ රටේ ආර්ථිකයට පිටිබලයක් ලබාදීම සඳහා දිස්ත්‍රික් මට්ටමින් ජංගම සේවා වැඩසටහන් මාලාවක් සංවිධානය කිරීමේ මූලික අඩිතාලම 2022 වර්ෂයේදී යොදන ලදී.

රටේ සංවර්ධනයට දායක වන ඵලදායි මානව සම්පතක් ගොඩනැගීම උදෙසා මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලබන වෘත්තීය මාර්ගෝපදේශය මඟින් ප්‍රබල දායකත්වයක් ලබාදේ. එමෙන්ම, අමාත්‍යාංශය යටතේ පවතින කම්කරු වන්දි කොමසාරිස් කාර්යාලය, ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය, ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය, ශ්‍රම වාසනා අරමුදල සහ විදේශ රැකියා ඒජන්සිය මඟින් සේවක සුභසාධනය, කම්කරු නීති රීති පිළිබඳව දැනුවත් කිරීම, රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ඵලදායිතා ප්‍රවර්ධනය සහ විදේශ රැකියා සඳහා පුද්ගලයන් යොමු කිරීම සඳහා වැඩසටහන් රැසක් ක්‍රියාත්මක කරනු ලබයි.

ඉහත සඳහන් කළ කාර්යයන් ඉටු කිරීමට අවශ්‍ය නායකත්වය, මඟපෙන්වීම හා අනුශාසකත්වය ලබා දුන් කම්කරු හා විදේශ රැකියා ගරු අමාත්‍ය මනූෂ නානායක්කාර මැතිතුමන්ට හා විදේශ රැකියා ප්‍රවර්ධන ගරු රාජ්‍ය අමාත්‍ය ජගත් පුෂ්පකුමාර මැතිතුමන්ට කෘතඥතාවය පළ කරමි.

2022 වසර තුළ ඉහත කාර්යසාධනය අත්කර ගැනීමෙහිලා මහත් වූ කැපවීමෙන් ක්‍රියා කළ අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරුන් ඇතුලු කාර්ය මණ්ඩලයටත්, කම්කරු කොමසාරිස් ජනරාල්, මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්, කම්කරු වන්දි කොමසාරිස්, ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය සහ ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය යන ආයතනයන්හි අධ්‍යක්ෂ ජනරාල්වරුන්, ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂ, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය, ශ්‍රම වාසනා අරමුදල හා විදේශ රැකියා ඒජන්සිය යන ආයතනවල සාමාන්‍යාධිකාරීවරුන්ට සහ එම ආයතනවල සියලුම මට්ටම්වල නිලධාරීන්ටත් මාගේ කෘතඥතාවය පිරිනමමි.

**ආර් පී ඒ විමලවීර**
ලේකම්

# පටුන


කම්කරු හා විදේශ රැකියා ගරු අමාත්‍යතුමාගේ පණිවිඩය iii
විදේශ රැකියා ප්‍රවර්ධන ගරු රාජ්‍ය අමාත්‍යතුමාගේ පණිවිඩය v
කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශ ලේකම්තුමාගේ පණිවිඩය vi

පටුන ix
වගු නාමාවලිය x
ප්‍රස්තාර නාමාවලිය xi
රූප සටහන් නාමාවලිය xi
ඡායාරූප නාමාවලිය xii

**පළමු පරිච්ඡේදය**
ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය 1
කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය 3
1.1 හැඳින්වීම 3
1.2 දැක්ම, මෙහෙවර හා අරමුණු 3
1.3 අමාත්‍යාංශයේ ප්‍රධාන කාර්යයන් 3
1.4 සංවිධාන සටහන 5
1.5 අමාත්‍යාංශය යටතේ පවතින අංශ 6
1.6 අමාත්‍යාංශය යටතේ පවතින ආයතන 8
1.6.1 කම්කරු දෙපාර්තමේන්තුව 8
1.6.2 ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය 10
1.6.3 මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව 11
1.6.4 ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය 11
1.6.5 ජාතික වෘත්තීය සුරක්ෂිතතා සහ සෞඛ්‍ය ආයතනය 11
1.6.6 කම්කරු වන්දි කොමසාරිස් කාර්යාලය 12
1.6.7 ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය 13
1.6.8 ශ්‍රම වාසනා අරමුදල 13
1.6.9 ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සි පුද්ගලික සමාගම 14
1.7 අමාත්‍යාංශයේ කාර්ය මණ්ඩල සංයුතිය 15

**දෙවන පරිච්ඡේදය**
ප්‍රගතිය හා ඉදිරි දැක්ම 17
2.1 විශේෂ ජයග්‍රහණ, අභියෝග හා ඉදිරි දැක්ම 19
2.2 අමාත්‍යාංශයේ ප්‍රගතිය 28

**තෙවන පරිච්ඡේදය**
2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්යසාධනය 85
3.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය 87
3.2 2022.12.31 දිනට මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය 89
3.3 2022.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වන මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය 90
3.4 මූල්‍ය ප්‍රකාශ සටහන් 91
3.5 ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය 92
3.6 වෙන් කරන ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය 92
3.7 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ / දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම අමාත්‍යාංශයට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන 92
3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය 93
3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව 94

**සිව්වන පරිච්ඡේදය**
කාර්යසාධන දර්ශක 103
4.1 අමාත්‍යාංශයේ කාර්යසාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව) 105

**පස්වන පරිච්ඡේදය**
තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය 109
5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසර සංවර්ධන අරමුණු 111
5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග 115

**සයවන පරිච්ඡේදය**
මානව සම්පත් පැතිකඩ 117
6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය 119
6.2 ආයතනයේ කාර්යසාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපා ඇති ආකාරය 119
6.3 මානව සම්පත් සංවර්ධනය 119

**හත්වන පරිච්ඡේදය**
අනුකූලතා වාර්තාව 139

# වගු නාමාවලිය


වගුව 1.1 අමාත්‍යාංශයේ කාර්ය මණ්ඩල සංයුතිය 15
වගුව 2.1 විගමනික ශ්‍රමිකයන් වෙනුවෙන් ක්‍රියාත්මක සුබසාධන වැඩසටහන් - ශ්‍රී.ලං.වි.සේ.නි.කාර්. 38
වගුව 2.2 විගමනික ශ්‍රමිකයන්ගේ දූදරුවන් වෙනුවෙන් ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම - ශ්‍රී.ලං.වි.සේ.නි.කාර්. 39
වගුව 2.3 පුහුණු වැඩසටහන් පැවැත්වීම - ශ්‍රී.ලං.වි.සේ.නි.කාර්. 39
වගුව 2.4 විදේශ රැකියා නියෝජිත ආයතන සඳහා බලපත් නිකුත් කිරීම්, විදේශ රැකියා ඇණවුම් අනුමත කිරීම් සහ විදේශ රැකියා සඳහා ලියාපදිංචි කිරීම් 40
වගුව 2.5 විදේශ රැකියා සඳහා බඳවා ගැනීම් සම්බන්ධව බලපත්‍රලාභී නියෝජිත ආයතන/ බලපත්‍රලාභී නොවන වෙනත් පාර්ශවවලට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීම 41
වගුව 2.6 රැකියා බැංකුව හරහා රැකියා අපේක්ෂකයින් ලියාපදිංචි කිරීම - ශ්‍රී.ලං.වි.සේ.නි.කාර්. 41
වගුව 2.7 2022.01.01 දින සිට 2022.12.31 දින දක්වා සිදු කරන ලද දැනුවත් කිරීමේ වැඩසටහන් - කම්කරු දෙපා. 42
වගුව 2.8 පඩිපාලක සභාවල අවම වැටුප් යාවත්කාලීන කිරීම - කම්කරු දෙපා. 46
වගුව 2.9 ආර්ථික අපහසුතා පවතින දරුවන් සිටින තෝරාගත් පවුල් සඳහා අවශ්‍ය ප්‍රතිලාභ ලබා දීම - කම්කරු දෙපා. 52
වගුව 2.10 අධිකරණ අනුව නඩුවල කාර්යසාධනය - 2022.01.01 සිට 2022.12.31 දක්වා - කම්කරු දෙපා. 56
වගුව 2.11 වෘත්තීය මාර්ගෝපදේශ වැඩසටහන්වල ප්‍රගතිය - මි.හා රැ.දෙපා. 61
වගුව 2.12 මූල්‍ය ප්‍රතිපාදන නොමැතිව සිදු කරන ලද වැඩසටහන් - මි.හා රැ.දෙපා 62
වගුව 2.13 ශ්‍රම වෙළඳපොළ තොරතුරු ප්‍රකාශයට පත් කිරීම - මි.හා රැ.දෙපා 63
වගුව 2.14 මානව සම්පත් කළමනාකරණ හා ජාත්‍යන්තර සබඳතා - මි.හා රැ.දෙපා 63
වගුව 2.15 රැකියාපොළ වැඩසටහන් - මි.හා රැ.දෙපා 67
වගුව 2.16 පුහුණු වැඩසටහන්වල භෞතික ප්‍රගතිය - ජා.ශ්‍ර.අ.ආ. 69
වගුව 2.17 2022 වර්ෂයේදී සිදු කරන ලද විභාග සම්බන්ධ තොරතුරු - ජා.ශ්‍ර.අ.ආ. 70
වගුව 2.18 වෘත්තීය ආරක්ෂාව සහ සෞඛ්‍ය වැඩි දියුණු කිරීම සඳහා සිදු කළ වැඩසටහන් - ජා.වෘ.සු.හා සෞ.ආ. 71
වගුව 2.19 වෘත්තීය ආරක්ෂාව සහ සෞඛ්‍ය වැඩි දියුණු කිරීම සඳහා සිදු කළ විශේෂ වැඩසටහන් - ජා.වෘ.සු.හා සෞ.ආ. 71
වගුව 2.20 වාර්තා වූ මාරක සහ මාරක නොවන අනතුරුවල ස්වභාවය 73
වගුව 2.21 වාර්තා වූ මාරක නොවන අනතුරුවල හානියේ ස්වභාවය 73
වගුව 2.22 වන්දි ගෙවීමේ කටයුතුවල ප්‍රගතිය 74
වගුව 2.23 ආසියානු ඵලදායිතා සංවිධානයේ දායකත්වය මත ක්‍රියාත්මක කළ ව්‍යාපෘති - ජා.ඵලේ.කාර්. 76
වගුව 2.24 නීති ආධාර ලබාදීම - ශ්‍ර.වා.අර. 78
වගුව 2.25 රැකියා ක්ෂේත්‍ර අනුව විදේශගත වූ ශ්‍රමිකයන් සංඛ්‍යාව - ශ්‍රී ලං.වි.රැ.ඒ. 80
වගුව 2.26 සුනිසි මෙහෙවර වැඩසටහන ක්‍රියාත්මක කිරීම - 2022 81
වගුව 2.27 ආයතන කටයුතුවල ප්‍රගතිය 83
වගුව 2.28 භාණ්ඩාගාර ප්‍රතිපාදන උපයෝජනය කිරීම 83
වගුව 3.1 ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය 92
වගුව 3.2 වෙන් කරන ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය 92
වගුව 3.3 වෙනත් අමාත්‍යාංශ / දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම අමාත්‍යාංශයට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන 92
වගුව 3.4 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය 93
වගුව 4.1 ආමාත්‍යාංශයේ කාර්යසාධන දර්ශක 105
වගුව 5.1 අමාත්‍යාංශයට අදාළ තිරසර සංවර්ධන අරමුණු 111
වගුව 6.1 2022.12.31 දිනට අමාත්‍යාංශයේ කාර්ය මණ්ඩලය 119
වගුව 6.2 අමාත්‍යාංශ නිලධරයන් දේශීය පුහුණු පාඨමාලා සඳහා සහභාගීත්වය 120
වගුව 6.3 පුහුණු පාඨමාලා සාරාංශය - ශ්‍රී.ලං.වි.සේ.නි.කා. 131
වගුව 6.4 විදේශ පුහුණු පාඨමාලා සඳහා නිලධරයන්ගේ සහභාගීත්වය 132
වගුව 7.1 අනුකූලතා වාර්තාව 139

# ප්‍රස්තාර නාමාවලිය


ප්‍රස්තාරය 2.1 ශ්‍රමික සුරැකුම වැඩසටහන යටතේ ලියාපදිංචිය 35
ප්‍රස්තාරය 2.2 සකස් කරන ලද පවුල් සංවර්ධන සහ රැකවරණ සැලසුම් 36
ප්‍රස්තාරය 2.3 2018 සිට 2022 දක්වා ව්‍යවස්ථාපිත හිමිකම් කඩවීම් පිළිබඳ පැමිණිලි ලැබීම් හා විසඳීම් 44
ප්‍රස්තාරය 2.4 2018 සිට 2022 දක්වා කාර්මික ආරවුල් පිළිබඳ පැමිණිලි ලැබීම් හා විසඳීම් 45
ප්‍රස්තාරය 2.5 සේවක අර්ථසාධක අරමුදල් අයදුම්පත් භාරදීමට වේලාවක් වෙන් කරවා ගැනීමේ පද්ධතිය හරහා වේලාවක් වෙන් කරගත් සංඛ්‍යාව - සැප්තැම්බර් මාසයේ සිට 54
ප්‍රස්තාරය 2.6 2022.01.01 දින සිට 2022.12.31 දින දක්වා සේවක අර්ථසාධක අරමුදලේ ප්‍රතිලාභ ලැබූ ප්‍රතිලාභීන් සංඛ්‍යාව 54
ප්‍රස්තාරය 2.7 සේවක අර්ථසාධක අරමුදල් ප්‍රතිලාභ ගෙවීම් සඳහා ගතවූ කාලය - 2017 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා 55
ප්‍රස්තාරය 2.8 මහේස්ත්‍රාත් අධිකරණයන්හි පවරා ඇති නඩු සහ විසඳා ඇති නඩු 56
ප්‍රස්තාරය 2.9 පුහුණු වැඩසටහන්වලින් ලද ආදායම - ජා.ශ්‍ර.අ.ආ. 69
ප්‍රස්තාරය 2.10 වාර්තා වූ මාරක අනතුරු ප්‍රමාණය 72
ප්‍රස්තාරය 2.11 වාර්තා වූ මාරක සහ මාරක නොවන අනතුරු ප්‍රමාණය 73
ප්‍රස්තාරය 2.12 සංචාරක අධිකරණ ප්‍රදේශ අනුව වාර්තා වූ අනතුරු ප්‍රමාණය 74
ප්‍රස්තාරය 2.13 ශ්‍රම වාසනා අරමුදලේ වර්ධනය 79
ප්‍රස්තාරය 2.14 ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සි (පුද්.) සමාගම මඟින් විදේශගත වූ ශ්‍රමිකයින් සංඛ්‍යාව 80
ප්‍රස්තාරය 2.15 අභ්‍යන්තර විගණන කටයුතුවල ප්‍රගතිය 84


# රූප සටහන් නාමාවලිය


රූපසටහන 1.1 අමාත්‍යාංශයේ සංවිධාන සටහන 5
රූපසටහන 1.2 කම්කරු දෙපාර්තමේන්තුවේ ව්‍යුහය 9
රූපසටහන 1.3 ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ව්‍යුහය 10
රූපසටහන 2.1 2022 වර්ෂය තුළ සිදු කළ කම්කරු පරීක්ෂණ 43
රූපසටහන 2.2 2022 වර්ෂය තුළ වාර්තා වූ වැඩ වර්ජන පිළිබඳ තොරතුරු 45
රූපසටහන 2.3 දින 05 වැඩසතිය සඳහා අනුමැතිය ලබා දීම 47
රූපසටහන 2.4 සාමුහික ගිවිසුම්වල නීතිමය වලංගුතාවය පරීක්ෂා කිරීම 47
රූපසටහන 2.5 වැටුපෙන් අඩු කිරීම් සඳහා ලැබෙන ඉල්ලීම්වලට අනුමැතිය ලබා දීම 47
රූපසටහන 2.6 දඩ අරමුදල් පිහිටුවීම සඳහා ලැබෙන ඉල්ලීම්වලට අනුමැතිය ලබා දීම 48
රූපසටහන 2.7 අණපනත් සම්බන්ධව විමසීම් වලට පැහැදිලි කිරීම් ලබා දීම 48
රූපසටහන 2.8 කර්මාන්තශාලා පරීක්ෂණ කටයුතු - 2022 49
රූපසටහන 2.9 සේවකයාගේ වෘත්තීය සෞඛ්‍යාරක්ෂිත බව තහවුරු කිරීම සඳහා සිදු කරන ලද ක්‍රියාකාරකම් 50
රූපසටහන 2.10 ළමා ශ්‍රමය පිළිබඳ ලද පැමිණිලි සඳහා පරීක්ෂණ සිදු කිරීම 51
රූපසටහන 2.11 කාන්තාවන් රාත්‍රී සේවයේ යෙදවීමට අදාළ සේවා කොන්දේසි කඩකිරීම් සම්බන්ධයෙන් ලැබුණු පැමිණිලි පිළිබඳ පරීක්ෂණ 51
රූපසටහන 2.12 කාන්තාවන් රාත්‍රී සේවයේ යොදවීම සඳහා අනුමැතිය ලබා දීම - 2022 52
රූපසටහන 2.13 2022.01.01 දින සිට 2022.12.31 දක්වා සේ.අ.අ. නිවේදන යැවීමේ ප්‍රගතිය 55

# ඡායාරූප නාමාවලිය


ඡායාරූපය 2.1 සවුදි අරාබියානු තානාපතිතුමා සමඟ හමුව 34

ඡායාරූපය 2.2 ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ LEED+ ව්‍යාපෘතියේ ප්‍රගතිය සම්බන්ධ වාර්තාව එළිදැක්වීම 35

ඡායාරූපය 2.3 සේ.අ.අ. වේලාව වෙන් කරවා ගැනීමේ පද්ධතිය ආරම්භ කිරීම 59

ඡායාරූපය 2.4 කොරියානු මිනිස්බල අමාත්‍යාංශ නිලධාරීන් සමඟ සාකච්ඡාව 62

ඡායාරූපය 2.5 එක්සත් රාජධානියේ වෘත්තීය සමිති නියෝජිත හමුව 68

ඡායාරූපය 2.6 ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය සම්මන්ත්‍රණය 70

ඡායාරූපය 2.7 ජාතික ඵලදායිතා සම්මාන උළෙල 75

ඡායාරූපය 2.8 අඩු ආදායම්ලාභී කම්කරු පවුල්වල දරුවන් සඳහා පාසල් උපකරණ ලබා දීම 77

ඡායාරූපය 2.9 ලියාපදිංචි රැකියා අපේක්ෂිතයින් විදේශ රැකියා සඳහා යොමු කිරීම 79

ඡායාරූපය 3.1 විගමනික ශ්‍රමික දූ දරුවන් සඳහා අධ්‍යාපන ආධාර ලබා දීම 93

ඡායාරූපය 4.1 විගමනික සුභසාධක වැඩසටහන් පැවැත්වීම 107

ඡායාරූපය 5.1 විගමනික දායකත්ව විශ්‍රාම වැඩසටහන 115

# 01

## පළමු පරිච්ඡේදය

ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය

# කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය

## 1.1 හැඳින්වීම

දේශීය හා විදේශීය වශයෙන් ශ්‍රම වෙළඳපොළ සඳහා යෝග්‍ය පුහුණු ශ්‍රමිකයින් යොමු කිරීම, රැකියාගත කිරීම, ඔවුන්ගේ වෘත්තීය අයිතිවාසිකම් ආරක්ෂා කිරීම, රැකියා සුරක්ෂිතභාවය සහතික කිරීම සහ රට තුළ කාර්මික සාමය ස්ථාපනය තුළින් ආර්ථික සංවර්ධනයට දායක වීම කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශයේ ප්‍රධාන මෙහෙවර වේ.

මෙම මෙහෙවර සාක්ෂාත් කර ගැනීමේදී සුවිශේෂී ක්‍රියාකාරකම් රැසක් තුළින් ශ්‍රම බලකායට විශිෂ්ට සේවාවක් සැපයීමේ වගකීම මෙම අමාත්‍යාංශය සතු වේ. මෙම කාර්යභාරය ඉටු කිරීමේදී තිරසර සංවර්ධන අරමුණු සහ ශ්‍රී ලංකාව විසින් අපරානුමත කර ඇති ජාත්‍යන්තර සම්මුතීන් මත පිහිටා 2022.07.22 දිනැති අංක 2289/43 දරණ අතිවිශේෂ ගැසට් නිවේදනය ප්‍රකාරව අමාත්‍යාංශයේ වැඩසටහන් පෙළ ගස්වා ඇත.

## 1.2 දැක්ම, මෙහෙවර හා අරමුණු

**දැක්ම**
තෘප්තිමත් ඵලදායි ශ්‍රී ලාංකික ශ්‍රම බලකායක්

**මෙහෙවර**
දෙස් විදෙස් රැකියා වෙළඳපොළ වෙත නිපුණ මානව සම්පත සැපයීම සහ කාර්මික සාමය හා සහයෝගීතාව, සමාජ සුරක්ෂිතතාවය, කම්කරු අයිතිවාසිකම් ආරක්ෂා කිරීම හා ඵලදායිතාව ප්‍රවර්ධනය තුළින් සමාජ ආර්ථික සංවර්ධනයට දායක වීම.

## 1.3 අමාත්‍යාංශයේ ප්‍රධාන කාර්යයන්

1. රජය මඟින් ක්‍රියාත්මක කරනු ලබන ප්‍රතිපත්තීන් මත පිහිටා කම්කරු හා විදේශ රැකියා විෂයන්ට අදාළව ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම

2. රැකියා නියුක්තිය සඳහා විගමනය පිළිබඳ ශ්‍රී ලංකාවේ ජාතික ප්‍රතිපත්තිය සහ ජාතික මිනිස්බල හා රැකීරක්ෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම

3. ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව කම්කරු සබඳතා, ප්‍රමිතීන්, සේවක පරිපාලනය, සුභසාධනය සහ සෞඛ්‍ය සම්බන්ධයෙන් ප්‍රතිපත්ති සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම

4. ජාත්‍යන්තර කම්කරු සංවිධානය සහ ජාත්‍යන්තර සමාජ ආරක්ෂණ සංවිධාන සමඟ අන්තර් සහයෝගීතාව පවත්වා ගැනීම

5. සේවක අර්ථසාධක අරමුදල, පෞද්ගලික අර්ථසාධක අරමුදල් සහ පෞද්ගලික විශ්‍රාම ගැන්වීමේ ක්‍රම පරිපාලනය හා නියාමනය කිරීම

6. කාර්මික සබඳතා සහ කාර්මික ආරවුල් නිරාකරණය කිරීම

7. කම්කරු සබඳතාවලට අදාළ නීති රීති සම්පාදනය සහ නියාමනයට අදාළ කටයුතු

8. වෘත්තීය සමිති ලියාපදිංචි කිරීම සහ රාජ්‍ය සහ පෞද්ගලික අංශවල සියලුම වෘත්තීය සමිතිවල කටයුතු රටේ සංවර්ධනයට යොදා ගැනීම සඳහා අවශ්‍ය සාධනීය පියවරයන් හඳුන්වා දීම සහ ක්‍රියාත්මක කිරීම

9. ජාතික ඵලදායිතාවය ඉහළ නැංවීම පිණිස ප්‍රතිපත්ති, වැඩසටහන් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම

10. විදේශ රැකියා අවස්ථා බහුල කිරීම, ප්‍රවර්ධනය කිරීම හා එම රැකියාවන් සඳහා අවශ්‍ය නිපුණතාවන් වැඩිදියුණු කිරීමට අදාළ ආයතන සමඟ කටයුතු කිරීම

11. විදේශගත ශ්‍රමිකයින්ගේ ආරක්ෂාව සහතික කිරීම සඳහා අවශ්‍ය නීතිමය හා නියාමන ක්‍රියාවලීන් හඳුන්වා දීම

12. විදේශගත ශ්‍රමිකයින් සහ විදේශ රටවල ජීවත්වන ශ්‍රී ලාංකිකයින්ට විදේශ විනිමය ශ්‍රී ලංකාව තුළ ඉතිරි කිරීමට හා ආයෝජනය කිරීමට විශේෂ පහසුකම් සැපයීම

13. විදේශ රැකියා නිම කර දිවයිනට පැමිණෙන පුද්ගලයින් සඳහා ව්‍යාපාර ආරම්භ කිරීමට විශේෂ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

14. සංක්‍රමණික සේවා නියුක්තිකයින්ගේ වෘත්තීමය ගැටලුවලට පිළියම් ලබාදීම, ආරක්ෂාව සහ සුභසාධනය පවත්වා ගැනීම


15. විදේශ රටවලදී විවිධ අනතුරුවලට ලක්වන්නන්ට හිමි වන්දි ලබා ගැනීමේ ක්‍රියාවලිය ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය නීතිමය ප්‍රතිසංස්කරණ හඳුන්වා දීම

16. විදේශ රැකියා නියෝජිත ආයතන නියාමනය

17. අමාත්‍යාංශ විෂයයපථයට අයත් වන මහජන සේවාවන් කාර්යක්ෂමව හා මහජන හිතකාමී අයුරින් ලබාදීම

18. කම්කරු දෙපාර්තමේන්තුව, මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය, ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය, ජාතික වෘත්තීය සුරක්ෂිතතා සහ සෞඛ්‍ය ආයතනය, කම්කරු වන්දි කොමසාරිස් කාර්යාලය, ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය, ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සි පුද්ගලික සමාගම සහ ශ්‍රම වාසනා අරමුදල යන ආයතනයන්ට පැවරී ඇති අනෙකුත් සියලුම විෂයන්ට අදාළ කටයුතු හා ආයතනයන් අධීක්ෂණය

## 1.4 සංවිධාන සටහන




V - පුරප්පාඩු

L* - වැටුප් රහිත දේශීය නිවාඩු

**රූපසටහන 1.1** අමාත්‍යංශයේ සංවිධාන සටහන

## 1.5 අමාත්‍යාංශය යටතේ පවතින අංශ

### I. පාලන සහ ආයතන අංශය

අමාත්‍යාංශයේ පරිපාලනය, කළමනාකරණය, සාමාන්‍ය නඩත්තුව, පුහුණු කිරීම සහ අමාත්‍යාංශයත් අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ආයතනත් සම්බන්ධීකරණය කිරීම සහ මානව සම්පත් කළමනාකරණය හා ඒ ආශ්‍රිත රාජකාරි මේ යටතේ සිදු වේ. ඒ අනුව,

- අමාත්‍යාංශයට අනුයුක්ත සියලුම රාජ්‍ය නිලධාරීන්ගේ මෙන්ම ගරු අමාත්‍යතුමන්ගේ සහාය කාර්ය මණ්ඩලයට අදාළ පෞද්ගලික ලිපිගොනු නඩත්තුව හා ඒ ආශ්‍රිත අනෙකුත් ආයතන කටයුතු හා කාර්ය මණ්ඩල තොරතුරු යාවත්කාලීනව පවත්වා ගැනීම

- අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතනවල සේවය කරන නිලධාරීන්ගේ අමාත්‍යාංශය සම්බන්ධයෙන් සිදුකළ යුතු ආයතන හා පරිපාලන කටයුතු

- අමාත්‍යාංශය සඳහා අමාත්‍ය මණ්ඩල සංදේශ සැකසීම හා අමාත්‍ය මණ්ඩල තීරණ පිළිබඳ ක්‍රියා කිරීම

- පවතින නීති යාවත්කාලීන කිරීම හා නව නීති පැනවීම තුළින් කාර්මික සහයෝගිතාවය සහ විදේශ රැකියා ප්‍රවර්ධනය හා සුරක්ෂිතතාවය ඇති කිරීමට ප්‍රතිපත්තිමය දායකත්වය සැපයීම

- උපදේශක කාරක සභා, මහජන පෙත්සම් කාරක සභා වෙතින් සිදු කරන යොමු කිරීම් සඳහා පිළිතුරු සැපයීම මෙන්ම පාර්ලිමේන්තු ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීම, ජනාධිපති කාර්යාලය හා අගමැති කාර්යාලය මඟින් යොමු කරන මහජන පැමිණිලි මෙන්ම සෘජුවම ලැබෙන මහජන ගැටලු අදාළ අංශ වෙත යොමු කිරීම

- අමාත්‍යාංශයේ වාහන පරිපාලනය, අවශ්‍ය යටිතල පහසුකම් සැපයීම, පුහුණු කටයුතු, ප්‍රාග්ධන භාණ්ඩ හා උපකරණ කළමනාකරණය, අතිකාල, නිවාඩු දින වැටුප්, අග්‍රහාර රක්ෂණ සහ ආපදා ණය අනුමත කිරීම ආදී කටයුතු සිදු කරනු ලබයි

### II. සංවර්ධන අංශය

ජාත්‍යන්තර කම්කරු සංවිධානය සමඟ එම සංවිධානයේ සාමාජික රටක් ලෙස ශ්‍රී ලංකාව විසින් ඇති කරගත් බැඳීම, අන්තර්ජාතික වශයෙන් පිළිගත් සම්මුතීන් හා නිර්දේශයන් යටතේ මෙරට කම්කරු අයිතීන් සුරක්ෂිත කිරීම හා කම්කරු ක්ෂේත්‍රයේ ගැටළු විසඳීම සහ විගමනික ක්ෂේත්‍රයට අදාළ ජාත්‍යන්තර සම්මුතීන් මෙන්ම අදාළ අණ පනත්, රෙගුලාසි, මාර්ගෝපදේශ සැකසීම හා ක්‍රියාත්මක කිරීමට අදාළ කටයුතු මෙම අංශය විසින් ඉටු කරනු ලබයි.

- ශ්‍රී ලංකාව විසින් අපරානුමත කර ඇති ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ කම්කරු ප්‍රඥප්තීන්, ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක කිරීම සම්බන්ධ ප්‍රගතිය නියමිත කාල වකවානුව තුළ ජාත්‍යන්තර කම්කරු සංවිධානය වෙත ඉදිරිපත් කිරීම

- ශ්‍රී ලංකාව කම්කරු ක්ෂේත්‍රය සම්බන්ධව ලබා ඇති ප්‍රගතිය මත පදනම්ව ජාත්‍යන්තර ප්‍රජාව දැනුවත් කිරීමට කටයුතු කිරීම

- කම්කරු ක්ෂේත්‍රය සම්බන්ධව පවතින ගැටළු විසඳීම සඳහා ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ මූල්‍ය හා තාක්ෂණික සහයෝගය ලබා ගැනීමට කටයුතු කිරීම

- නව නීති ඇති කිරීම හා පවත්නා නීති කාලානුරූපව සංශෝධනය කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සහ සහාය ලබාදීම

- විදේශ කටයුතු අමාත්‍යාංශය, එක්සත් ජාතීන්ගේ සංවිධානය සහ අනෙකුත් සංවිධාන මඟින් වරින්වර ඉල්ලීම් කරනු ලබන විගමනික ක්ෂේත්‍රය හා සම්බන්ධ ගැටළු, යෝජනා සහ අනෙකුත් වාර්තා ලබා දීම

- විදේශ රැකියා ක්ෂේත්‍රයට අදාළ නව අවබෝධතා ගිවිසුම් / එකඟතාවලට

එළඹීම, ගිවිසුම් යාවත්කාලීන කිරීම, ගිවිසුම්වල ක්‍රියාකාරීත්වය පිළිබඳව පසු විපරම් කිරීම

- ඒකාබද්ධ කමිටු රැස්වීම්වලට අදාළ කටයුතු සහ කලාපීය / ගෝලීය සංවාද හා සම්බන්ධ සියලු කටයුතු
- ක්ෂේත්‍රයට අනුයුක්ත සංවර්ධන නිලධාරීන්ගේ (විදේශ රැකියා) විෂයානුබද්ධ පුහුණුව සහ පුහුණුකරුවන් පුහුණු කිරීමේ සංචිතය පවත්වාගෙන යාම
- සංවර්ධන නිලධාරීන් හරහා දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් විදේශ රැකියා ක්ෂේත්‍රයට අදාළ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- විගමනික ශ්‍රමික කාන්තාවන් හා සම්බන්ධ පවුල් පසුබිම් වාර්තා පිළිබඳව අභියාචනා කමිටු පැවැත්වීම, කමිටු තීරණ දන්වා යැවීම හා පසුවිපරම් කිරීම
- අමාත්‍යාංශය හා ඒ යටතේ වූ ආයතනවල නිලධාරීන් සඳහා විදේශ පුහුණුව ලබාදීමට ක්‍රියා කිරීම

### III. සැලසුම් හා අධීක්ෂණ අංශය

අමාත්‍යාංශය හා ඒ යටතේ වන සියලුම ආයතනවල සංවර්ධන වැඩසටහන් නිවැරදි ඉලක්ක ඔස්සේ ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය සැලසුම් සකස් කිරීම, ඒවා ක්‍රියාත්මක කරවීම, ප්‍රගති සමාලෝචනය හා පසු විපරම් කිරීම ප්‍රධාන කාර්යභාරය වන අතර පහත සඳහන් කාර්යයන් ද ඉටුකරනු ලබයි.

- අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති ආයතන විසින් සිදු කරනු ලබන සංවර්ධන ඉලක්කයන් ඇතුලත් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කර අදාළ පාර්ශව වෙත යොමු කිරීම. ශුන්‍ය පාදක අයවැය සංවර්ධන වැඩසටහන යටතේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ සෑම මසකම ප්‍රගතිය ඇගයීම මඟින් ඉලක්ක වෙත ළඟාවීම අධීක්ෂණය හා දිරිගැන්වීම
- ජාතික අයවැය චක්‍රලේඛ අනුව ජනාධිපති ලේකම් කාර්යාලය, මුදල් අමාත්‍යාංශය, ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව හා ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධීකරණය පැවැත්වීම හා ප්‍රගති වාර්තා මාසිකව හා ත්‍රෛමාසිකව ඉදිරිපත් කිරීම
- දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අනුයුක්ත කර ඇති සංවර්ධන නිලධාරීන් මඟින් විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ද සහාය සහිත ව දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ක්‍රියාත්මක කරනු ලබන විදේශ රැකියා ක්ෂේත්‍රයට අදාළ වැඩසටහන් සැලසුම්කරණය, අධීක්ෂණය සහ වාර්තාකරණය
- වාර්ෂිකව කම්කරු ක්ෂේත්‍රයේ විවිධ කාලෝචිත තේමාවන් පාදක කර ගනිමින් පර්යේෂණාත්මක ලිපි අඩංගු ජර්නලයක් ප්‍රකාශයට පත් කිරීම
- ශ්‍රී ලංකා සේවක සඟරාව ප්‍රකාශයට පත් කිරීම
- කම්කරු ක්ෂේත්‍රයට අදාළ ගැටලුවලට විසඳුම් ලබාදීම සඳහා වැඩකරන ජනතාව පදිංචි ප්‍රදේශ තුළදීම ජංගම සේවා වැඩසටහන් සංවිධානය කිරීම
- අමාත්‍යාංශය විසින් අත්කරගත් ප්‍රගතිය ඇතුලත් වාර්ෂික කාර්යසාධන වාර්තාව සහ අයවැය කාරක සභා විවාදය සඳහා ප්‍රගති වාර්තාව සකස් කිරීම

### IV. මූල්‍ය අංශය

වාර්ෂික අයවැය මඟින් අමාත්‍යාංශයට වෙන් කරන ලද මූල්‍ය ප්‍රතිපාදන රජයේ ප්‍රතිපත්තිවලට අනුකූලව අදාළ අරමුණු ඉටුකර ගැනීම සඳහා කාර්යක්ෂමව හා ඵලදායී ලෙස භාවිත කිරීමට අවශ්‍ය කටයුතු කිරීම ගිණුම් අංශයේ ප්‍රධාන වගකීම වේ.

- 01/2020 රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛයට අනුව වාර්ෂික සමීක්ෂණ මණ්ඩලය පැවැත්වීම

- මූල්‍ය අධිකාරියේ නියෝජිතායතනය සම්බන්ධ වාර්තා සකස් කිරීම සහ මූල්‍ය බලතල පැවරීමේ කටයුතු සිදු කිරීම

- වාර්ෂික අයවැය ඇස්තමේන්තු සකස් කිරීම

- වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනය සකස් කිරීම

- රජයේ ගිණුම් පිළිබඳ කාරකසභා වාර්තාව සකස් කිරීම, මහා භාණ්ඩාගාරයට හා අදාළ අනෙකුත් ආයතනවලට මාසිකව හා කාර්තුමය වශයෙන් මූල්‍ය වාර්තා ඉදිරිපත් කිරීම

- විගණන විමසුම් ලේඛන යාවත්කාලීන කර පවත්වා ගෙන යාම හා අදාළ විගණන විමසුම් සඳහා පිළිතුරු විගණකාධිපති වෙත යොමු කිරීම

### V. අභ්‍යන්තර විගණන අංශය

ජාතික විගණන පනතේ 38 (ආ) සහ (ඊ) හි දක්වා ඇති පරිදි ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම ඉටු වන බවට සහතික කිරීම සඳහා එම පනතේ 40 වන වගන්තිය ප්‍රකාරව සිදුකර ඇති පත් කිරීම් හා මු.රෙ. 133 හා 134 ප්‍රකාරව අභ්‍යන්තර විගණන අංශයට ලැබී ඇති බලතල හා කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ අංක 01/2019 හා 2019/01/12 දිනැති චක්‍රලේඛයේ නියමයන් පරිදි අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන කටයුතු සිදු වේ.

අමාත්‍යාංශය හා ඒ යටතේ පවතින දෙපාර්තමේන්තු සහ ආයතනයන්හි මූල්‍ය කළමනාකරණය, අභ්‍යන්තර පාලනය සහ එම ආයතනයන්හි ඵලදායීතාවය යන කරුණු සම්බන්ධයෙන් පවතින දුර්වලතාවයන්, අඩුපාඩු වලක්වා ගැනීම හා අරමුණු ළඟා කර ගැනීම සඳහා ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසි, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සහ රජය විසින් නිකුත් කරන චක්‍රලේඛවලට අනුගතවීම සම්බන්ධ මඟ පෙන්වීම.

රාජ්‍ය ප්‍රතිපත්ති, තිරසාර සංවර්ධන අභිමතාර්ථයන් වෙත ළඟා වීම සඳහා අමාත්‍යාංශය යටතේ පවතින ආයතනයන්හි ගැටලු අවම කර අභ්‍යන්තර පාලනය ශක්තිමත් කිරීමට දායකවීම හා විධිමත් අවංක සේවයක් සාක්ෂාත් කර ගැනීම උදෙසා විගණන කළමනාකරණ කමිටු රැස්වීම් (කාර්තුමය වශයෙන්) පැවැත්වීම, වාර්ෂික විගණන සැලසුම් සැකසීම, අභ්‍යන්තර විගණන පරීක්ෂණ හා විශේෂ පරීක්ෂණයන් පිළිබඳ වාර්තා සහ ක්ෂේත්‍ර පරීක්ෂණ සිදුකිරීම.


## 1.6 අමාත්‍යාංශය යටතේ පවතින ආයතන

### 1.6.1 කම්කරු දෙපාර්තමේන්තුව

යටත් විජිත සමයේ බ්‍රිතාන්‍ය පාලකයන් විසින් ව්‍යාපාරික වතු වගාව යටතේ කෝපි හා තේ වගාව සඳහා ශ්‍රී ලංකාවට ගෙන්වන ලද ඉන්දීය කම්කරුවන්ට සුබසාධනය සැපයීමේ අරමුණින් 1923 අංක 01 දරණ ඉන්දියානු ආගාමික කම්කරු ආඥා පනත හඳුන්වා දෙන ලදී. එම ආඥා පනත යටතේ පිහිටුවන ලද ඉන්දියානු ආගාමික කම්කරු පාලකවරයාගේ දෙපාර්තමේන්තුව කම්කරු දෙපාර්තමේන්තුවේ මූලාරම්භය වේ. වර්තමානයේදී කම්කරු දෙපාර්තමේන්තුව විසින් සේව්‍ය, සේවක හා රජය යන ත්‍රෛපාර්ශවීය සම්බන්ධතාවය ශක්තිමත්ව පවත්වා ගැනීම තුළින් ජාතික ආර්ථිකය ශක්තිමත් කිරීමේ කාර්යභාරය ඉටු කරයි.

ශ්‍රී ලංකාවේ පෞද්ගලික අංශයේ සහ අර්ධ රාජ්‍ය අංශයේ සේවක ප්‍රජාවගේ වෘත්තීය හිමිකම් තහවුරු කිරීම, සමාජ ආරක්ෂණය ඇති කිරීම හා සේව්‍ය - සේවක සබඳතාවයන් වර්ධනය කිරීම වෙනුවෙන් ක්‍රියාත්මක වන ප්‍රමුඛ රාජ්‍ය ආයතනය කම්කරු දෙපාර්තමේන්තුව වේ. කම්කරු දෙපාර්තමේන්තුව විසින් කම්කරු විෂයට අදාළ අණපනත් ක්‍රියාත්මක කිරීම හා අවශ්‍ය ප්‍රවර්ධනය කිරීම් සිදු කිරීම සඳහා දීප ව්‍යාප්තව කම්කරු කාර්යාල පවත්වා ගනිමින් තමන් වෙත පැවරී ඇති වගකීම ඉටු කරනු ලබයි.

### කම්කරු දෙපාර්තමේන්තුවේ ව්‍යුහය




**රූපසටහන 1.2** කම්කරු දෙපාර්තමේන්තුවේ ව්‍යුහය

## ප්‍රධාන කාර්යයන්

I. කම්කරු නීතීන් ක්‍රියාත්මක කිරීම හා සමාජ කතිකාවත ප්‍රවර්ධනය මඟින් කාර්මික ආරවුල් ඇතිවීම වැළැක්වීම හා ඇති වූ ආරවුල් නිරවුල් කිරීම

II. එලදායීව කාලීන පරීක්ෂණ සිදු කිරීම සහ ඒ සඳහා දෙපාර්තමේන්තු නිලධරයන්ට ඇවැසි දැනුම නිරන්තරව යාවත්කාලීන කිරීම මඟින් සේවකයන්ගේ ව්‍යවස්ථාපිත හිමිකම් තහවුරු කිරීම

III. සේව්‍ය, සේවක දෙපාර්ශවය තුළ කම්කරු නීති පිළිබදව පවතින දැනුම හා අවබෝධය පුළුල් කිරීම තුලින් කාර්මික සාමය තහවුරු කිරීම

IV. ජාතික ආර්ථික ව්‍යුහයේ වෙනස්කම් අනුව උචිත වන්නා වූ ශ්‍රම ප්‍රමිතීන්, අන්තර්ජාතික ප්‍රමිතීන් අනුව යමින් සැකසීම හා ක්‍රියාවට නැංවීම

V. සේවක අර්ථසාධක අරමුදල මනා ලෙස පරිපාලනය කිරීම තුළින් හිමිකරුවන්ට ප්‍රතිලාභ නියමිත පරිදි ලබා දීම තහවුරු කිරීම සහ එපරිදිම අනුමත පෞද්ගලික අර්ථසාධක අරමුදල් හා විශ්‍රාම දීමනා ක්‍රම පිළිබඳ පරිපාලනය

VI. කාන්තාවන්, තරුණ අය හා ළමුන් පිළිබඳ කම්කරු නීති ඇතුලු සියලු කම්කරු නීති සාධනීය ලෙස ක්‍රියාවට නැංවීම සහ ළමා ශ්‍රමය හා අනතුරුදායක ළමා ශ්‍රමය තුරන් කිරීමට කටයුතු කිරීම

VII. වැඩ බිම තුළ සෞඛ්‍ය ආරක්ෂිත බව හා අනතුරු රහිත බව පිළිබඳව සේවකයන් දැනුවත් කිරීම, සෞඛ්‍යාරක්ෂිත බව තහවුරු කිරීම හා අනතුරු රහිත බව තහවුරු කිරීම


VIII. ඉහත කාර්යයන් සඳහා තීරණ ගැනීමට අවශ්‍ය සංඛ්‍යාලේඛන දත්ත රැස් කිරීම හා විශ්ලේෂණය

IX. ශ්‍රී ලංකාව විසින් අපරානුමත කර ඇති ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ සම්මුතීන් නීතියෙන් හා භාවිතයෙන් බලාත්මක කිරීමට කටයුතු කිරීම

### 1.6.2 ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය, ශ්‍රී ලාංකික විගමනික ශ්‍රමිකයින් කේන්ද්‍ර කර ගනිමින් 1994 අංක 4 සහ 2009 අංක 56 දරණ පනත් මඟින් සංශෝධිතව 1985 අංක 21 දරණ පාර්ලිමේන්තු පනත යටතේ පිහිටුවන ලද ප්‍රමුඛතම ව්‍යවස්ථාපිත ආයතනයයි. විදේශ රැකියා ක්ෂේත්‍රය පාලනය කිරීම සහ නියාමනය කිරීම, ශ්‍රී ලංකාවෙන් පිටත රැකියාවේ නියුක්ත ශ්‍රී ලාංකික ශ්‍රමිකයින්ගේ සහ ඔවුන්ගේ පවුලේ සාමාජිකයින්ගේ ආරක්ෂාව සහ සුභසාධනය මෙන්ම ශ්‍රී ලාංකිකයින් සඳහා ශ්‍රී ලංකාවෙන් පිටත රැකියා අවස්ථා ප්‍රවර්ධනය හා සංවර්ධනය කිරීම පිළිබඳ කාර්යාංශය වගකීම දරනු ලබයි. ස්ථිර සේවකයින් 1,158 දෙනෙකුගෙන් යුත් ශ්‍රම බලකායකින් යුතුව මෙම ආයතනය ශ්‍රී ලංකාවේ විදේශ රැකියා ක්ෂේත්‍රය ශක්තිමත් කිරීම සහ ශ්‍රී ලංකාවේ ජාතික ආර්ථිකයේ දියුණුවට දායක වීම සඳහා අඛණ්ඩව කටයුතු කරනු ලබයි.

**ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ව්‍යුහය**




**රූපසටහන 1.3** ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ව්‍යුහය

## ප්‍රධාන කාර්යයන්

I. විදේශ රැකියා නියෝජිත ආයතන පවත්වාගෙන යාම සඳහා බලපත්‍ර නිකුත් කිරීම

II. විදේශ රැකියා අපේක්ෂකයින් සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම

III. විදේශ රැකියා සඳහා පිටත්ව යන ශ්‍රී ලාංකිකයන් කාර්යාංශයේ ලියාපදිංචි කිරීම / විදේශ රැකියා සඳහා ශ්‍රී ලාංකිකයන් බඳවා ගැනීම

IV. විගමනික ශ්‍රමිකයන් විසින් හෝ ඔවුන්ගේ පවුලේ සාමාජිකයින් විසින් යොමු කරනු ලබන පැමිණිලි විසඳීම

V. විගමනික ශ්‍රමිකයන් හා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන් සඳහා සුභසාධන පහසුකම් සැලසීම

VI. විදේශ රැකියා ක්ෂේත්‍රයට අදාළ නීති බලාත්මක කිරීම

VII. ශ්‍රී ලාංකිකයන් සඳහා විදේශ රැකියා අවස්ථා ප්‍රවර්ධනය කිරීම

### 1.6.3 මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව

ශ්‍රී ලංකාව තුළ මානව සම්පත සංවර්ධනය කරමින් තරුණ ප්‍රජාව අතර විරැකියාව තුරන් කර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීම, ශ්‍රම බලකායේ ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම, වෘත්තීය මාර්ගෝපදේශනය හා රැකියා උත්පාදනය තුළින් ජාතික ආර්ථිකයට තරුණ ප්‍රජාවේ දායකත්වය ලබා ගැනීම යන අරමුණු සපුරා ගැනීම සඳහා 2010.02.12 දිනැති අංක 1640/34 දරණ අති විශේෂ ගැසට් පත්‍රය මඟින් 2010.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව ස්ථාපනය කරන ලදී.

#### ප්‍රධාන කාර්යයන්

I. වෘත්තීය මාර්ගෝපදේශන කටයුතු

II. ශ්‍රම වෙළඳපොළ තොරතුරු එක් රැස් කිරීම, විශ්ලේෂණය හා බෙදා හැරීම

III. මහජන රැකියා සේවා කටයුතු

IV. ජාත්‍යන්තර සම්බන්ධතා

V. මානව සම්පත් සංවර්ධනයට අදාළ කටයුතු

### 1.6.4 ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය

ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය 2007 සැප්තැම්බර් 11 වන දින ස්ථාපිත කර 2010 අංක 12 දරණ ජාතික ශ්‍රම අධ්‍යයන ආයතන පනත මඟින් බලාත්මක කරන ලදී. මෙම ආයතනය ත්‍රෛපාර්ශවීය හවුල්කරුවන් වන සේව්‍ය, සේවක හා රජයේ නිලධාරීන්ගෙන් සැදුම්ලත් පාලක මණ්ඩලයක් මඟින් පාලනය වේ. කම්කරු අණපනත් නීති රීති රෙගුලාසි පිළිබඳව දැනුවත් වූ ඵලදායී ශක්තිමත් ශ්‍රම බලකායක් නිර්මාණය කිරීම සඳහා අවශ්‍ය පුහුණු හා අධ්‍යාපන කටයුතු සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම මෙම ආයතනය මඟින් සිදු කරනු ලබයි.

ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය සිය අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා කම්කරු නීතිය හා කාර්මික සබඳතා, මානව සම්පත් කළමනාකරණය සහ වැඩබිම් ඵලදායිතාව යන ප්‍රධාන විෂය ක්ෂේත්‍රයන් තුන ඔස්සේ පාඨමාලා පවත්වනු ලබයි. මෙම විෂය ක්ෂේත්‍රයන් අභ්‍යන්තර අංශ තුනක් මඟින් ක්‍රියාත්මක වන අතර පුහුණු සහ වැඩමුළු, කෙටිකාලීන පාඨමාලා, සහතිකපත් සහ ඩිප්ලෝමා පාඨමාලා වශයෙන් අංශ කිහිපයක් යටතේ ක්‍රියාත්මක වේ.

#### අරමුණු

I. දේශීය හා විදේශීය ආයතන සමඟ සහයෝගයෙන් ශ්‍රම අධ්‍යයන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සහ සංවර්ධන ක්‍රියාවලියට ක්‍රියාකාරී දායකයන් ලෙස සේවකයින්ගේ යහපැවැත්ම සහතික කිරීමට පියවර ගැනීම

II. ශ්‍රම අධ්‍යයනය පිළිබඳ සම්මන්ත්‍රණ, වැඩමුළු හා රැස්වීම් පැවැත්වීම සහ සඟරා, වාර සඟරා හා පොත් ප්‍රකාශයට පත් කිරීම

III. ශ්‍රම අධ්‍යාපනය සම්බන්ධ පර්යේෂණ, සමීක්ෂණ පැවැත්වීම සහ පාඨමාලා සංවිධානය කිරීම

IV. පුස්තකාල සහ තොරතුරු සේවා පිහිටුවීම සහ නඩත්තු කිරීම

V. සමාන අරමුණු සහිත දේශීය හා විදේශීය ආයතන, සංවිධාන, සංගම් සහ සමාජ සමඟ සමීප සබඳතාවයක් පවත්වා ගැනීම

VI. විශ්වවිද්‍යාල සහ ඒවාට අනුබද්ධ ආයතනවල සහාය ඇතිව ශ්‍රම අධ්‍යයනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලා ඇතුළු පාඨමාලා පැවැත්වීම සහ අවශ්‍ය විටෙක සහතික සහ ඩිප්ලෝමා ප්‍රදානය කිරීම

VII. කාර්මික සාමය පවත්වා ගැනීම අරමුණු කරගත් ක්‍රියාකාරකම්වල නිරත වීම

### 1.6.5 ජාතික වෘත්තීය සුරක්ෂිතතා සහ සෞඛ්‍ය ආයතනය

2009 අංක 38 දරණ ජාතික වෘත්තීය ආරක්ෂණ සහ සෞඛ්‍ය පිළිබඳ ආයතන පනත

මඟින් එවක පැවති කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශයේ අනුබද්ධ ආයතනයක් ලෙසින් ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය පිහිටුවන ලදී. මෙරට තුළ මනා සෞඛ්‍ය හා ආරක්ෂණ ක්‍රියාමාර්ග තුළින් වෘත්තීය අනතුරු හා වෘත්තීය රෝග වැළැක්වීම හා නිවැරදි ආරක්ෂිත ප්‍රතිපත්තියක් හා ක්‍රමවේදයන් පිළිපැදීම තුළින් යහපත් වැඩ පරිසර තත්ත්වයක් සෑම පුද්ගලයෙකුටම ලබාදීමට මෙම ආයතනය කටයුතු කරන අතර මෙවැනි පුහුණුවක් තුළින් ප්‍රතිලාභ ලබාගත හැකි සේවක, සේව්‍ය හා ඕනෑම පුද්ගලයකු සඳහා අවශ්‍ය අධ්‍යාපනය ද මෙම ආයතනය විසින් ලබාදෙනු ලබයි.

**ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය විසින් පවත්වනු ලබන පාඨමාලා**

I. වෘත්තීය සුරක්ෂිතතාව සහ සෞඛ්‍ය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව

II. වෘත්තීය සුරක්ෂිතතාව සහ සෞඛ්‍ය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව

III. වැවිලි අංශයේ වෘත්තීය සුරක්ෂිතතාව සහ සෞඛ්‍ය පිළිබඳ උසස් සහතිකය

IV. බොයිලේරු ක්‍රියාකරවන්නන් පුහුණු කිරීම

V. කාර්මාන්තයන් පිළිබඳ වැඩ අධ්‍යයන වැඩසටහන

VI. කර්මාන්ත ක්ෂේත්‍රයේ හෙදියන් පුහුණු කිරීම

VII. රෝහල් කාර්ය මණ්ඩලය සඳහා වෘත්තීය සුරක්ෂිතතාව සහ සෞඛ්‍යය

VIII. කාර්යාලයීය කාර්ය මණ්ඩලය සඳහා වෘත්තීය සුරක්ෂිතතාව සහ සෞඛ්‍යය

IX. පරීක්ෂණාගාරවල වෘත්තීය සුරක්ෂිතතාව සහ සෞඛ්‍යය

X. රසායනික ද්‍රව්‍ය ආරක්ෂා සහිතව පරිහරණය කිරීම

XI. ආහාර පරිහරණය කරන්නන් සඳහා සුරක්ෂිතතාව සහ සෞඛ්‍යය

XII. ආතති කළමණාකරන පුහුණු වැඩසටහන

### 1.6.6 කම්කරු වන්දි කොමසාරිස් කාර්යාලය

සේවයේ යෙදී සිටින අවස්ථාවේ දී සිදුවන අනතුරු සම්බන්ධයෙන් වන්දි ලබාදීම සඳහා 1934 අංක 19 දරණ කම්කරු වන්දි ආඥා පනත පනවා ඇත. මෙම පනතට යම් යම් අවස්ථාවන්හිදී සංශෝධන කිහිපයක් ඇතුළත් වූ අතර, අවසාන සංශෝධනය 2022 අංක 10 පනතින් සිදුකර ඇත. කම්කරු වන්දි උසාවිය දිසා විනිසුරු හා මහේස්ත්‍රාත් බලතල සහිතව මුළු දිවයිනම ආවරණය වන පරිදි සංචාරක උසාවි 14කින් ද සමන්විත වේ. අධිකරණ සේවා කොමිෂන් සභාව මඟින් පත්කරනු ලබන අධිකරණ නිලධාරීන් වන කම්කරු වන්දි කොමසාරිස්, අතිරේක කම්කරු වන්දි කොමසාරිස් හා නියෝජ්‍ය කම්කරු වන්දි කොමසාරිස් යන තනතුරු 3කින් ද ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ I වන පන්තියේ තනතුරක්ද ශ්‍රී ලංකා පරිපාලන සේවයේ තනතුරක් ද ඇතුළු තනතුරු 43කින් සමන්විත වේ.

රැකියාවේ යෙදී සිටියදී සිදුවන අනතුරුවලින් තුවාල ලබන සේවකයින්ට රැකියාවේ ස්වභාවය නිසා වැළඳුණු රෝගවලින් පීඩා විඳින සේවකයින්ට සේවයේ යෙදී සිටින විට සිදුවන අනතුරුවලින් මියයන සේවකයින්ගේ යැපෙන්නන්ට වන්දි අයකර දීම ප්‍රධාන අරමුණ වේ. කම්කරු වන්දි අධිකරණ ක්‍රියාවලිය සඳහා අපරාධ නඩු විධාන සංග්‍රහය, සිවිල් නඩු විධාන සංග්‍රහය සහ සාක්ෂි ආඥා පනත අදාළ කර ගන්නා අතර අභියාචන පටිපාටිය දිසා අධිකරණයකට සමාන වේ.

**ප්‍රධාන කාර්යභාරයන්**

I. රජයේ සහ පෞද්ගලික අංශයේ සේවකයන්ට සේවයේ යෙදී සිටියදී සිදුවන අනතුරු, වෘත්තීය රෝගාබාධ සහ මරණයකදී නම් යැපෙන්නන්ට වන්දි අයකර දීමේ කටයුතු (2022 අංක 10 දරණ අවසන් සංශෝධනයට අනුව ලබාදිය හැකි උපරිම වන්දි මුදල රු. 2,000,000/=කි)

II. බාල වයස්කරුවන් වයස් පූර්ණත්වයට පත්වන තුරු කම්කරු වන්දි කොමසාරිස් භාරයේ ජාතික ඉතිරි කිරීම් බැංකුවේ ගිණුම් පවත්වාගෙනයාම හා ඒවායේ පරිපාලන කටයුතු

III. සේවකයන්ට සිදුවන අනතුරකදී සේවායෝජකයන් වන්දි ගෙවීම පැහැර හැරි අවස්ථාවල ඔවුන්ගේ නිශ්චල හා චංචල දේපල තහනමට ගෙන ඒවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා වන්දි මුදල් අයකර දීම

IV. කම්කරු වන්දි රක්ෂණ බලපත්‍ර නිකුත් කිරීම, අළුත් කිරීම, බලපත්‍ර අවලංගු කිරීමේ කටයුතු

V. සේවකයකුට අනතුරක් සිදුවූ විට එම ස්ථානයට ගොස් පරීක්ෂා කර බැලීම

VI. ලංකාවේ ලියාපදිංචි කර ඇති නැව්වල සහ ගුවන් නැව්වල සේවකයන්ට ලංකාවෙන් පිටත දී සිදුවන අනතුරු සඳහා වන්දි අයකර දීම

### 1.6.7 ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය

ශ්‍රී ලංකාව 1966 වසරේදී ආසියානු ඵලදායිතා සංවිධානයේ සාමාජිකත්වය ලබාගැනීමෙන් අනතුරුව ජාතික ඵලදායිතා සංවිධානය (NPO) ස්ථාපිත වූ අතර, මෙම කාර්යය වඩාත් පුළුල් කිරීම සඳහා 1994 වසරේදී ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය ස්ථාපිත කරන ලදී. මෙමඟින් විවිධ ආයතන වෙත ඵලදායිතා සංකල්ප, මෙවලම් හා තාක්ෂණය හඳුන්වා දෙන ලදී. රාජ්‍ය, අධ්‍යාපන, සේවා හා නිෂ්පාදන, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය හා ප්‍රජා යන අංශ, ඵලදායිතා සංකල්ප තුලින් පෝෂණය කිරීම සඳහා වාර්ෂිකව විවිධ වැඩසටහන් දිවයින පුරා ක්‍රියාත්මක වන අතර, ආසියානු ඵලදායිතා සංවිධානයේ (APO) නිරන්තර සහයෝගිතාව තුලින් "දැනුම කේන්ද්‍රික සමාජයක්" බිහිකිරීමට අවශ්‍ය පරිසරය නිර්මාණය වී ඇත.

### ප්‍රධාන කාර්යයන්

I. රාජ්‍ය, අධ්‍යාපන, සේවා හා නිෂ්පාදන, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක සහ ප්‍රජා යන අංශ ඉලක්ක කර ගනිමින් ඵලදායිතා ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

II. ඵලදායිතා විෂයන්ට අදාළ පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

- ඵලදායිතා ඩිප්ලෝමා වැඩසටහන
- ඵලදායිතා සහතික පත්‍ර පාඨමාලා වැඩසටහන
- ඵලදායිතා කෙටිකාලීන පුහුණු පාඨමාලා වැඩසටහන
- පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන

III. ආයතනවල ඵලදායිතා ප්‍රවර්ධනය සම්බන්ධව උපදේශන සේවාවන් ලබාදීම

IV. ආසියානු ඵලදායිතා සංගමය හා එක්ව පහත පරිදි වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

- පුහුණු වැඩසටහන් හා වැඩමුළු පැවැත්වීම
- e learning වැඩසටහන් පැවැත්වීම
- තාක්ෂණික විශේෂඥ සේවාවන් ලබා ගැනීම තුලින් වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- ආදර්ශන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

V. "5S" සහතිකකරණ වැඩසටහන ක්‍රියාත්මක කිරීම

VI. මාධ්‍ය හා ප්‍රචාරණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

VII. ජාතික ඵලදායිතා සම්මාන තරගාවලිය හා සම්මාන ප්‍රදානෝත්සවය පැවැත්වීම

### 1.6.8 ශ්‍රම වාසනා අරමුදල

1998 අංක 12 දරණ (2019 අංක 15 දරණ සංශෝධිත) පනතින් ස්ථාපිත ශ්‍රම වාසනා අරමුදල කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය යටතේ පවතින කම්කරු සුභසාධනය උදෙසා ආරම්භ කරන ලද ආයතනයකි. ශ්‍රම වාසනා අරමුදල් පනතේ අරමුණු 6ක් ඔස්සේ ආරම්භයේ සිට මේ දක්වා විවිධ සුභසාධන වැඩසටහන් පවත්වා ශ්‍රී ලාංකීය සේවා නියුක්තිකයින්ගේ උන්නතියට කටයුතු සම්පාදනය කර ඇත.

ශ්‍රම වාසනා අරමුදලේ ප්‍රධාන ආදායම් මාර්ගය ජාතික ලොතරැයි මණ්ඩලය විසින් දිනුම් අදිනු ලබන ජාතික සම්පත ලොතරැයියෙන් ලැබෙන අදායමයි. ඊට අමතරව අරමුදල සතු ස්ථාවර තැන්පතුවලින් උපයන පොලි අදායම

ද ඇතුළුව අරමුදල විසින් වාර්ෂිකව සැලසුම් කරන ලද අරමුණුවලට අනුව කම්කරු සුභසාධනය උදෙසා මුළු දිවයිනම ආවරණය වන ආකාරයට විවිධ සුභසාධන වැඩසටහන් සිදුකරනු ලබයි.

**අරමුදලේ අරමුණු**

I. සේවා නියුක්තිකයන්ගේ හා ඔවුන්ගේ යැපෙන්නන්ගේ සුභ සාධනය ප්‍රවර්ධනය කිරීම

II. සේවා නියුක්තයන් සේවයෙහි යෙදී සිටි ආයතන පූර්ව දැනුම් දීමකින් තොරව වසා දැමූ අවස්ථාවක ඒ සේවා නියුක්තයන්ට මූල්‍ය හා වෙනත් ආධාර සැපයීම

III. හදිසි අවස්ථාවලදී සේවා නියුක්තයන්ට හා ඔවුන්ගේ යැපෙන්නන්ට වෛද්‍ය හා වෙනත් පහසුකම් සැපයීම

IV. සේවා නියුක්තයන්ට විරුද්ධව පරීක්ෂණ ආරම්භ කරනු ලැබූ විටකදී ඔවුන්ට තාවකාලික ආධාර සැපයීම

V. ව්‍යසන අවස්ථාවලදී සේවා නියුක්තයන්ට හෝ ඔවුන්ගෙන් යැපෙන්නන්ට මූල්‍යමය හා වෙනත් පහසුකම් සැපයීම

VI. සේවා නියුක්තිකයන්ගේ සුභසාධනය සඳහා විශිෂ්ඨ සේවයක් කර ඇති තැනැත්තන්ට ත්‍යාග පිරිනැමීම

VII. කම්කරු කොමසාරිස් ජනරාල්වරයා, කම්කරු විනිශ්චය සභාවක්, බේරුම්කරුවකු හෝ කම්කරු උසාවියක් හෝ යම් අධිකරණයක් ඉදිරියේ යම් ලිඛිත නීතියක විධිවිධාන යටතේ පවරා ඇති හෝ විභාග වෙමින් පවතින යම් සේවා නියුක්තිකයෙකුගේ සේවා නියුක්තිය අවසන් කිරීම හා සම්බන්ධ හෝ කාර්මික ආරවුලක් සම්බන්ධ නඩු කටයුතු සඳහා සේවා නියුක්තයන්ට නීතිමය සහාය ලබා ගැනීමට මූල්‍යමය සහන සැලසීම

### 1.6.9 ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සි පුද්ගලික සමාගම

ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සි පුද්ගලික සමාගම, රජයට අයත් එකම ක්‍රියාත්මක විදේශ රැකියා ඒජන්සි ආයතනය වන අතර විදේශ රැකියා ක්ෂේත්‍රයේ නියාමන ආයතනය වන ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයීය පරිපාලිත ආයතනයක් වශයෙන් විදේශ රැකියා අමාත්‍යාංශය යටතේ 1996 ඔක්තෝබර් මාසයේ සිට ස්ථාපිත ක්‍රියාත්මක ආයතනයකි. 2013 වසරේදී ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සි සමාගම ISO9001:2008 තත්ත්ව සහතිකයෙන් පිදුම් ලැබීය.

**ප්‍රධාන කාර්යයන්**

I. රැකියා ඇණවුම් සොයා ගැනීම හා මූලික අනුමැතිය ලබා ගැනීම

II. රැකියා ඇණවුම්වලට අදාළ ප්‍රචාරයන් සඳහා අනුමැතිය ලබා ගැනීම හා සුදුසු අයදුම්කරුවන් සොයා ගැනීම

III. සේවායෝජකයින්ගේ තෝරා ගැනීම සඳහා අයදුම්පත් යොමු කිරීම, රැකියා සඳහා සුදුසු අයදුම්කරුවන් තෝරාගැනීම උදෙසා සම්මුඛ පරීක්ෂණ හා තත්ත්ව පරීක්ෂණ පැවැත්වීම

IV. විදේශ රැකියා සඳහා යොමු කිරීමට අදාළ සියලු පරිපාලන කටයුතු හා පහසුකම් සැපයීම සිදු කොට ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයෙන් අවසන් අනුමැතිය ලබාගැනීම සහ පුද්ගලයින් රැකියා සඳහා විදේශ ගත කිරීම

## 1.7 අමාත්‍යාංශයේ කාර්ය මණ්ඩල සංයුතිය

| | ආයතනය | ජ්‍යෙෂ්ඨ මට්ටම | | තෘතීය මට්ටම | | ද්විතීය මට්ටම | | ප්‍රාථමික මට්ටම | | එකතුව | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | අනුමත සංඛ්‍යාව | සේවයේ නියුක්ත සංඛ්‍යාව | අනුමත සංඛ්‍යාව | සේවයේ නියුක්ත සංඛ්‍යාව | අනුමත සංඛ්‍යාව | සේවයේ නියුක්ත සංඛ්‍යාව | අනුමත සංඛ්‍යාව | සේවයේ නියුක්ත සංඛ්‍යාව | අනුමත සංඛ්‍යාව | සේවයේ නියුක්ත සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාවේ ප්‍රතිශතය |
| 1 | කම්කරු අංශය | 24 | 17 | 04 | - | 75 | 55 | 35 | 16 | 138 | 88 | 36% |
| 2 | කම්කරු දෙපාර්තමේන්තුව | 211 | 133 | 668 | 478 | 1753 | 1718 | 489 | 401 | 3121 | 2730 | 13% |
| 3 | මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව | 20 | 14 | 05 | 00 | 627 | 604 | 15 | 10 | 667 | 628 | 6% |
| 4 | ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය | 09 | 03 | 11 | 02 | 20 | 07 | 05 | 02 | 45 | 14 | 69% |
| 5 | ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය | 07 | 02 | 03 | 02 | 10 | 06 | 05 | 05 | 25 | 15 | 40% |
| 6 | කම්කරු වන්දි කොමසාරිස් කාර්යාලය | 05 | 03 | 02 | 01 | 31 | 30 | 05 | 02 | 43 | 36 | 16% |
| 7 | ජාතික එලදායිතා ලේකම් කාර්යාලය | 17 | 07 | 04 | 02 | 792 | 709 | 19 | 10 | 832 | 728 | 14% |
| 8 | ශ්‍රම වාසනා අරමුදල | 01 | 01 | 04 | 03 | 08 | 08 | 04 | 03 | 17 | 15 | 12% |
| 9 | විදේශ රැකියා අංශය | 14 | 11 | 01 | - | 1031 | 1003 | 23 | 15 | 1069 | 1029 | 4% |
| 10 | ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය | 137 | 103 | 197 | 170 | 692 | 655 | 251 | 232 | 1277 | 1160 | 9% |
| 11 | ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සි පුද්ගලික සමාගම | 04 | 04 | 09 | 07 | 10 | 05 | 07 | 08 | 30 | 24 | 20 |
| | **එකතුව** | **449** | **298** | **908** | **665** | **5049** | **4800** | **858** | **704** | **7264** | **6467** | **11%** |

**වගුව 1.1** අමාත්‍යාංශයේ කාර්ය මණ්ඩල සංයුතිය

# 02

## දෙවන පරිච්ඡේදය

ප්‍රගතිය හා ඉදිරි දැක්ම

# ප්‍රගතිය හා ඉදිරි දැක්ම

වැඩකරන ජනතාවගේ අයිතිවාසිකම් ආරක්ෂා කරදීම, ඔවුන්ගේ සේවා සුරක්ෂිතතාවය සලසා දීම හා රට තුළ කාර්මික සාමය ස්ථාපනය සහ විදේශීය රැකියා වෙළඳපළ වෙත නිපුණ ශ්‍රමිකයින් යොමු කිරීම යන ක්ෂේත්‍රයන් යටතේ ඇති කාර්යයන් ඉටු කිරීම සඳහා මෙම අමාත්‍යාංශය විසින් වැඩසටහන් රැසක් ක්‍රියාත්මක කරමින් පවතී.

මෙරට ශ්‍රම බලකාය මිලියන 8.5ක් වන අතර ඉන් මිලියන 8.1ක් සේවා නියුක්තව සිටී. එම පිරිසෙන් රජයේ සේවකයන්, තමන්ගේ ව්‍යාපාරයක නිරත වන්නන් හා පවුලේ ව්‍යාපාරවලට දායකත්වය දක්වන්නන් හැරුණු කොට පෞද්ගලික හා අර්ධ රාජ්‍ය අංශයේ සේවයේ නියුක්ත මිලියන 3.4ක සේවා නියුක්තිකයන්ගේ වෘත්තිය අයිතිවාසිකම්, වෘත්තීය ආරක්ෂාව හා සෞඛ්‍ය සහ සමාජ ආරක්ෂණය තහවුරු කිරීමේ යාන්ත්‍රණය ක්‍රියාත්මක කිරීමෙන් රට තුළ කාර්මික සාමය පවත්වා ගැනීම හා එතුලින් මෙරට සමාජ ආර්ථික සංවර්ධනයට දායක වීමේ වගකීම මෙම අමාත්‍යංශය සතුවේ.

එමෙන්ම, රැකියා සඳහා සංක්‍රමණය වීමෙන් ප්‍රතිලාභ ලබන ලෝකයේ බොහෝ රටවල් අතරින් ශ්‍රී ලංකාවද ප්‍රධාන ස්ථානයක සිටී. මෙරට සමස්ත විදේශ විනිමය ඉපයීම්වලින්, විදේශ රැකියාවලින් ලැබෙන ප්‍රේෂණ වැඩි දායකත්වයක් දක්වයි. 2022 වර්ෂයේදී ශ්‍රී ලංකා රුපියල් බිලියන 1,252.5ක විදේශ ප්‍රේෂණ ප්‍රමාණයක් මෙරටට ලැබී ඇති අතර පුද්ගලයින් 311,161 දෙනෙකුගෙන් පිරිමින් 186,981ක් සහ කාන්තාවන් 124,180ක් විදේශ රැකියා සඳහා පිටත්වීමට ලියාපදිංචි වී ඇත. මෙම තත්ත්වය තුළ ශ්‍රී ලංකා ආර්ථිකයට සංක්‍රමණික ශ්‍රමිකයන්ගේ දායකත්වය පිළි ගනිමින් විගමනික ශ්‍රමික ප්‍රේෂණ උපරිම තත්ත්වයකට ගෙන ඒමටත් නුපුහුණු ශ්‍රමිකයන් වෙනුවට පුහුණු ශ්‍රමිකයින් විදේශගත කිරීමටත් රජය ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා යාන්ත්‍රණ සහ වැඩසටහන් රැසක් ආරම්භ කර ඇත.

අමාත්‍යාංශය සහ අනුබද්ධ ආයතන විසින් ස්වකීය අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ඉටු කළ ක්‍රියාකාරකම්හි 2022 වර්ෂයේ ලබා ඇති ප්‍රගතිය පිළිබඳ සාරාංශයක් මෙම පරිච්ඡේදයේ අඩංගු වේ.

## 2.1 විශේෂ ජයග්‍රහණ, අභියෝග හා ඉදිරි දැක්ම

ශ්‍රී ලංකාව තුළ ආයෝජන හිතකාමී පරිසරයක් ඇති කිරීම උදෙසා මෙන්ම රටෙහි අනාගත අභිවෘද්ධිය අත්පත් කර ගැනීමට හැකි වන පරිදි පිළිගත් ජාතික හා ජාත්‍යන්තර සමාජ ආර්ථික තත්ත්වයන්ට සහ කම්කරු ප්‍රඥප්ති හා ප්‍රමිතීන්ට අනුකූල වන අයුරින් නෛතික ප්‍රතිපාදන සම්පාදනය කර දීම අමාත්‍යාංශය සතු කාලීන වගකීමකි. එහි දී පවත්නා අණ පනත්, නීති රීති වර්තමාන හා අනාගත වැඩ ලෝකයට ගැලපෙන අයුරින් සංශෝධනය කිරීම මෙන්ම වැඩ කරන ජනතාවගේ අයිතිවාසිකම් සුරක්ෂිත කිරීමට ද මෙම අමාත්‍යාංශය බැඳී සිටියි.

එමෙන්ම, විදේශ රැකියා විෂය ක්ෂේත්‍රයට අදාළ ප්‍රතිපත්ති හා වැඩසටහන් සම්පාදනය කිරීම තුළින් විදේශ රැකියා අවස්ථා බහුල කර මෙරටට විදේශ විනිමය ගලා ඒම් වර්ධනය තුළින් ජාතික ආර්ථිකය ශක්තිමත් කිරීමේ වගකීම ද මෙම අමාත්‍යාංශයට ඇත. ඒ සඳහා පුහුණු ශ්‍රමිකයින් විදේශ රැකියා සඳහා යොමු

කිරීමටත් ඔවුන් සඳහා පුහුණුවීමේ අවස්ථා සුලබ කිරීමටත් විධිමත් පරිදි ආරක්ෂාකාරී ලෙස විදේශ ගතවීම් සඳහා අවශ්‍ය මඟ පෙන්වීම, පහසුකම් සැලසීම ද සිදු කරනු ලබයි. එමෙන්ම, සංක්‍රමණික සේවකයන් හා ඔවුන්ගේ පවුල්වල යහපැවැත්ම, ආරක්ෂාව සහ සුබසාධනය ඉහළ නැංවීම වෙනුවෙන් කටයුතු කිරීමේ වගකීම ද මෙම අමාත්‍යාංශය සතු වේ.

රට තුළ පවත්නා ආර්ථික අර්බුදකාරී අවස්ථාවේ දී වුවද කාර්මික සාමය පවත්වාගෙන යමින් කම්කරු ජනතාව වෙනුවෙන් විශේෂ ජයග්‍රහණ රැසක් අත්පත් කර දීමට සහ විදේශ රැකියා අවස්ථා සුලබ කිරීම තුළින් මෙරට විදේශ ප්‍රේෂණ ඉහළ නැංවීමට දායකවීමට අමාත්‍යාංශයට හැකි විය. එසේ අත්පත් කරගත් ජයග්‍රහණ හා ඉදිරි ඉලක්ක පහතින් සංක්ෂිප්තව දක්වා ඇත.

### 2.1.1 සේවකයින්ගේ වෘත්තීය අයිතිවාසිකම් සුරක්ෂිත කිරීමේ අරමුණින් කම්කරු නීති වඩාත් ශක්තිමත් කිරීම

කම්කරු දෙපාර්තමේන්තුව ආරම්භ කරන ලද 1923 කාලයේ සිට පනවන ලද ආඥා පනත් හා පසුකාලීනව පනවන ලද පනත් 50ක් පමණ ශ්‍රී ලංකාව තුළ කම්කරු සුභසාධනය, හා අයිතිවාසිකම් ආරක්ෂා කිරීම උදෙසා වර්තමානයේ දී ක්‍රියාත්මක වෙමින් පවතී. ශ්‍රී ලාංකීය ශ්‍රම බලකාය මුහුණ දෙන වර්තමාන හා අනාගත කාලීන අභියෝග ජයගැනීම සඳහා සුදුසු වන ආකාරයට පවත්නා කම්කරු නීති සංශෝධනය කිරීමට සහ අළුතින් නීති සකස් කිරීමට අමාත්‍යාංශය විසින් පියවරයන් ගෙන තිබේ. වර්තමාන කම්කරු නීතියෙහි පවත්නා සංකීර්ණතා සහ ප්‍රායෝගික භාවිතයේ දී මතුවන ගැටළු හඳුනාගෙන සේව්‍ය - සේවක හා රාජ්‍ය යන ත්‍රෛපාර්ශවය වෙතම නීතියේ ආවරණය සැලසෙන පරිදි කම්කරු නීති සංශෝධනය හා නව නීති පැනවීම කෙරෙහි අමාත්‍යාංශයේ අවධානය යොමු වී ඇත.

**1. සේවයේ යෙදී සිටියදී සිදුවන හදිසි අනතුරකදී කම්කරු වන්දි ආඥා පනත යටතේ ලබාදෙන උපරිම වන්දි මුදල රු. 550,000/- සිට රු. 2,000,000/- දක්වා ඉහළ නැංවීම**

1934 අංක 19 දරණ කම්කරු වන්දි ආඥා පනතට අවසන් වරට 2005 වසරේදී ගෙන එන ලද සංශෝධනය අනුව සේවයේ යෙදී සිටිය දී සිදුවන හදිසි අනතුරක දී, වෘත්තීය රෝගයක දී සේවකයෙකු වෙත අයකර දිය හැකි උපරිම වන්දි සීමාව රු. 550,000/- ලෙස පැවතිනි. මෙම උපරිම වන්දි සීමාව රු. මිලියන දෙක (රු. 2,000,000/-) දක්වා වැඩිකිරීමට සහ ඊට සමානුපාතික ලෙස අනෙක් වන්දි සීමාවන්ද වැඩි කිරීමට 2022 අංක 10 දරණ පනත මඟින් පාර්ලිමේන්තු අනුමැතිය හිමි විය. මෙම සංශෝධන මඟින් මෙතෙක් රාජ්‍ය සේවකයන්ට පමණක් හිමිව තිබූ අයිතිවාසිකමක් වන සේවා ස්ථානයට යන අතර සහ සේවය නිම කොට ආපසු එන අතර සිදුවන අනතුරුවලට ද සේවායෝජකයා විසින් වන්දි ගෙවීමට හැකි වන පරිදි ප්‍රතිපාදන එක් කොට ඇත.

**2. කම්කරු නඩු විමසීම සඳහා කම්කරු විනිශ්චය සභාව හා මහේස්ත්‍රාත් අධිකරණය වෙත සමගාමී අධිකරණ බලයක් ලබා දීම**

වර්තමානයේ දී සියලුම කම්කරු නීති හා සේවක අර්ථසාධක ප්‍රතිපාදන උල්ලංඝනය වූ විට සහන ලබා ගැනීමට මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පැවරිය යුතු වේ. මෙහිදී ඇතිවන ප්‍රමාදයන් නිසා සේවකයන්ට හිමි පාරිතෝෂික, සේවක අර්ථසාධක හා හිඟ වැටුප් වැනි ව්‍යවස්ථාපිත හිමිකම් අයකර දීම සඳහා වසර 5 - 6ක දීර්ඝ කාලයක් බලා සිටීමට සිදු විය. මෙයට විසඳුමක් ලෙස කාර්මික ආරවුල් විසඳීම සඳහා පමණක් බලාත්මක වන පරිදි අතිරේක මහේස්ත්‍රාත් බලතල කම්කරු විනිශ්චය සභා සභාපතිවරුන් වෙත පැවරීමට 2022 අංක 19 දරණ කාර්මික ආරවුල් (විශේෂ විධිවිධාන) පනත පාර්ලිමේන්තුවේ සම්මත විය.

**3. කම්කරු විනිශ්චය සභා ඉදිරියේ නීතිඥයන් නොවන සේවක නියෝජිතයන්ට පෙනී සිටීමට සහ කම්කරු විනිශ්චය සභා නියෝග බලාත්මක කිරීමේ බලය කම්කරු විනිශ්චය සභා සභාපතිවරුන් වෙත ලබා දීම**

හාම්පුතුන් විසින් අසාධාරණ ලෙස සේවයෙන් ඉවත් කිරීම් සම්බන්ධව සේවකයන් විසින් පවරා ඇති නඩුවලදී සේවකයින් වෙනුවෙන් වර්තමානයේ දී පෙනී සිටිනු ලබන්නේ නීතිඥයින් සහ වෘත්තීය සමිති නියෝජිතයින් පමණි. මේ සඳහා නීතිඥයින් නොවන නියෝජිතයින්ට සේවකයින් වෙනුවෙන් පෙනී සිටීමට බලය ලබා දීමට අවශ්‍ය කටයුතු සිදු කර ඇත. එහිදී 1950 අංක 43 දරණ කාර්මික ආරවුල් පනතේ 46 වන වගන්තිය සංශෝධනය කිරීමෙන් ඕනෑම බලයලත් නිලධාරියෙකුට, බේරුම්කරුවෙකුට, කම්කරු විනිශ්චය සභාවේ කාර්මික අධිකරණය හෝ කම්කරු කොමසාරිස් හරහා නීතිඥයෙකුට හෝ වෙනත් නියෝජිතයෙකුට පෙනී සිටීමට බලය ලබා දීමට 2022 අංක 22 දරණ කාර්මික ආරවුල් (සංශෝධන) පනත පාර්ලිමේන්තුවේ සම්මත කරන ලදී.

4. **නියෝග ක්‍රියාත්මක කිරීමේදී සිදු වන අනවශ්‍ය අභියාචනයන් අවම කිරීම සඳහා රිට් අයදුම්පත්‍ර, ප්‍රතිශෝධන හා අභියාචන ගොනු කිරීමේ දී ඇප තැන්පත් කිරීමේ ප්‍රතිපාදන ගෙන ඒම**

කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ නියෝගවලට එරෙහිව රිට් අයදුම්පත්‍ර, හා මහේස්ත්‍රාත් අධිකරණ තීන්දුවලට එරෙහිව ප්‍රතිශෝධන හා අභියාචන ගොනු කිරීමේ දී ඇප මුදලක් කම්කරු කොමසාරිස් ජනරාල්වරයා වෙත තැන්පත් කිරීමෙන් අනතුරුව පමණක් එම අධිකරණ ක්‍රියාවලිය ආරම්භ කිරීමට හැකි වන පරිදි, කම්කරුවන්ගේ රක්ෂාව අවසන් කිරීමේ (විශේෂ විධිවිධාන) පනත සංශෝධනය කරන ලදී. ඒ අනුව, 2022 අංක 23 දරණ කාර්මික ආරවුල් (සංශෝධන) පනත පාර්ලිමේන්තුවේ සම්මත විය.

කාර්මික අධිකරණ නියෝගවලට හෝ මහේස්ත්‍රාත් අධිකරණ නියෝගවලට එරෙහිව රිට් අයදුම්පත්‍ර, ප්‍රතිශෝධන හෝ අභියාචනයක් සිදු කිරීමේ දී ඇප මුදලක් කම්කරු කොමසාරිස් ජනරාල්වරයා වෙත තැන්පත් කිරීමෙන් අනතුරුව පමණක් එම අධිකරණ ක්‍රියාවලිය ආරම්භ කිරීමට හැකි වන පරිදි, කම්කරුවන්ගේ රක්ෂාව අවසන් කිරීමේ (විශේෂ විධිවිධාන) පනත සංශෝධනය කරන ලදී. තීරණ ක්‍රියාත්මක කිරීමේදී සිදු වන අනවශ්‍ය අභියාචනයන් අවම කිරීම සඳහා මෙම නීතිමය ප්‍රතිපාදන ඇති කළ අතර ඒ අනුව 2022 අංක 24 දරණ කාර්මික ආරවුල් (සංශෝධන) පනත පාර්ලිමේන්තුවේ සම්මත විය.

5. **විනය පරීක්ෂණයක් පවත්වා තීරණයක් ලබා දීම සඳහා නිශ්චිත කාල සීමාවක් නියම කිරීම**

විෂමාචාර ක්‍රියාවක් හේතුකොට ගෙන හාම්පුතුන් විසින් වැඩ තහනම් කිරීම් හෝ වෙනත් ආකාරයේ විනය පරීක්ෂණවලට ලක්ව සිටින පෞද්ගලික අංශයේ සේවකයන් සම්බන්ධයෙන් සිදු කරන විනය ක්‍රියාමාර්ග කඩිනම් කිරීම සඳහා අවසාන විනය තීරණය ලබා දිය යුතු කාලසීමාවක් නියම කිරීමට 1950 අංක 43 දරණ කාර්මික ආරවුල් පනත සංශෝධනය කෙරේ.

අවසාන විනය තීරණ ලබා දීමට දීර්ඝ කාලයක් ගත වීම මඟින් සේවකයින්ට හා සේවකයින්ගේ යැපෙන්නන්ට විශාල අගතියක් සිදු වේ. විනය ක්‍රියාමාර්ග ගෙන අවසාන විනය තීරණය ලබා දීම සඳහා කාල රාමුවක් නිර්ණය කළ යුතු වේ. එබැවින්, සේවකයෙකුගේ වැඩ තහනම් කරනු ලැබූ අවස්ථාවක දී, එදින සිට මාස 06ක් ඇතුළත විනය පරීක්ෂණයක් පවත්වා අවසන් විනය නියෝගයක් ලබා දීමට හා අදාළ චෝදනාව මූල්‍ය වංචාවක් නොවන්නේ නම් වැඩ තහනමට ලක් වූ කාලය තුළ සේවකයාට අඩ වැටුප් ලබා ගැනීමට හැකි වන පරිදි විධිවිධාන ඇතුළත් කරමින් කාර්මික ආරවුල් පනත සංශෝධනය කිරීමට අපේක්ෂිතය. නීති කෙටුම්පත් සම්පාදක විසින් සකස් කළ මූලික කෙටුම්පත සඳහා නිරීක්ෂණ ලබා දී ඇති අතර අවසන් කෙටුම්පත හා නීතිපති සහතිකය ලැබීමෙන් අනතුරුව පනත් කෙටුම්පත ගැසට් පත්‍රයේ පළ කිරීමටත් පාර්ලිමේන්තුවේ අනුමැතියට ඉදිරිපත් කිරීමටත් අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය නැවත ලබා ගත යුතු වේ.

6. **සේවක සුබසාධනයට හා වර්තමානයට**

**ගැලපෙන පරිදි 1954 අංක 19 දරණ සාප්පු හා කාර්යාල සේවක පනත සංශෝධනය කිරීම**

විශේෂ නියෝග මත සීමා ලිහිල් කර ඇති සාප්පු හා කාර්යාල සේවක පනත යටතට ගැනෙන ගුවන්තොටුපළ, නේවාසික හෝටල් සහ අවන්හල් (රාත්‍රි 10) යන ව්‍යාපාර ආයතන හැර සෙසු ආයතනවලට රාත්‍රි 8න් පසු කාන්තාවන් සේවයේ යෙදවීමට සේවයෝජකයින්ට අයිතියක් නැත. ඒ සම්බන්ධයෙන්, තොරතුරු තාක්ෂණය සම්බන්ධ දැනුම පාදක කරගත් ව්‍යාපාර ක්‍රියාවලි කළමනාකරණ (Business Process Outsourcing (BPO)) ව්‍යාපාර අන්තර්ජාතික කාල සීමා අනුව ක්‍රියාත්මක වීම නිසා එම කාල සීමා නීති අනුව ව්‍යාපාර පවත්වා ගැනීම අසීරු හෙයින් එම ක්ෂේත්‍රවල නියැලී සිටින සේවකයන්ගේ අයිතීන් සුරක්ෂිත වන පරිදි (විශේෂයෙන් කාන්තා සේවිකාවන්ගේ ආරක්ෂාව තහවුරුවන පරිදි) සාප්පු හා කාර්යාල සේවක පනත සංශෝධනය කිරීම තුළින් අදාළ සේවා කොන්දේසි පිළිබඳ සීමා ලිහිල් කිරීම සිදු කළ යුතු වේ. ඒසේම, ශ්‍රම බලකාය තුළ කාන්තා සේවා නියුක්තිය ඉහළ නැංවීම සඳහා නම්‍යශීලී සේවා මුර ක්‍රමයක් හඳුන්වා දීම වැනි ක්‍රියාමාර්ග ද ඇතුලත් කළ යුතු වේ. නීති කෙටුම්පත් සම්පාදක විසින් සකස් කළ දෙවන දළ කෙටුම්පත සඳහා නිරීක්ෂණ ලබා දී ඇති අතර අවසන් කෙටුම්පත හා නීතිපති සහතිකය ලැබීමෙන් අනතුරුව පනත් කෙටුම්පත ගැසට් පත්‍රයේ පළ කිරීමටත් පාර්ලිමේන්තුවේ අනුමැතියට ඉදිරිපත් කිරීමටත් අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය නැවත ලබා ගත යුතු වේ.

**7. 1958 අංක 15 දරණ සේවක අර්ථසාධක අරමුදල් පනත සංශෝධනය කිරීම**

සේවක සුභසාධනයට සහ වර්තමාන සමාජ ආර්ථික තත්ත්වයට ගැළපෙන පරිදි සේවක අර්ථසාධක අරමුදල් පනත සංශෝධනය කළ යුතුය. සේවකයෙකු ස්වේච්ඡා විශ්‍රාම යෝජනා ක්‍රමයක් යටතේ හෝ වර්තමාන වැඩ ලොව අවශ්‍යතා මත වයස අවුරුදු 55 සම්පූර්ණ වීමට පෙර විශ්‍රාම ගැනීමේදී සේවක අර්ථසාධක අරමුදලේ ප්‍රතිලාභ ලබා ගැනීමට ප්‍රතිපාදන සැලසීම වැනි කරුණු සඳහා ප්‍රතිපාදන ඇතිකරනු ලැබේ. අමාත්‍ය මණ්ඩලය සංදේශය මඟින් අවසර ඉල්ලන ලද සංශෝධන සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ නිරීක්ෂණ සමඟ කෙටුම්පත නැවත සකස් කර ඉදිරි පියවර ගනු ලැබේ.

**8. 1983 අංක 12 දරණ පාරිතෝෂික පනත සංශෝධනය කිරීම**

සේවක සුභසාධනයට සහ වර්තමාන සමාජ ආර්ථික තත්ත්වයට ගැළපෙන පරිදි පාරිතෝෂික පනත සංශෝධනය කළ යුතුය. කම්කරු දෙපාර්තමේන්තුව විසින් සකස් කරන ලද දළ කෙටුම්පත ජාතික කම්කරු උපදේශක සභාවේ අවධානයට යොමු කර ඇත.

### 2.1.2 විදේශ රැකියා ප්‍රවර්ධනය සඳහා අවශ්‍ය නෛතික සහ ප්‍රතිපත්ති රාමුව ශක්තිමත් කිරීම

**1. ශ්‍රී ලංකාවේ රැකියා සඳහා විගමනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය යාවත්කාලීන කිරීම සහ විෂයපථය පුළුල් කිරීම**

සියලුම පාර්ශවකරුවන්ගේ සහභාගීත්වයෙන් යාවත්කාලීන කරන ලද රැකියා නියුක්තිය සඳහා විගමනය පිළිබඳ ශ්‍රී ලංකාවේ ජාතික ප්‍රතිපත්තිය සහ ක්‍රියාකාරී සැලැස්ම අමාත්‍ය මණ්ඩලය වෙත යොමුකරමින් කම්කරු හා විදේශ රැකියා අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කළ සංදේශය සඳහා ලද අමාත්‍ය මණ්ඩල තීරණයෙහි සඳහන් උපදෙස් පරිදි ජාතික ප්‍රතිපත්තිය සහ ක්‍රියාකාරී සැලැස්ම වැඩිදුර සංශෝධන කිරීමේ කටයුතු මේ වනවිට සිදුවෙමින් පවතී.

**2. 1985 අංක 21 දරණ ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ පනත සංශෝධනය කිරීම**

මෙම අමාත්‍යාංශයේ හා ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ නිලධාරීන්ගේ සහභාගිත්වයෙන් යෝජිත සංශෝධනයන් හඳුනාගෙන ඇති අතර අදාළ සංශෝධන

අමාත්‍ය මණ්ඩල අනුමැතියට යොමුකිරීම සඳහා පිළියෙල කර ඇත.

### 2.1.3 විදේශ රැකියාවේ නියුක්ත ශ්‍රී ලාංකිකයින් විසින් තමා උපයන මුදල් නීත්‍යනුකූල මාර්ගවලින් ශ්‍රී ලංකාවට ප්‍රේෂණය කිරීම දිරිමත් කිරීමට කටයුතු කිරීම

- විදේශ රැකියාවේ නියුක්ත ශ්‍රී ලාංකිකයින් විසින් තමා උපයන මුදල් නීත්‍යනුකූල මාර්ගවලින් ශ්‍රී ලංකාවට ප්‍රේෂණය කිරීම දිරිමත් කිරීම සඳහා පූර්ණ විද්‍යුත් වාහන ආනයනය කිරීම සඳහා බලපත්‍ර ලබාදීම. 2022.08.31 දිනැතිව නිකුත් කරන ලද චක්‍රලේඛයට අනුව මේවන විට විද්‍යුත් වාහන ආනයන බලපත්‍ර 45ක් නිකුත් කර ඇත.

- විදේශ රැකියාවකට පිටත්වයාම සඳහා ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ලියාපදිංචිය ලබාගන්නා පුද්ගලයින්ගෙන්, විදේශ රැකියාවෙන් උපයන මුදල් නීත්‍යනුකූල මාර්ගවලින් ශ්‍රී ලංකාවට ප්‍රේෂණය කරන බවට ස්වයං ප්‍රකාශන ලබා ගැනීම

- තම විදේශ රැකියාවෙන් උපයන මුදල් නීත්‍යනුකූල මාර්ගවලින් ශ්‍රී ලංකාවට ප්‍රේෂණය කිරීමට, එතෙර රැකියාවේ නියුක්ත ශ්‍රී ලාංකික ශ්‍රමිකයින් දිරිමත් කිරීම සඳහා විදේශ රටවල පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩල කාර්යාල මාර්ග යෙන් දැනුවත් කිරීමට කටයුතු කිරීම

- ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය හා ශ්‍රී ලංකා මහ බැංකුව එක්ව විදෙස්ගත ශ්‍රමිකයින්ගේ මුදල් නීත්‍යානුකූලව මෙරටට එවීමට (Lanka Remit) ජංගම දුරකථන යෙදවුමක් හඳුන්වා දීම

### 2.1.4 විදෙස් ශ්‍රමිකයන් සඳහා දායකත්ව විශ්‍රාම වැටුප් ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ලියාපදිංචි වී විදේශ රැකියාවේ නිරත වන ශ්‍රමිකයෙකුගේ වයස අවුරුදු 60 සම්පූර්ණ වූ පසු මාසික විශ්‍රාම වැටුපක් ලබාගැනීම සඳහා "මනුසවි" දායකත්ව විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයක් ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය හා එක්ව ක්‍රියාත්මක කිරීම. මෙම දායකත්ව විශ්‍රාම වැටුප් සඳහා දායක මුදල් විදේශ විනිමයවලින් ගෙවිය යුතු වේ.

### 2.1.5 ශ්‍රී ලාංකික විගමනික ශ්‍රමිකයින් හට ගුවන් තොටුපළ තුළදී වැඩි පහසුකම් ලබා දීමේ අරමුණින් "බලාපොරොත්තුවේ දොරටුව" (HOPE GATE) විවෘත කිරීම

### 2.1.6 පුහුණු ශ්‍රමිකයන් විදේශ රැකියා සඳහා යොමු කිරීම වෙනුවෙන් පුහුණු පාඨමාලා ආරම්භ කිරීම

- **උතුරු මැද පළාත් සභාව එක්ව සාත්තු සේවා පුහුණු පාඨමාලා පැවැත්වීම ආරම්භ කිරීම**

උතුරු මැද පළාතේ සාත්තු සේවා වෘත්තිකයින් ලෙස විදේශගත වීමට උනන්දුවක් දක්වන තරුණ තරුණියන් හට නොමිලේ සාත්තු සේවා පාඨමාලාව ලබා දීම සඳහා ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය හා උතුරු මැද පළාත් සභාව 2022.12.29 වන දින අවබෝධතා ගිවිසුමකට අත්සන් තබන ලදී. ඒ අනුව, උතුරු මැද පළාත් සභාව මඟින් එම පළාතේ තරුණ තරුණියන් හට වෘත්තීය පුහුණුවක් ලබා දීම සඳහා "රන් මාවත" නමින් ව්‍යාපෘතියක් ආරම්භ කර ඇති අතර කාර්යාංශයේ පුහුණු අංශයේ අධීක්ෂණය යටතේ සාත්තු සේවා පුහුණු පාඨමාලා පවත්වාගෙන යනු ලබයි. මෙම පාඨමාලාව සඳහා මූල්‍ය දායකත්වය සේෆ් ෆවුන්ඩේශන් ආයතනය හා උතුරු මැද පළාත් සභාව දරනු ලබන අතර එම පළාත් සභාව මඟින් සියලු යටිතල පහසුකම්ද ලබා දේ.

- **ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහල එක්ව සාත්තු සේවා පුහුණු පාඨමාලා පැවැත්වීම ආරම්භ කිරීම**

සාත්තු සේවා වෘත්තිකයින් ලෙස විදේශගතවීමට අපේක්ෂිත තරුණ තරුණියන් හට සාත්තු සේවා පාඨමාලාව ලබා දීම සඳහා ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය හා ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහල එක්ව 2022.09.08 වන දින අවබෝධතා ගිවිසුමකට

අත්සන් තබන ලදී.

- **ග්‍රීන්වේ පෞද්ගලික පුහුණු මධ්‍යස්ථානය එක්ව ගෘහස්ථ ගෘහපාලන සහකාර පුහුණු පාඨමාලා ආරම්භ කිරීම**

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් ග්‍රීන්වේ රැකියා නියෝජිත ආයතනය වෙත ගෘහස්ථ ගෘහපාලන සහකාර පුහුණු පාඨමාලාවන් පැවැත්වීම සඳහා පෞද්ගලික පුහුණු මධ්‍යස්ථානයක් ආරම්භ කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරනු ලැබේ.

### 2.1.7 සේවක අර්ථසාධක අරමුදල් ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා සහ සේවායෝජක ලියාපදිංචි කිරීම් සඳහා 'සේවක අර්ථසාධක අරමුදල් අයදුම්පත් භාරදීමට වේලාවක් වෙන් කරවා ගැනීමේ පද්ධතිය' හඳුන්වා දීම

පැමිණෙන සේවාලාභීන්ගේ පහසුව උදෙසා සකස් කරන ලද 'සේවක අර්ථසාධක අරමුදල් අයදුම්පත් භාරදීමට වේලාවක් වෙන් කරවා ගැනීමේ පද්ධතිය' (EPF Appointment Management System) 2022.09.01 දින සිට ක්‍රියාත්මක කරන ලදී. ඒ අනුව, 1958 අංකය ඇමතීමෙන් හෝ appointment.labourdept.gov.lk යොමුව මඟින් අදාළ කම්කරු කාර්යාල වෙතින් අවශ්‍ය සේවාව ලබා ගැනීම සඳහා දිනයක් සහ වේලාවක් වෙන් කර ගත හැකිය. මෙමඟින් සේවාදායකයින්ට කාලය අපතේ යැවීමකින් තොරව නිශ්චිත වේලාවකදී සේවය ලබා ගැනීමට පහසුකම් සලසා ඇත.

### 2.1.8 සේවක අර්ථසාධක අරමුදල සාමාජිකයන් ලියාපදිංචිය සිදු කරන A,B හා H පත්‍රිකා කම්කරු දෙපාර්තමේන්තු වෙබ් අඩවියෙන් බාගත කරගැනීමට පහසුකම් සැපයීම

සේවායෝජකයින්ගේ කටයුතු වඩාත් පහසු කිරීමේ පියවරක් ලෙස සේවක අර්ථසාධක අරමුදලේ සාමාජිකයන් ලියාපදිංචිය සිදු කරන A,B හා H පත්‍රිකා කම්කරු දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියෙන් (www.labourdept.gov.lk) ලබා ගැනීමේ නව ක්‍රමවේදයක් හඳුන්වා දෙන ලදී. ඒ අනුව, සේවායෝජකයින්ට මෙම A, B හා H පත්‍රිකා කම්කරු දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියෙන් බාගත කරගෙන කම්කරු දෙපාර්තමේන්තුවට එවීමෙන් සේවකයින් ලියාපදිංචි කළ හැකිය.

### 2.1.9 පැමිණිලි කළමනාකරණ පද්ධතියක් (Complaint Management System) ස්ථාපිත කිරීම

ශ්‍රී ලංකා තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ කොමිෂන් සභාවේ සම්බන්ධීකරණයෙන් එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ අනුග්‍රහය මත කම්කරු දෙපාර්තමේන්තුව මඟින් සකස් කරනු ලැබූ පැමිණිලි කළමනාකරණ පද්ධතිය 2022.03.15 දින සිට ක්‍රියාත්මක කරන ලදී. මෙමඟින් කම්කරු දෙපාර්තමේන්තුව වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කිරීමට අපේක්ෂා කරන පෞද්ගලික හෝ අර්ධ රාජ්‍ය අංශයේ සේවකයෙකුට සිය රැකියාව සම්බන්ධ ඕනෑම පැමිණිල්ලක් කම්කරු කාර්යාල වෙත පැමිණීමෙන් තොරව https://cms.labourdept.gov.lk යන ඊ සේවාව මඟින් මාර්ගගත ක්‍රමය ඔස්සේ ඉදිරිපත් කිරීමට පහසුකම් සැලසේ.

### වර්තමාන අභියෝගයන්

රටේ පැවති කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් ආර්ථිකය තුළ ව්‍යුහාත්මක වෙනසක් ඇති වූ අතර වර්තමාන ආර්ථික අර්බුදය හමුවේ මෙම අමාත්‍යාංශයේ කාර්යභාරයන්හි දිශානතිය නව මානයකට යොමු කිරීමට සිදු වේ. පුද්ගලයන් සේවා වියුක්ත වීම, ඌණ සේවා නියුක්තිය මෙන්ම ශ්‍රම බලකාය තුළ කාන්තා සහභාගීත්වය අඩු වීම යන අභියෝගයට මෙම අමාත්‍යාංශයට මුහුණ දීමට සිදු වේ. රට තුළ කාර්මික සාමය ඇති කර සේවක අයිතිවාසිකම් සුරක්ෂිත කරන අතරම ආයෝජන හිතකාමී පරිසරයක් ඇති කිරීමට ඉවහල් වන පරිදි සංකීර්ණ කම්කරු නීති සරල කිරීම සිදු කළ යුතු වේ.

එමෙන්ම, ශ්‍රම බලකාය තුළ කාන්තා සේවා නියුක්තිය සාපේක්ෂව අවම මට්ටමක පවතී. එම තත්ත්වය මඟ හරවා ගැනීම සඳහා රාත්‍රී සේවා මුර කොන්දේසි ලිහිල් කිරීම වැනි ක්‍රියාමාර්ග අනුගමනය තුළින් ශ්‍රම බලකායේ කාන්තා සහභාගීත්වය වැඩි කර ගැනීමට කටයුතු කළ යුතු වේ. මෙරට ශ්‍රම බලකාය තුළ වැඩිහිටි ජනගහණය වැඩි වීම නිසා නුදුරු

අනාගතයේ දී ජනගහණය වයස්ගත වීම නිසා ඇතිවන සමාජ, ආර්ථික ගැටළුවලට පිළියම් ලෙස සමාජ ආරක්ෂණ ක්‍රම ශක්තිමත් කිරීම කළ යුතු වේ.

එසේම, විදේශ රැකියාවන් සඳහා වැඩි වශයෙන් පුද්ගලයන් යොමු කිරීම තුළින් මෙරට මුහුණ පා සිටින විදේශ විනිමය අර්බුදයට සහනයක් වීමටද මෙම අමාත්‍යාංශය කටයුතු කළ යුතු වේ. වර්තමාන ලෝකයේ අවශ්‍යතාවයන්ට සරිලන පරිදි පුහුණු ශ්‍රමිකයන් නොමැති වීම අප මුහුණපාන ප්‍රධාන අභියෝගයකි. ඒ අතරම දිනෙන් දින දියුණු වන නවීන තාක්ෂණික පුහුණුව ලබා දීමට වෘත්තීය පුහුණු ආයතනවලට හැකියාවක් නොමැත. විදෙස් ශ්‍රම වෙළඳපොළ සඳහා අනෙකුත් රටවලින් ඇති කරන තරඟකාරීත්වය ඉතා ඉහළ මට්ටමක පවතී. නවීන තාක්ෂණික දැනුමෙන් සන්නද්ධ කුසලතා පිරි ශ්‍රමිකයින් සපයන රටවල් අතර තරඟකාරීත්වය ඉහළය.

එමෙන්ම, පවත්නා සීමිත සම්පත් ආර්ථික වශයෙන් පිරිමැසුම්දායක වන පරිදි මෙහෙයවීම තුළින් අමාත්‍යාංශ අරමුණු ඉටු කර ගැනීමට කටයුතු කළ යුතු වේ. මෙම අභියෝග ජයගෙන ආර්ථික සංවර්ධනයට රුකුලක් වන ලෙස රට තුළ කාර්මික ස්ථාපනය කිරීමටත්, විවිධාංගීකරණය කළ විදෙස් ශ්‍රම වෙළඳපොළ සඳහා පුහුණු ශ්‍රමිකයන් යොමු කිරීමටත් හැකිවන පරිදි නීති රීති හා අදාළ ප්‍රතිපත්ති රාමුව මෙම අමාත්‍යාංශය විසින් ඇති කළ යුතු වේ.

### ඉදිරි සැලසුම්

1. කම්කරු ප්‍රජාවගේ අයිතිවාසිකම් සහ සුභසාධනය සහතික කිරීම සඳහා කම්කරු දෙපාර්තමේන්තුව ආරම්භයේ සිට පනවන ලද අණපනත් සහ රෙගුලාසි 50ක් පමණ ක්‍රියාත්මක වේ. යල් පැනගිය කම්කරු නීති වර්තමානයට ගැලපෙන පරිදි සහ පනත් අතර පවතින සංකීර්ණතා ඉවත් කර සරල කරමින් සියලු පාර්ශවයන්ට ප්‍රතිලාභ සහතික කිරීම සඳහා අණපනත් සංශෝධනය කිරීමේ අවශ්‍යතාව සමාජය තුළ දැඩිව පවතී. මෙම අවශ්‍යතාව ගරු ජනාධිපතිතුමා විසින් 2023 වර්ෂයේ අයවැය යෝජනා තුළින් ද ඉදිරිපත් කර ඇති අතර එම වගකීම මෙම අමාත්‍යාංශයට පවරා ඇත. වර්තමාන සමාජ-ආර්ථික වෙනස්කම්වලට ගැළපෙන අයුරින් සේවා නියමයන් සහ කොන්දේසි එකතුකර නව කම්කරු නීතියක් හඳුන්වාදීමේ මූලික අධ්‍යයනය කම්කරු දෙපාර්තමේන්තුව විසින් ආරම්භ කරන ලදී

2. කම්කරුවන් සඳහා නව සමාජ ආරක්ෂණ ක්‍රමයක් හඳුන්වාදීම සඳහා අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතී. වර්තමානයේදී සෞඛ්‍ය හා වෘත්තිය ආරක්ෂණ ප්‍රතිලාභ, මාතෘ ප්‍රතිලාභ, සේවා වියුක්ති ප්‍රතිලාභ, සේවක වන්දි ප්‍රතිලාභ සේවායෝජකයා විසින් දැරිය යුතු වේ. එම ප්‍රතිලාභ සේවායෝජකයාට අමතර බරක් නොවන ලබා දීම සඳහා මෙන්ම සමාජ ආරක්ෂණය සහ රැකියා විරහිත වූවන් සඳහා රක්ෂණ පහසුකම් සැපයීම සඳහා නව ක්‍රමවේදයන් හඳුන්වා දිය යුතු වේ

3. කම්කරු දෙපාර්තමේන්තුවේ ඩිජිටල්කරණ කටයුතු 2023 වර්ෂයේදී ආරම්භ කර 2026 වර්ෂය ආරම්භ වන විට, පෞද්ගලික සහ අර්ධ රාජ්‍ය අංශයේ සියලුම සේවකයන් සේවයට බැඳුනු දින සිට විශ්‍රාම ලබා ගන්නා තෙක් කම්කරු දෙපාර්තමේන්තුව විසින් සපයනු ලබන සියලු සේවා ඩිජිටල්කරණය කිරීමට අපේක්ෂිතය. සේවාලාභියා දෙපාර්තමේන්තුව වෙත පැමිණීම හැකිතාක් අවම කර අන්තර්ජාලය හරහා සේවා සැපයීම තුළින් අනවශ්‍ය ප්‍රමාදයන් වළක්වා කාර්යක්ෂමතාවය වර්ධනය කිරීමට මෙමඟින් අවස්ථාව ලැබේ

4. සමාජ කතිකාවට අදාළ ප්‍රමිතීන් පවත්වාගෙන යන ආයතන වෙත "සමාජ කතිකා තත්ත්ව සහතික" (Social Dialogue Certificate for Quality) 2023 වර්ෂයේ සිට ලබා දීම

   පෞද්ගලික හා අර්ධ රාජ්‍ය ආයතනවලට මෙම තත්ත්ව සහතිකය ලබා ගැනීම සඳහා අයදුම් පත්‍ර ඉදිරිපත් කිරීමේ අවස්ථාව හිමි වන අතර කමිටුවක් මඟින් ක්ෂේත්‍ර පරීක්ෂා කිරීමකින් අනතුරුව ඇගයීම් පත්‍රයට එම ආයතන ලබා ගන්නා ලකුණු ප්‍රමාණය මත එම ආයතනයේ සමාජ

කතිකාව හා වැඩපොළ සහයෝගීතාවය කුමන මට්ටමක පවතින්නේද යන්න පිළිබඳ සහතිකයක් නිකුත් කිරීමට අපේක්ෂා කෙරේ

5. විදේශගතව සිට ආපසු මෙරටට පැමිණෙන ශ්‍රී ලාංකිකයින්ට එතෙර ගතකළ කාලසීමාව පදනම් කරගෙන ශ්‍රී ලංකාවේ තීරුබදු රහිත වෙළෙඳසැල්වලින් භාණ්ඩ මිලදී ගැනීම සඳහා ලබාදෙන රේගුබදු නිදහස් දීමනාවට අමතරව, තම විදේශ රැකියාවෙන් උපයන මුදල් නීත්‍යානුකූල මාර්ගවලින් ශ්‍රී ලංකාවට ප්‍රේෂණය කළ ශ්‍රී ලාංකිකයින් සඳහා අමතර රේගුබදු නිදහස් දීමනාවක් ලබාදීම

6. විදේශ රැකියා ක්ෂේත්‍රය විධිමත් කිරීම, පවතින නෛතික රාමු ශක්තිමත් කිරීම හා ජාත්‍යන්තර බැඳීම්වලට අනුගතවීම සඳහා දේශීය වශයෙන් නීති ක්‍රියාත්මක කිරීම පහසු කිරීම සඳහා ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ පනත සංශෝධනය කිරීම

7. ජාතික වෘත්තීය සුරක්ෂිතතා සහ සෞඛ්‍ය ආයතනය 2023 වසරේ සිට භාණ්ඩාගාරයෙන් ප්‍රතිපාදන ලබා නොගෙන ස්වයං මූල්‍ය ආයතනයක් ලෙස පවත්වාගෙන යාමට කටයුතු කරනු ලැබේ. 2023 වර්ෂය අවසානයේ දී ආයතනයේ ලාභ ඉපැයීම්වලින්, මහා භාණ්ඩාගාරයට යම් දායකත්වයක් ලබාදීමට ද අපේක්ෂිතය. එමෙන්ම, රැකියා ආශ්‍රිත අනතුරු සහ රෝග වැළැක්වීම තුළින් ආරක්ෂිත සේවා ස්ථාන හා සෞඛ්‍ය සම්පන්න ශ්‍රම බලකායක් බිහිකිරීම සඳහා දැනට කරගෙන යනු ලබන කාර්යයන් තවදුරටත් පුළුල් කිරීමට බලාපොරොත්තු වේ. එසේම, එම ආයතනය වෘත්තීය සුරක්ෂිතතාව සහ සෞඛ්‍ය පිළිබඳ ජාත්‍යන්තර මට්ටමේ ආයතනයක් බවට පත් කිරීමට අවශ්‍ය මූලික පියවර 2023 වර්ෂයේදී ආරම්භ කෙරේ

8. විදේශ රැකියා ක්ෂේත්‍රයේ දියුණුව සඳහා පහත ක්‍රියාමාර්ග ඇරඹීමට සැලසුම් කර ඇත

- මැදපෙරදිග කලාපය මත යැපීම වෙනුවට රැකියා සඳහා විකල්ප රටවල් සොයා ගැනීමේ දැඩි අවශ්‍යතාවයක් පවතී. වයස්ගත ජනගහණය වැඩිවීමත්, ස්ත්‍රී ශ්‍රම බලකායේ සහභාගීත්වය ඉහළ යාමත් හේතුවෙන් දියුණු රටවල්වල හෙද සේවය සහ වැඩිහිටි සත්කාර සේවය වැනි විශේෂ සේවා සඳහා විශාල ඉල්ලුමක් නිර්මාණය වෙමින් පවතී. ඒ අනුව නව රටවල් හා නව ක්ෂේත්‍ර හඳුනා ගැනීමට කටයුතු කිරීම

- විදේශ රැකියා අපේක්ෂකයින්ට වඩාත් ඵලදායි විදේශ රැකියා අවස්ථා ප්‍රවර්ධනය කිරීම, විදේශ රැකියා ප්‍රවර්ධනයේදී මූලිකවම සලකා බැලිය යුතු කරුණක් වන අතර ගෝලීය වශයෙන් දැනට තිබෙන රැකියා අවස්ථාවන්ට අනුව මෙම ක්ෂේත්‍රය තුළ වඩා තරඟකාරී ලෙස වාසි ලබා ගැනීමට ශ්‍රී ලංකාවට ඇති අවස්ථාවන් හඳුනා ගැනීමත්, එම රැකියා අවස්ථාවන්වලට ගැලපෙන හෝ යෝග්‍ය නිපුණතා සඳහා පුහුණුව ලබාදීමත් හරහා පුහුණු ශ්‍රම සංක්‍රමණයට වැඩි අවස්ථාවන් ලබාදීම සඳහා කටයුතු කිරීම

- රැකියා සඳහා සංක්‍රමණය වන ශ්‍රමිකයන්ගේ සහ ඔවුන්ගේ පවුලේ සාමාජිකයින්ගේ ආරක්ෂාව සහ සුභ සාධනය සඳහා අමාත්‍යාංශය විසින් දැනට ක්‍රියාත්මක කරමින් පවතින පවුල් සංවර්ධන සැලසුම් හා රැකවරණ සැලසුම් යනාදි වැඩසටහන් තවදුරටත් ශක්තිමත් කරමින් අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම සහ ඵලදායි සහ ආරක්ෂිත සංක්‍රමණය පිළිබඳව ප්‍රාදේශීය වශයෙන් දැනුවත් කිරීමේ කටයුතු පුළුල් කිරීම

- රැකියා සඳහා සංක්‍රමණය පිළිබඳ ශ්‍රී ලංකා ජාතික ප්‍රතිපත්තිය සහ ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීම

- සංක්‍රමණික ශ්‍රමිකයන්ගේ සහ ඔවුන්ගේ පවුල්වල අයිතිවාසිකම් සහ යහපැවැත්ම සුරක්ෂිත කිරීම සඳහා සංවර්ධන හවුල්කරුවන් සමඟ එක්ව වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

මේ යටතේ, සංවර්ධන හා

සහයෝගීතාවය සඳහා වන ස්විස් ඒජන්සියේ දායකත්වයෙන් සහ ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ දායකත්වය ඇතිව සත්කාර දීමේ සහ සත්කාරක අංශවල රැකියා වැඩි කිරීම සඳහා ශ්‍රම සංක්‍රමණ උපාය මාර්ග සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය සමඟ ආරක්ෂිත සහ වගකීම් සහිත ශ්‍රම සංක්‍රමණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

- විදේශගත වීමට අපේක්ෂිත රජයේ නිලධාරීන්ට සහ සෙසු ශ්‍රමිකයින්ට සුරක්ෂිත රැකියා අවස්ථා ලබා දීම සම්බන්ධයෙන් සහාය වීම උදෙසා විශේෂ ව්‍යාපෘතියක් විදේශ රැකියා අංශයේ සම්බන්ධීකරණයෙන් රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය සහ අධ්‍යාපන අමාත්‍යාංශය ඒකාබද්ධව ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත

  මේ සඳහා ඒකාබද්ධ මාර්ගෝපදේශ සහ යොමු කිරීමේ පද්ධතියක් (Integrated Guidance and Referral System -IGRS) ස්ථාපිත කරනු ලබයි. මෙහි නියමු ව්‍යාපෘතිය සඳහා මූල්‍ය සහ තාක්ෂණික සහාය සංක්‍රමණය සඳහා වූ ජාත්‍යන්තර සංවිධානය (IOM) විසින් ලබා දේ

- අදාළ අනෙකුත් අමාත්‍යාංශ සහ ආයතනවල සහයෝගය ලබා ගනිමින් නැවත පැමිණෙන සංක්‍රමණික ශ්‍රමිකයන් දේශීය ශ්‍රම වෙළඳපොළට ඒකාබද්ධ කිරීම සඳහා දැනට පවතින ක්‍රමවේදය ශක්තිමත් කිරීම

9. 2023 වන විට මහනුවර, නුවරඑළිය, පුත්තලම, මඩකලපුව, මාතර, මොණරාගල, ගම්පහ, කළුතර, බදුල්ල සහ ගාල්ල 'ළමා ශ්‍රමයෙන් තොර කලාප' ලෙසත් 2025 වන විට සියලුම දිස්ත්‍රික්කත් 'ළමා ශ්‍රමයෙන් තොර කලාප' ලෙස ප්‍රකාශයට පත් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම

10. වඩා හොඳ පාලනයක් සහ තොරතුරු හා සාක්ෂි පදනම් කරගත් ප්‍රතිපත්ති සම්පාදනය සඳහා දේශීය හා විදේශීය රැකියා සඳහා ශ්‍රම වෙළඳපොළ තොරතුරු පද්ධතියක් ස්ථාපිත කිරීම

11. සේවයේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම, ආරක්ෂක සේවය, පිරිසිදු කිරීමේ සේවා සපයන්නන් වැනි දෛනික ජීවිතයේ දී සම්බන්ධ වන සේවාවන්හි සේවා ගුණත්වය ඉහළ නැංවීම සඳහා ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය විසින් 2023 වර්ෂයේදී අවශ්‍ය පියවර ගැනීමට නියමිතය

12. අමාත්‍යාංශය හා අනුබද්ධිත ආයතන විසින් සේවා සැපයීමේ කාර්යක්ෂමතාව ඉහළ නංවනු වස් වැඩ ක්‍රියාදාමයන් අධ්‍යයනය තුළින් ක්‍රියාවලි සරල කිරීමෙන් අභ්‍යන්තර හා බාහිර ගනුදෙනුකාර තෘප්තිය ඉහළ නංවන අතරම ගනුදෙනු පිරිවැය අඩු කිරීමට අපේක්ෂා කෙරේ

**ආර් පී ඒ විමලවීර**
ලේකම්
කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය

## 2.2 අමාත්‍යාංශයේ ප්‍රගතිය

### 2.2.1 ශ්‍රම බලකාය ශක්තිමත් කිරීම සහ ජාත්‍යන්තර කම්කරු ප්‍රමිතීන් පවත්වාගෙන යාම

ජාත්‍යන්තර කම්කරු සංවිධානය සමඟ එම සංවිධානයේ සාමාජික රටක් ලෙස ශ්‍රී ලංකාව විසින් ඇති කරගත් බැඳීම, අන්තර්ජාතික වශයෙන් පිළිගත් සම්මුතීන් හා නිර්දේශයන් යටතේ මෙරට කම්කරු අයිතීන් සුරක්ෂිත කිරීම සහ කම්කරු ක්ෂේත්‍රයේ ගැටලු විසඳීම සඳහා උපයෝගී කර ගැනීමට අදාළ වගකීම මෙම අමාත්‍යාංශය විසින් ඉටු කරනු ලබයි.

කම්කරු ක්ෂේත්‍රය සම්බන්ධයෙන් වන ජාත්‍යන්තර කම්කරු සංවිධානය හා අනෙකුත් බහුපාර්ශවීය නියෝජිත ආයතන උදෙසා සාමාජික රටක් වශයෙන් ශ්‍රී ලංකාවේ බැඳීම හා වගකීම් සපුරා ඇති බව සහතික කිරීම හා කම්කරු ප්‍රතිපත්ති සම්පාදනය කිරීම. ජාතික මට්ටමේ සමාජ සංවාද ඇති කිරීම සහ මානව සම්පත් සංවර්ධනය සඳහා ජාත්‍යන්තර සහාය ලබා ගැනීමට ද කටයුතු කරනු ලැබේ. මෙම ඉලක්ක සපුරාලීමට 2022 වසර තුළ පහත පියවර ගෙන ඇත.

**1. ශ්‍රම බලකාය බලගැන්වීම සහ ආරක්ෂා කිරීම.**

I. ත්‍රෛපාර්ශවීය නියෝජනයෙන් යුක්ත ජාතික කම්කරු උපදේශක සභා (NLAC) රැස්වීමේ දී පහසුකම් සපයන්නා ලෙසට ක්‍රියා කිරීම. 2022 වර්ෂය තුළ රැස්වීම් හතරක් පැවැත්වීම මඟින් පහත ක්‍රියාමාර්ග සිදු කර ඇත

- ශ්‍රම බලකාය තුළ කාන්තා සහභාගීත්වය වැඩි කිරීම සඳහා සාප්පු හා කාර්යාල සේවක පනත සංශෝධනය කිරීම සඳහා තීරණය කරන ලදී
- සේවක අර්ථසාධක අරමුදලේ 30% හිමිකම් ලබා ගැනීම සඳහා අනුගමනය කරනු ලබන පරිපාලන ක්‍රියාවලිය ලිහිල් කිරීම සඳහා යෝජනා ඉදිරිපත් කරන ලදී
- අයවැය සහන දීමනා දෙකක් ඇතුළත් කර අවම වැටුප රු. 21,000/-ක් දක්වා වැඩි කිරීමට යෝජනා විය
- රු.1,000/- දෛනික වැටුප් ගෙවීම සම්බන්ධ වතුකරයේ ගැටලු වෘත්තීය සමිති නායකයන් විසින් ඉදිරිපත් කළ අතර ඒ පිළිබඳව සාකච්ඡා කරන ලදී

II. දැනට පවතින ආර්ථික අර්බුදය හේතුවෙන් ශ්‍රම වෙළඳපොළ තුළ ඇතිවී තිබෙන ගැටලු හඳුනාගෙන ඒවාට විසඳුම් සෙවීම සඳහා ත්‍රෛපාර්ශවීය නියෝජනයෙන් යුක්තව කමිටුවක් පත්කර එයට අදාළ කටයුතු සංවිධානය කිරීම හා ගරු කම්කරු හා විදේශ රැකියා අමාත්‍යතුමාගේ සහභාගීත්වයෙන් සාකච්ඡා වාරයක් පැවැත්වීම හා එහිදී සමාජ ආරක්ෂණය සහ රැකියා විරහිත වූවන් සඳහා රක්ෂණ පහසුකම් සැපයීම සඳහා යෝජනා ඉදිරිපත් කිරීමට කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය, මහා භාණ්ඩාගාරය, ශ්‍රී ලංකා මහ බැංකුව, ජාත්‍යන්තර කම්කරු සංවිධානය හා සේවා නියුක්තයන්ගේ භාර අරමුදල නියෝජනය වන පරිදි කමිටුවක් පිහිටුවීම සඳහා ගරු කම්කරු අමාත්‍යතුමා විසින් උපදෙස් ලබා දෙන ලදී

III. කම්කරු ක්ෂේත්‍රයට අදාළ අණපනත් ප්‍රතිපත්තීන් සංශෝධනය කිරීම සහ නව පනත් ආරම්භ කිරීම පිළිබඳ කරුණු, ප්‍රවණතාවන්, කම්කරු නීති හා ප්‍රතිපත්තී සම්බන්ධයෙන් අමාත්‍යාංශ කමිටු රැස්වීම් පැවැත්වීම

**අ. සාප්පු හා කාර්යාල සේවක පනත සංශෝධනය කිරීම සඳහා සාකච්ඡා 02ක් පැවැත්වීම**

- දැනුම් ක්‍රියාවලිය බාහිරින් සපයා ගැනීමේ ආයතන (KPO), ව්‍යාපාර ක්‍රියාවලිය බාහිරින් සපයා ගැනීමේ ආයතන (BPO) සහ වෙනත් රටවල පිහිටි ව්‍යාපාර ආයතන සහ ගිණුම් පරිපාලන කටයුතු කරනු ලබන කාර්යාල වැනි ආයතනවල සේවයේ නියුතු කාන්තා සේවිකාවන්ට රාත්‍රී සේවයේ යෙදීමට අවස්ථාව ලබා දීම

- රාත්‍රී සේවයේ යොදවනු ලබන කාන්තාවන් වෙනුවෙන් ප්‍රවාහන පහසුකම්, ආරක්ෂාව හා සේවය කරන ස්ථානයට අදාළ පොදු පහසුකම් ලබා දීමට අදාළ නියෝග සෑදීමේ බලය ලබා දීම

- ඉටු කරන සමාන සේවයක් හෝ වැඩක් සඳහා ස්ත්‍රී පුරුෂ භේදයකින් තොරව සමාන වේතන ගෙවීම සඳහා සේවායෝජකයන්ට නියම කිරීම

**ආ. ජාතික අවම වේතන පනතට අදාළ සාකච්ඡා පැවැත්වීම**

- ජාතික අවම වැටුප රු. 21,000/- දක්වා වැඩි කිරීමට හාම්පුතුන් එකඟ වී ඇති බැවින් මෙම තීරණය ජාතික කම්කරු උපදේශක සභාව වෙත ඉදිරිපත් කළ හැකි අතර එහි ප්‍රතිඵල අනුව ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම

- ජාතික අවම වැටුප ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා යෝජිත සංශෝධනවලට අයවැය සහන දීමනා පනත් දෙක ඇතුළත් කිරීමටද අනුකම්ටුව එකඟ වීම

- ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ තාක්ෂණික සහය ඇතිව ජාතික අවම වැටුප් ගැලපීම සඳහා යාන්ත්‍රණයක් පිහිටුවීමේ හැකියාව ගවේෂණය කිරීමට අනුකම්ටුව නිර්දේශ කිරීම

IV. ළමා ශ්‍රමය පිටුදැකීම පිළිබඳ ජාතික මෙහෙයුම් කමිටුවට (NSCECL) අදාළ රැස්වීමක් පැවැත්වීම හා ඊට අදාළ සියලුම කටයුතු සම්බන්ධීකරණය කිරීම

ළමා ශ්‍රමිකයන් තුරන් කිරීම සඳහා ක්‍රියාවට නංවා ඇති දැනට පවතින සහ අවසන් වූ ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් වාර්තා ඉදිරිපත් කරන ලෙසත් ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම සඳහා යෝජනා ලබා දෙන ලෙසත් එම වාර්තා ලද පසු කම්කරු දෙපාර්තමේන්තුවේ ළමා හා කාන්තා අංශය විසින් ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමේ ක්‍රියාවලිය ආරම්භ කිරීමට සැලසුම් කරන ලදී. තවද, තෝරාගත් දිස්ත්‍රික්කවල ළමා ශ්‍රමය මුක්ත කලාප ආදර්ශය ප්‍රතිනිර්මාණය කිරීම සඳහා ද සාකච්ඡා කර ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමට කම්කරු දෙපාර්තමේන්තුව තීරණය කරන ලදී

**2. ජාත්‍යන්තර කම්කරු ප්‍රමිතීන් පවත්වාගෙන යාම**

I. ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ ව්‍යවස්ථා අංක 22 යටතේ 2022 වර්ෂය සඳහා සම්මුතීන් 06ක් සඳහා වාර්තා සම්පාදනය කිරීම

II. ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ ව්‍යවස්ථා අංක 19 යටතේ පවතින අපරානුමත නොකළ සම්මුති සඳහා වාර්තා සම්පාදනය කිරීම

III. EU GSP+ සහනය ලබාගැනීම සම්බන්ධව ඇති ගැටලු නිරාකරණය කිරීමේ වාර්තාව සම්පාදනය කිරීම සහ GSP + බදු සහනය අධීක්ෂණය කිරීම සඳහා පත් කරනු ලැබූ ත්‍රෛපාර්ශවීය කමිටුවේ රැස්වීම් පැවැත්වීම හා ඊට අදාළ සියලු කටයුතු සංවිධානය කිරීම හා සහභාගීවීම

IV. වාර්ෂිකව ජිනීවාහී පැවැත්වෙන ජාත්‍යන්තර කම්කරු සමුළුව සඳහා ත්‍රෛපාර්ශවීය නියෝජිතයන් සහභාගී කරවීමට අදාළ සියලුම කටයුතු සම්බන්ධීකරණය කිරීම සහ පසුවිපරම් කටයුතු සිදු කිරීම. ඒ අනුව, 2022.05.27 සිට 2022.06.11 දින දක්වා විද්‍යුත් මාර්ගගත ක්‍රමය ඔස්සේ රාජ්‍ය නියෝජිතයන් 08ක්, හාම්පුතුන්ගේ නියෝජිතයන් එක් අයෙක් සහ වෘත්තීය සමිති නියෝජිතයන් 07 දෙනෙක් සමුළුව සඳහා සහභාගී විය

V. ශ්‍රී ලංකාව හා විදේශ රටවල් අතර කම්කරු ක්ෂේත්‍රයට අදාළව සමාජ ආරක්ෂණ, අධ්‍යාපනය සම්බන්ධයෙන් ඉදිරියේදී ඇතිකර ගැනීමට නියමිත අවබෝධතා ගිවිසුම් හා ඒ සම්බන්ධ සියලු වැඩසටහන්වලට අදාළව කටයුතු කිරීම

- ඉන්දියාව හා ශ්‍රී ලංකාව අතර සමාජ

ආරක්ෂණ ගිවිසුමට අදාළ අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව සකස් කිරීම හා අවබෝධතා ගිවිසුම අත්සන් කිරීමට අදාළ කටයුතු සම්පාදනය

- ජපානයේ එහිම් ප්‍රාන්තය හා කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශයට අයත් විදේශ රැකියා අංශය අතර අත්සන් කිරීමට යෝජිත අවබෝධතා ගිවිසුමට අදාළ අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව සකස් කිරීම

VI. ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ තාක්ෂණික සහයෝගීතාවය ඇතිව ක්‍රියාත්මක කරන ව්‍යාපෘති හා වැඩමුළුවලට අදාළව සියලු සම්බන්ධීකරණ කටයුතු කිරීම

VII. වාර්ෂිකව යැවිය යුතු ශ්‍රම සංඛ්‍යාලේඛන පිළිබඳ ප්‍රශ්නාවලියට පිළිතුරු ජාත්‍යන්තර කම්කරු සංවිධානය වෙත සැපයීම

VIII. සංගමයේ නිදහසට ඇති අයිතිය උල්ලංඝනය කිරීම සහ ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ ප්‍රඥප්ති අංක 87 සමඟ ඵලදායී ලෙස අනුකූල වීම සහතික කිරීමට ශ්‍රී ලංකා රජය අසමත්වීම යන මැයෙන් වෘත්තීය සමිති මඟින් ජාත්‍යන්තර කම්කරු සංවිධානය වෙත ඉදිරිපත් කරන ලද පැමිණිල්ල සඳහා අදාළ ආයතන වෙතින් තොරතුරු ලබා ගෙන ජාත්‍යන්තර කම්කරු සංවිධානය වෙත වාර්තා දෙකක් ඉදිරිපත් කිරීම

IX. සාම්ප්‍රදායික වහල්භාවය, ණයගැති බව, බලහත්කාර ශ්‍රමය, ලිංගික වහල්භාවය, බාල විවාහ සහ වහල් විවාහ, වැනි සමකාලීන වහල්භාවයේ හේතු සහ ප්‍රතිවිපාක පිළිබඳ වාර්තා කිරීම සඳහා එක්සත් ජාතීන්ගේ විශේෂ වාර්තාකරු ටොමෝයා ඔබකෝටා මහතාගේ ලක්දිව සංචාරයට අදාළව වාර්තා සැපයීම

X. ජාත්‍යන්තර සමාජ ආරක්ෂණ සංගමයේ වාර්ෂික තොරතුරු යාවත්කාලීන කිරීම

XI. විදේශ කටයුතු අමාත්‍යාංශය සහ අනෙකුත් රජයේ අමාත්‍යාංශ වෙත කම්කරු ක්ෂේත්‍රයට අදාළ වන නව ප්‍රවණතා පිළිබඳ වාර්තා සම්පාදනය කිරීම

XII. තාක්ෂණික සහය ලබා දීම වෙනුවෙන් ශ්‍රී ලංකාවට පැමිණෙන ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ නිලධාරීන් සඳහා වීසා ඉල්ලීම් ලිපි විදේශ අමාත්‍යාංශයට ඉදිරිපත් කිරීම

XIII.ජාත්‍යන්තර කම්කරු සම්මේලනයේ සම්මත කර ගන්නා ලද සම්මුතීන් හා නිර්දේශ පාර්ලිමේන්තුවේ සභාගත කිරීම සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීම

### 2.2.2 ජාත්‍යන්තර සහයෝගිතාව තුළින් විගමනික ශ්‍රමිකයන් සවිබල ගැන්වීම

**1. අවබෝධතා ගිවිසුම් / එකඟතා**

විදේශ රැකියා අංශයේ ප්‍රවර්ධනය, මානව හැකියාවන් වර්ධනය කිරීම, ජාත්‍යන්තර සමාජ ආරක්ෂක වැඩසටහන්, පුහුණු වැඩසටහන්, නීති කටයුතු සහ අන්‍යෝන්‍ය සබඳතා වැඩිදියුණු කිරීම සඳහා ශ්‍රී ලංකා රජය රටවල් සමඟ ගිවිසුම් ගණනාවකට එළඹ තිබේ. දැනට එවැනි අවබෝධතා ගිවිසුම් / එකඟතා දහනවයක් (19) සක්‍රීයව ක්‍රියාත්මක කෙරේ.

- නව අවබෝධතා ගිවිසුම් / එකඟතා

  ශ්‍රී ලංකා රජය, මහා බ්‍රිතාන්‍ය හා උතුරු අයර්ලන්ත රජය අතර සෞඛ්‍ය සේවා සහයෝගීතාවය පිළිබඳ අවබෝධතා ගිවිසුම 2022 ජනවාරි මස 18 දින අත්සන් කරන ලදී

- විදේශ කටයුතු අමාතත්‍යාංශය හරහා පහත සඳහන් රටවල් සමඟ අවබෝධතා ගිවිසුම් / එකඟතා අත්සන් කිරීමට අදාළව කෙටුම්පත් හුවමාරු කරගෙන ඇත

| | | |
|---|---|---|
| මෝල්ටා ජනරජය | - | මිනිස්බල ක්ෂේත්‍රය |
| රුමේනියාව | - | රැකියා සහ මිනිස්බල ක්ෂේත්‍ර |
| ලක්සම්බර්ග් | - | රැකියා සහ මිනිස්බල ක්ෂේත්‍රය |
| ඉතාලිය | - | සංක්‍රමණය සහ සංචලන හවුල්කාරීත්වය |

- විදේශ රැකියා සම්බන්ධයෙන් ගමනාන්ත රටවල් සමඟ දැනට පවතින අවබෝධතා ගිවිසුම් / ද්වි පාර්ශවික එකඟතා සමාලෝචනය කිරීම

පහත සඳහන් එකඟතා / අවබෝධතා ගිවිසුම් සමාලෝචනය කිරීම සම්බන්ධ තොරතුරු විදේශ කටයුතු අමාත්‍යාංශය හරහා අදාළ රාජ්‍යයන් වෙත යොමුකර ඇත.

| | |
|---|---|
| සීෂෙල්ස් රාජ්‍යය | - මිනිස්බල ක්ෂේත්‍රය |
| කුවේට් රාජ්‍යය | - කම්කරු රැකියා සහ මිනිස්බල ප්‍රවර්ධන ක්ෂේත්‍රය |
| කොරියානු ජනරජය | - රැකියා බලපත්‍ර ක්‍රමය යටතේ ශ්‍රමිකයින් පිටත් කර යැවීම හා ලබා ගැනීම |
| මැලේසියාව | - ශ්‍රමිකයින් බඳවා ගැනීම, සේවා නියුක්ත කිරීම හා නැවත ගෙන්වා ගැනීම. මෙම අවබෝධතා ගිවිසුම අත්සන් කිරීමට අදාළ අමාත්‍ය මණ්ඩල අනුමැතිය මේ වනවිට ලැබී ඇති අතර අත්සන් කිරීමට යෝජිතය |

- ඒකාබද්ධ කමිටු රැස්වීම්

ශ්‍රී ලංකාව හා එක්සත් අරාබි එමීර් රාජ්‍යය අතර ශ්‍රී ලාංකික මිනිස්බල සේවා නියුක්තිය නියාමනය කිරීමේ ගිවිසුම යටතේ වන පළමු ඒකාබද්ධ කමිටු රැස්වීම 2022 අප්‍රේල් මස 06 දින මාර්ගගත තාක්ෂණය ඔස්සේ පැවැත්විණි.

මෙම රැස්වීමේදී ශ්‍රී ලාංකික ශ්‍රමිකයින් එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ රැකියා සඳහා බඳවා ගැනීමේදී හා සේවයෙහි යෙදවීමේදී ඔවුන් මුහුණපාන ගැටලු, ශ්‍රමිකයින්ගේ අයිතීන් ආරක්ෂා කරන හා ආරවුල් විසඳන ක්‍රමවේද සහ යාන්ත්‍රණ, එක් එක් පාර්ශවයේ කාර්යභාරය සහ වගකීම් නිර්වචනය කරන දෙරටේ පෞද්ගලික ආයතන අතර බඳවා ගැනීමේ ගිවිසුමක් වර්ධනය කිරීම සඳහා සහයෝගීතා ක්‍රියාපටිපාටි, හා එක්සත් අරාබි එමීර් රාජ්‍යයහි කම්කරු ගැටලුවලට විසඳුම් ලබාදීම සඳහා ක්‍රියාත්මක කෙරෙන ක්‍රමවේදය පිළිබඳව සංක්ෂිප්ත සමාලෝචනයක්ද ගෙනහැර දක්වන ලදී.

## 2. ගෝලීය / කලාපීය සංසද

- කොළඹ ක්‍රියාදාමය

ශ්‍රී ලංකාව සභාපතිත්වය දරණ නිපුණතා සහ සුදුසුකම් හඳුනාගැනීමේ ක්‍රියාවලීන් පිළිබඳ හත්වන තේමාත්මක ක්‍රියාකාරී කණ්ඩායම් රැස්වීම සහ පකිස්ථානය සභාපතිත්වය දරන ලාභදායී, වේගවත් සහ ආරක්ෂිත ප්‍රේෂණ ප්‍රවර්ධනය කිරීම පිළිබඳ හයවන තේමාත්මක ක්‍රියාකාරී කණ්ඩායම් රැස්වීම හා ඊට සමගාමීව ධාරිතා සංවර්ධන වැඩමුළුව 2022.06.21 සිට 23 දක්වා තායිලන්තයේදී පැවැත්විණි.

සංක්‍රමණික අයිතිවාසිකම් ආරක්ෂා කරන අතරම සංක්‍රමණික ශ්‍රමිකයන්, ඔවුන්ගේ පවුල් සහ සම්භවය සහිත රටවල් සඳහා විදේශ රැකියාවල සංවර්ධන බලපෑම උපරිම කිරීමත් සමඟම ආසියාවේ සංවිධානාත්මක ශ්‍රම සංක්‍රමණයේ ප්‍රතිලාභ ප්‍රශස්ත කිරීම මෙහි අරමුණු විය.

ශ්‍රී ලංකා රජය, සභාපතිත්වය දරණ නිපුණතා සහ සුදුසුකම් පිළිගැනීමේ ක්‍රියාවලීන් පිළිබඳ හත්වන තේමාත්මක ක්‍රියාකාරී කණ්ඩායම් රැස්වීමේදී කොළඹ ක්‍රියාදාමයේ සාමාජික රටවලින් සම්භවයක් ඇති ශ්‍රමිකයන්ගේ රටවලින් පිටත රැකියා සොයන ශ්‍රමිකයන්ගේ කුසලතා මට්ටම ඉහළ නැංවීම සඳහා එහි කැපවීම් පිළිගෙන ඇත.

පකිස්ථාන රජයේ ප්‍රධානත්වයෙන් ලාභ, වේගවත් සහ ආරක්ෂිත ප්‍රේෂණ ප්‍රවර්ධනය කිරීම පිළිබඳ හයවන තේමාත්මක ක්‍රියාකාරී කණ්ඩායම් රැස්වීමේදී සංක්‍රමණික සේවකයින් සඳහා විධිමත් ප්‍රේෂණ මාර්ග සඳහා ප්‍රවේශය වැඩි දියුණු කිරීම, මූල්‍ය සේවා සඳහා ඔවුන්ගේ ප්‍රවේශය වැඩි දියුණු කිරීම සහ සංක්‍රමණික සේවකයින් හා ඔවුන්ගේ පවුල් සඳහා

ප්‍රේෂණ ඵලදායී ලෙස භාවිතා කිරීම බල ගැන්වීම සඳහා සමූහයේ අරමුණ යළි තහවුරු කරන ලදී. ඉන් අනතුරුව, කොළඹ ක්‍රියාදාමයේ සාමාජික රටවල (CPMS) නියෝජිතයින් වෙත තෝරා ගත් ශ්‍රම සංක්‍රමණය සහ පාලන ගැටලු කෙරෙහි අවධානය යොමු කළ ධාරිතාව ගොඩනැගීමේ වැඩමුළුවක් පවත්වන ලදී.

සදාචාරාත්මක බඳවා ගැනීමේ ක්‍රමවේදය වර්ධනය කිරීම පිළිබඳ කොළඹ ක්‍රියාවලියේ (CP) තේමාත්මක ක්‍රියාකාරී කණ්ඩායමේ නව වන රැස්වීම 2022.08.24 හා 25 දෙදින බංග්ලාදේශයේ ඩකා නුවරදී පැවැත්විණි. එහිදී දකුණු, නැගෙනහිර සහ අග්නිදිග ආසියාව පුරා යහපත් රැකියාවක් සහ ආරක්ෂිත සංක්‍රමණයක් සහතික කිරීම සඳහා සාධාරණ හා සදාචාරාත්මක බඳවා ගැනීම් ප්‍රවර්ධනය කිරීම සඳහා සහයෝගීතාවයේ අවශ්‍යතාවය අවධාරණය කරන ලදී. මෙම රැස්වීම අතරතුර, බඳවා ගැනීමේ කර්මාන්තය, සේවක වැටුප් ආකෘතියේ සිට සේවායෝජක වැටුප් ආකෘතියක් දක්වා පරිවර්තනය කිරීමේ ඉලක්ක තවදුරටත් ඉදිරියට ගෙන යාම සඳහා ඔවුන්ගේ සිව් අවුරුදු වැඩ සැලැස්ම, අවිධිමත් බඳවා ගැනීමේ ක්‍රියාකාරීන් නියාමන රාමු යටතේ ඇතුළත් කර ඇති බව සහතික කිරීම සහ සදාචාරාත්මක බඳවා ගැනීම් සඳහා අවශ්‍ය තොරතුරු සමඟ සංක්‍රමණික සේවකයින් සන්නද්ධ කිරීම පිළිබඳව සාමාජික රාජ්‍යයන් විසින් සාකච්ඡා කරන ලදී.

- අබුඩාබි සංවාදය

අබුඩාබි සංවාදයේ උපදේශාත්මක කමිටු රැස්වීම මාර්ගගත තාක්ෂණය ඔස්සේ 2022 අප්‍රේල් මස 05 දින පවත්වන ලද අතර ශ්‍රී ලංකාව නියෝජනය කරමින් නිලධාරීන් සහභාගී විය. එහිදී අබුඩාබි සංවාදයේ සභාපති ලෙස කටයුතු කරන පාකිස්ථානය විසින් අනුමත කරන ලද 2022-2023 වසර සඳහා 6 වන අමාත්‍ය උපදේශනයේදී හඳුනාගත් ප්‍රමුඛතා විසඳීම සඳහා යෝජිත අබුඩාබි සංවාද පර්යේෂණ වැඩසටහන පිළිබඳ සාකච්ඡා කරන ලදී. මෙම රැස්වීම ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීම පිළිබඳව සාකච්ඡා කිරීමට උපදේශක කමිටුවට අවස්ථාවක් සලසා දීමට ක්‍රියා කරයි. අබුඩාබි සංවාදයේ ජ්‍යෙෂ්ඨ නියෝජිත රැස්වීම 2022.10.18,19 දෙදින මාර්ගගත තාක්ෂණය ඔස්සේ පවත්වන ලදී.

- සුරක්ෂිත, ක්‍රමවත් හා විධිමත් විගමනය සඳහා ගෝලීය සම්මුතිය (GCM)

GCM ක්‍රියාත්මක කිරීම පිළිබඳ ජාතික සැලැස්ම සම්බන්ධයෙන් වන තාක්ෂණික කමිටු රැස්වීම 2022.02.24 දින ආශ්‍රිත අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ එක්සත් ජාතීන්ගේ සංවිධානයට අයත් ආයතනවල සහභාගීත්වයෙන් මෙම අමාත්‍යාංශයේදී පැවැත්විණි. මෙම රැස්වීමේ මූලික අරමුණ GCM වාර්ෂික වාර්තාවෙහි අඩංගු අරමුණු අතරින් වැඩි ප්‍රමුඛතාවය ලබාදිය යුතු අරමුණු හඳුනා ගැනීමයි.

මෙහි දෙවන තාක්ෂණික කමිටු රැස්වීම 2022.08.30 දින පැවති අතර එහි මූලික අරමුණ වූයේ GCM ජාතික ක්‍රියාත්මක සැලැස්ම සකස්කිරීම සඳහා ආශ්‍රිත ආයතනවලින් කැඳවන ලද නිරීක්ෂණ වලංගු කිරීමයි.
2022 මැයි මස නිව්යෝර්ක්හි GCM සහ IMRF (International Migration Review Forum) ක්‍රියාත්මක කිරීම පිළිබඳ ජාතික සැලැස්ම සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ වාර්තාව විදේශ කටයුතු අමාත්‍යාංශයට ඉදිරිපත් කරන ලදී. GCM ක්‍රියාත්මක කිරීම පිළිබඳ ආසියා-ගල්ෆ් රටවල සංවාදය (Asia-Gulf Countries Dialogue on the Implementation of the GCM) 2022 සැප්තැම්බර් 13 - 15 දක්වා දෝහා, කටාර් රාජ්‍යයේදී පවත්වන ලදී.

- ශ්‍රී ලාංකිකයින් සඳහා ආරක්ෂිත හා නිත්‍ය වූ ශ්‍රම සංක්‍රමණය - අදියර IV
“ශ්‍රී ලාංකිකයින් සඳහා ආරක්ෂිත හා නිත්‍ය වූ ශ්‍රම සංක්‍රමණය” ව්‍යාපෘතියේ හතරවන අදියර මෙම

අමාත්‍යාංශයේ මඟ පෙන්වීම යටතේ ශ්‍රී ලංකාවේ ස්විට්සර්ලන්ත තානාපති කාර්යාලයේ සහයෝගීත්වයෙන් ක්‍රියාත්මක කරනු ලැබේ. ශ්‍රී ලාංකික සංක්‍රමණික සේවකයින්ගේ සහ ඔවුන්ගේ පවුල්වල යහපැවැත්ම ශක්තිමත් කිරීම ව්‍යාපෘතියේ මූලික අරමුණයි. මෙම ව්‍යාපෘතියේ ජාතික පාර්ශවකරුවන් වශයෙන් ජාත්‍යන්තර කම්කරු සංවිධානය (ILO), අයි.ඊ.එස්.සී.ආයතනය (IESC) ක්‍රියාත්මක වන අතර දිස්ත්‍රික්ක මට්ටමේ පාර්ශවකරුවන් ලෙස අනුරාධපුරය දිස්ත්‍රික්කය තුළ SAFE ආයතනය, පුත්තලම දිස්ත්‍රික්කය තුළ VOICE ආයතනය, වවුනියාව දිස්ත්‍රික්කය තුළ FIRM ආයතනය, මහනුවර දිස්ත්‍රික්කය තුළ SAMADANA ආයතනය සහ කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ CHRCD ආයතනය කටයුතු කරයි. මෙම ව්‍යාපෘතියේ 2022 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද වැඩසටහන්වල මූල්‍ය ප්‍රගතිය මිලියන 126.12කි.

### 2.2.3 විදේශ රැකියා ක්ෂේත්‍රයේ ප්‍රවර්ධනය

- විදේශ රැකියා ඉලක්ක කර ගත් නිපුණ විදේශ රැකියා බලකායක් බිහි කිරීම

විදේශ රැකියා වෙළඳපළ සඳහා නව තාක්ෂණික දැනුම සහ කුසලතාවයන් සහිත නිපුණ ශ්‍රමිකයන් යොමු කිරීම ප්‍රධාන අරමුණ කොට ගෙන සාම්ප්‍රදායික විදෙස් ශ්‍රම වෙළඳපළ හා නව ශ්‍රම වෙළඳපළ වෙත ශ්‍රමිකයන් යැවීම සහ තවමත් ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් ග්‍රහණය කර නොගත් රටවල් සඳහා ශ්‍රමිකයන් යොමු කිරීම යන අරමුණු පෙරදැරිව විදෙස් රැකියා සඳහා යොමු වීමට අපේක්ෂිත පිරිස් හඳුනා ගැනීම විදේශ රැකියා අංශය යටතේ දිස්ත්‍රික්ක හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අනුයුක්ත කර ඇති සංවර්ධන නිලධාරීන් සිදු කරන ලදී.

එම තොරතුරු මත පදනම්ව හඳුනා ගනු ලැබූ පිරිස් ඉලක්ක කර ගනිමින් වර්තමානයේ පවතින විදේශ රැකියා අවස්ථා, ඒ සඳහා අවශ්‍ය සුදුසුකම්, වෘත්තීය පුහුණු අවශ්‍යතා, එම අවශ්‍යතා සපුරා ගැනීම සඳහා උපකාරී වන ආයතන සහ පාඨමාලා යනාදී කරුණු සම්බන්ධයෙන් මූලික දැනුවත් කිරීම් සහ මාර්ගෝපදේශ ලබාදීම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම සිදු කරන ලදී. ඒ අනුව, දිස්ත්‍රික්ක 24ක ප්‍රතිලාභීන් 3,905ක් සඳහා වැඩසටහන් 96ක් රු. 719,260.00ක වියදමකින් සිදු කර ඇත.

මෙම මූලික දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීමෙන් අනතුරුව අමාත්‍යාංශය වෙත යොමු කරන ලද තොරතුරු අනුව,

- වෘත්තීය පුහුණුව සහිත විදේශ රැකියා සඳහා යොමුවීමට කැමති පුද්ගලයින්ගේ තොරතුරු සුදුසු රැකියා වෙත යොමු කිරීම වෙනුවෙන් බලපත්‍රලාභී විදේශ රැකියා නියෝජිත ආයතන වෙත ලබා දීමට ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය වෙත යොමු කර ඇත.

- වෘත්තීය පුහුණුව අවශ්‍ය පුද්ගලයින්ගේ තොරතුරු අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ පවතින වෘත්තීය පුහුණු අධිකාරිය සහ ජාතික ආධුනිකත්ව හා පුහුණු කිරීමේ අධිකාරිය මඟින් ක්‍රියාත්මක පුහුණු වැඩසටහන් සඳහා සම්බන්ධ කර ගැනීමට යොමු කර ඇත.

මෙම දැනුවත් කිරීමේ වැඩසටහන් ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය, ජාතික තරුණ සේවා සභාව, ජාතික යොවුන් සේනාංකය සහ ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය, ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය (වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන හරහා) සහ කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව යන ආයතනවල පළාත් සහ දිස්ත්‍රික් කාර්යාලවල සහයෝගය ලබාගෙන සිදු කර ඇත. ඒ අනුව, 2022 වර්ෂය තුළදී දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මට්ටමින් රැකියා ප්‍රවර්ධන වැඩසටහන් 1,468ක් ප්‍රතිලාභීන් 36,093ක් ඉලක්ක කර ගනිමින් සිදුකර

ඇත. එම වැඩසටහන්වලට සම්බන්ධ වූ පිරිස් අතුරින් මේ වනවිටත් 3,446ක් පමණ විදේශ රැකියා සඳහා පිටත්ව ගොස් ඇති අතර, 7540ක් රැකියාගත වීමට සූදානම් ව සිටී. 2,254ක් වෘත්තීය පුහුණුව සඳහා යොමු කර ඇත.

### 2.2.4 විගමනික ශ්‍රමිකයන් සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන් ආරක්ෂා කිරීම, සුභසාධනය හා සවිබල ගැන්වීම

**1. අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරන ලද වැඩසටහන්**

- **පවුල් පසුබිම් වාර්තා නිකුත් කිරීම.**

විගමනික කාන්තාවන්ගේ බාල වයස්කාර දරුවන්ට ආරක්ෂාව සැලසීම අරමුණු කර ගනිමින් "රැකියා සඳහා විදේශගත වීමට බලාපොරොත්තු වන කාන්තාවන්ගේ බාල වයස්කාර දරුවන්ගේ රැකවරණ වැඩපිළිවෙල පිළිබඳ වාර්තා ලබාගැනීම" මැයෙන් අමාත්‍යාංශ චක්‍රලේඛ අංක 01/2022 හා 2022.07.12 දාතමින් නව චක්‍රලේඛයක් නිකුත් කරන ලදී. ඒ අනුව, 2022 වර්ෂය තුළ පවුල් පසුබිම් වාර්තා 77,444ක් සඳහා සංවර්ධන නිලධාරීන් විසින් කෙටි පණිවුඩ යොමු කර ඇත. 2022 පළමු කාර්තුවේදී වාර්තා 1,732ක්ද දෙවන කාර්තුවේදී වාර්තා 6,340ක් සඳහා නිර්දේශය ලබා දී ඇති අතර 2022 තුන්වන කාර්තුවේදී ලිපිලේඛන නිවැරදිව ලැබීම් ලෙස (DR) යොමු කිරීම් 46,199ක් ද සිව්වන කාර්තුවේ දී 23,173ක් වේ.

- **"ශ්‍රමික සුරැකුම" වැඩසටහන**

විගමනික ශ්‍රමිකයින්ගේ ආරක්ෂාව සහ සුභසාධනය ඉලක්ක කර ගනිමින් 2016 දී ආරම්භ කරන ලද මෙම වැඩසටහන යටතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් විගමනික ශ්‍රමික පවුල් ලියාපදිංචිය සිදුවේ. ලියාපදිංචි විගමනික ශ්‍රමික පවුල්වල ආර්ථික තත්ත්වය නඟා සිටුවීම අරමුණු කරගෙන "පවුල් සංවර්ධන සැලසුම්" සහ විගමනික පවුල්වල සමාජයීය අවදානම් සහගත දරුවන් ඉලක්ක කර ගනිමින් "රැකවරණ සැලසුම්" ද සකස් කර ක්‍රියාත්මක කිරීම සිදු වේ. මේ යටතේ ලියාපදිංචි වූ විගමනික ශ්‍රමික පවුල් සංඛ්‍යාව 28,606කි. (කාන්තා 23,537, පිරිමි 5,069)




**ඡායාරූපය 2.1** සවුදි අරාබියානු තානාපතිතුමා සමඟ හමුව



**ඡායාරූපය 2.2** ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ LEED+ ව්‍යාපෘතියේ ප්‍රගතිය සම්බන්ධ වාර්තාව එළිදැක්වීම

**"ශ්‍රමික සුරැකුම්" වැඩසටහන යටතේ ලියාපදිංචි පවුල් ගණන**





**ප්‍රස්තාරය 2.1** ශ්‍රමික සුරැකුම වැඩසටහන යටතේ ලියාපදිංචිය

- පවුල් සංවර්ධන සැලසුම් සහ රැකවරණ සැලසුම් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම

  ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අනුයුක්ත සංවර්ධන නිලධාරීන්ගේ අධීක්ෂණය හා මඟපෙන්වීම අනුව, ශ්‍රමික සුරැකුම වැඩසටහන යටතේ ලියාපදිංචි විගමනික පවුල් ඉලක්ක කර ගනිමින් පවුල් සංවර්ධන සැලසුම් 4,462ක් සහ රැකවරණ සැලසුම් 793ක් සකස් කර ඇත

මෙයට අමතරව විදේශ සේවා නියුක්ති කාර්යාංශය මඟින් ක්‍රියාත්මක විගමනික පවුල්වල දරුවන් සඳහා අධ්‍යාපන ශිෂ්‍යත්ව ලබාදීම, පාසල් උපකරණ ලබාදීම, නැවත පැමිණි ශ්‍රමිකයින් සඳහා ස්වයං රැකියා ණය ලබාදීම, ආබාධිත පුද්ගලයින් සඳහා ස්වයං රැකියා සහ නිවාස ණය ලබාදීම, වෘත්තීය පුහුණු වැඩසටහන් වෙත යොමු කිරීම හා වෛද්‍ය සායන පැවැත්වීම, යනාදි වැඩසටහන් වෙත යොමු කිරීම සංවර්ධන නිලධාරීන් විසින් සිදු කරයි.




**ප්‍රස්තාරය 2.2** සකස් කරන ලද පවුල් සංවර්ධන සහ රැකවරණ සැලසුම්

- **දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම**

  අමාත්‍යාංශයට අනුයුක්ත සංවර්ධන නිලධාරීන් විසින් විගමනික ප්‍රජාව ඉලක්ක කර ගනිමින් දැනුවත් කිරීමේ වැඩසටහන් ප්‍රාදේශීය මට්ටමින් ක්‍රියාත්මක කරනු ලබන අතර පහත ක්ෂේත්‍ර ඔස්සේ දිවයින පුරා දැනුවත් කිරීමේ වැඩසටහන් 5,340ක් පවත්වා ඇත.

  - සුරක්ෂිත සංක්‍රමණය
  - නැවත සමාජගත කිරීමේ වැඩසටහන
  - ස්වයං රැකියා කුසලතා සංවර්ධනය සහ වෘත්තීය මාර්ගෝපදේශ
  - ළමා ආරක්ෂාව
  - මත්ද්‍රව්‍ය නිවාරණය
  - ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් හිංසනය වැළැක්වීම සම්බන්ධ දැනුවත් බව ලබාදීම
  - මිනිස් වෙළඳාමේ ගොදුරක් නොවීම පිළිබඳ දැනුවත් කිරීම්

- **විදේශ රැකියා නිමකර හෝ කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් හෝ මෙරටට පැමිණි පුද්ගලයින් ආර්ථික හා සමාජීය වශයෙන් සවිබල ගැන්වීම**

I. 2021 වර්ෂය තුළදී විදේශ රැකියා නිමකර මෙරටට පැමිණ ස්වයං රැකියාවක හෝ වෙනත් ආදායම් උත්පාදන කටයුතුවලට යොමුවීමට අපේක්ෂිත පුද්ගලයින් දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මට්ටමින් හඳුනා ගැනීම දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අනුයුක්ත කර ඇති සංවර්ධන නිලධාරී (විදේශ රැකියා) විසින් සිදු කරන ලදී. ලැබී ඇති තොරතුරු පාදක කර ගනිමින් 2022 වර්ෂය තුළ දිස්ත්‍රික්ක 21ක ප්‍රතිලාභීන් 4,332ක් ඉලක්ක කර ගනිමින් ස්වයං රැකියා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය දැනුම ලබාදීමේ සහ ව්‍යවසායකත්ව දැනුම ලබාදීමේ පුහුණු වැඩසටහන් 228ක් දේශීය අරමුදල් යොදා ගනිමින් රු.මි. 1.55ක වියදමක් දරා සිදු කර ඇත.

මෙම පුහුණු වැඩසටහන් සඳහා සහභාගි

වූ ප්‍රතිලාභීන් අතුරින් ස්වයං රැකියා පවත්වා ගෙන යාමට උපකරණවල අවශ්‍යතාව පවතින පුද්ගලයින් 730කගේ තොරතුරු ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය වෙත, එම ආයතනය මඟින් ක්‍රියාත්මක කරන ස්වයං රැකියා සඳහා උපකරණ ලබාදීමේ වැඩසටහනට සම්බන්ධ කර ගැනීම සඳහා ඉදිරිපත් කර ඇත.

II. කොවිඩ් - 19 වසංගත තත්ත්වය හේතුවෙන් රැකියා අහිමිවූ සහ විවිධ ගැටලුවලට මුහුණදුන් විගමනික ශ්‍රමිකයින් සඳහා උපායමාර්ගික මැදිහත්කරණයක අවශ්‍යතාවය හඳුනාගනිමින් කම්කරු සහ විදේශ රැකියා අමාත්‍යාංශය විසින් විදේශ සේවා නියුක්ති කාර්යාංශය, විගමනය සඳහා වන ජාත්‍යන්තර සංවිධානය (IOM) සහ ජාත්‍යන්තර කම්කරු සංවිධානය (ILO) සමඟ ඒකාබද්ධව විගමනික ශ්‍රමිකයින් සඳහා වන ජාතික කොවිඩ් - 19 ප්‍රතිචාර සැලැස්මක් සකස් කරන ලදී. එම සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා විවිධ වූ පාර්ශවකරුවන් වෙතින් අමාත්‍යාංශය සහාය අපේක්ෂා කරන ලදී.

ඒ අනුව, සංක්‍රමණය සඳහා වූ ජාත්‍යන්තර සංවිධානය සහ ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ මැදිහත්වීමෙන් ජපන් රජයේ මූල්‍ය දායකත්වය ද සහිතව කොවිඩ් - 19 වසංගත තත්වය හේතුවෙන් සියරට පැමිණි ශ්‍රමිකයින් නැවත සමාජ ආර්ථික පුනර්ජීවය සඳහා යොමුකිරීමට සහායවීමේ වැඩසටහන් 20ක් සහිත විශේෂ ව්‍යාපෘතියක් දිස්ත්‍රික්ක 9ක ක්‍රියාත්මක කරන ලදී. මෙම වැඩසටහන් 20න් 18ක් මේ වන විට ක්‍රියාත්මක තත්වයේ ඇත. අවසන් කරන ලද ව්‍යාපෘතිවල සම්පූර්ණ වටිනාකම රුපියල් මිලියන 42.8ක් පමණ වන අතර සෙසු ව්‍යාපෘතිවල කටයුතු අවසන් අදියරයේ පවතී.

- **ස්වයං රැකියා/ ජීවනෝපාය ව්‍යාපෘතිවලට යොමුවීමට අපේක්ෂිත විගමනික පවුල්වල සාමාජිකයින් සඳහා සේවා සැපයීම**

විගමනික ශ්‍රමිකයා විසින් මෙරටට ප්‍රේෂණය කරනු ලබන මුදල් යොදවමින් ස්වයං රැකියා/ ජීවනෝපාය ව්‍යාපෘතිවල යෙදීමට අපේක්ෂිත, ඒ සඳහා තාක්ෂණික දැනුම/ මඟපෙන්වීම අවශ්‍ය "ශ්‍රමික සුරැකුම" යටතේ ලියාපදිංචි විගමනික පවුල්වල සාමාජිකයින් හඳුනා ගනු ලැබීමෙන් අනතුරුව මෙම පිරිස් ඉලක්ක කර ගනිමින් දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වන ලදී. මේ සඳහා දිස්ත්‍රික්ක 10කට අදාළව විගමනික පවුල්වල සාමාජිකයන් 1,170කගේ තොරතුරු ලැබී ඇත. එම තොරතුරු පදනම් කර ගනිමින් දිස්ත්‍රික්ක මට්ටමින්, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස ඒකාබද්ධ කරමින් සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් මෙම වර්ෂය තුළදී වැඩසටහන් 66ක් ප්‍රතිලාභීන් 1,442ක් සඳහා පවත්වා ඇත. ඒ සඳහා රු. 460,294.00ක මුදලක් වැය විය.

- **විගමනික ශ්‍රමික පවුල්වල පාසල් අධ්‍යාපනය අවසන් කර ඇති දරුවන් සඳහා කාර්මික හෝ වෘත්තීය පුහුණුව ලබාදීම සඳහා සහාය දැක්වීම**

විගමනික ශ්‍රමික පවුල්වල පාසල් අධ්‍යාපනය අවසන් කර, දේශීය/ විදේශීය රැකියාවකට යොමු වීමේ අපේක්ෂාවෙන් කාර්මික හෝ වෘත්තීය පුහුණුව ලබාග ැනීමට බලාපොරොත්තු වන හා ඒ සඳහා ආර්ථික අපහසුතා පවතින දරුවන්ට සහාය දැක්වීම වෙනුවෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් දත්ත හා තොරතුරු එක් රැස් කරන ලදී.

මේ දක්වා දිස්ත්‍රික්ක 05කට අදාළව (හම්බන්තොට, නුවරඑළිය, පුත්තලම, පොළොන්නරුව සහ රත්නපුර) දරුවන් 374කගේ තොරතුරු ලැබී ඇති අතර, අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ පවතින වෘත්තීය පුහුණු ආයතන වෙත සහ ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය වෙත එම ආයතන මඟින් ක්‍රියාත්මක පුහුණු වැඩසටහන් සඳහා එම දරුවන් ද සම්බන්ධ කර ගන්නා මෙන් දන්වා තොරතුරු යොමු කර ඇත.

## 2. ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් ක්‍රියාත්මක කරන ලද වැඩසටහන්

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය ශ්‍රී ලංකාවේ ශ්‍රම සංක්‍රමණය සඳහා වන මූලික නියාමන ආයතනය වේ. එය විදේශයන්හි රැකියා අපේක්ෂා කරන ශ්‍රී ලාංකිකයින්ගේ අභිමානය, ආරක්ෂාව සහ සමානාත්මතාවය යන කොන්දේසි යටතේ සංක්‍රමණය වීම සහතික කරන ශ්‍රම සංක්‍රමණ ක්‍රියාවලිය නියාමනය කිරීම සඳහා නීතිමය රාමුවක් යටතේ ස්ථාපිත පුළුල් විෂය පථයකින් යුත් ආයතනයකි.

විගමනික ශ්‍රමිකයන් සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින් ආරක්ෂා කිරීම හා සවි බලගැන්වීම සඳහා විදේශ රැකියා ක්‍රියාවලියේ අදියර තුනේදීම එනම්; පූර්ව විගමන අවධිය (තීරණ ගැනීම, පෙර විගමනික පුහුණුව ලැබීම සහ පිටත්ව යාම ඇතුළුව), සේවයේ යෙදෙන අවධිය (රැකියාවල නියුතු සේවකයින් සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින් ආවරණයවන පරිදි) සහ ආපසු පැමිණීමේ හා නැවත සමාජගතවීමේ අවධිය (සමාජගත කිරීම, පිළි ගැනීම සහ අගය කිරීම සැලකිල්ල යන කරුණු ඇතුලත්ව) යන අදියරවල දී ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය සිය කාර්යභාරය ඉටු කරයි. ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය සිය මෙහෙයුම් ක්‍රියාවලිය තුළින් මෙම අරමුණු සාක්ෂාත් කර ගැනීමට කටයුතු කරනු ලැබේ.

- **විගමනික ශ්‍රමිකයන් වෙනුවෙන් ක්‍රියාත්මක සුබසාධන වැඩසටහන්**

**වගුව 2.1** විගමනික ශ්‍රමිකයන් වෙනුවෙන් ක්‍රියාත්මක සුබසාධන වැඩසටහන් - ශ්‍රී.ලං.වි.සේ.නි.කා.

| | විස්තරය | සංඛ්‍යාව | මුදල (රු. මිලි.) |
|---|---|---|---|
| 01 | විගමනික ශ්‍රමිකයන් වෙනුවෙන් රක්ෂණ වාරික ගෙවීම | 338,500 | 527.04 |
| 02 | විගමනික ශ්‍රමිකයන් සඳහා රක්ෂණ වන්දි ගෙවීම් (නැවත ගෙන්වා ගැනීම්, වෛද්‍ය වියදම්, මරණ වන්දි සඳහා වන වියදම් ඇතුලත්ව) | 551 | 111.69 |
| 03 | උපකාර අවැසි විගමනික ශ්‍රමිකයන් වෙත ආහාර පාන, ප්‍රවාහන පහසුකම්, නවාතැන් හා වෛද්‍ය ප්‍රතිකාර සැපයීම | 2,983 | 2.53 |
| 04 | විවිධ අපහසුතාවයන්ට පත් වූ විගමනික ශ්‍රමිකයින් නැවත මෙරටට ගෙන්වා ගැනීම,<br>සේවක සුභසාධක අරමුදල මඟින්<br>රක්ෂණාවරණය මඟින්<br>වෙනත් මූලාශ්‍ර (රාජ්‍ය නොවන සංවිධාන) | 03<br>15<br>1,623 | 1.66 |
| 05 | සේවක සුභසාධක අරමුදල යටතේ සහන සැලසීම | 66 | 14.02 |
| 06 | පවත්වාගෙන යනු ලබන ස්වයං රැකියා වැඩිදියුණු කිරීම සඳහා ශ්‍රමිකයන් වෙත අවශ්‍ය උපකරණ / ද්‍රව්‍ය ලබා දීම (උපරිම වශයෙන් එක් අයෙකුට රුපියල් 25,000 බැගින්) | 44 | 1.07 |
| 07 | විගමනික ශ්‍රමිකයන් හා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින් හට වෛද්‍ය ප්‍රතිකාර සඳහා සහය දීම | 17 | 0.93 |
| 08 | විගමනික ශ්‍රමිකයන්ගේ දූ දරුවන් සඳහා පාසල් උපකරණ බෙදා දීම | 1,604 | 7.68 |
| 09 | විගමනික ශ්‍රමිකයන්ගේ අවශ්‍යතා ඇති දූ දරුවන් සඳහා අවශ්‍ය සහය ලබා දීම | 11 | 0.63 |

| | | | |
|---|---|---|---|
| 10 | ආබාධිත විගමනික ශ්‍රමිකයින්ගේ ආබාධිත තත්වයට ගැලපෙන පරිදි නිවාස ඉදිකිරීම / අළුත්වැඩියා කිරීම සඳහා මූල්‍ය හා තාක්ෂණික සහාය ලබාදීම | 06 | 2.24 |
| 11 | විදේශයන්හිදී මියගිය විගමනික ශ්‍රමිකයන් වෙනුවෙන් සහන ලබාදීම<br>- මෘතදේහ ගෙන්වීම සඳහා සේවක සුබසාධක අරමුදල හරහා සහාය වීම | කාර්යාංශයේ වියදමින් මෘත දේහ මෙරටට ගෙන්වීමක් සිදුකර නොමැත | |
| | - අවමංගල්‍ය කටයුතු සඳහා වියදම් දැරීම | 217 | 8.79 |
| 12 | විගමනික ශ්‍රමිකයින් සඳහා විශ්‍රාම වැටුප් ගෙවීම<br>- විශ්‍රාම වැටුප් දායකත්වය ලබා ගැනීම සඳහා අයදුම්කර ඇති විගමනික ශ්‍රමිකයින් ගණන<br>- විශ්‍රාම වැටුප් ලබාගැනීම සඳහා සුදුසුකම් ලබා ඇති විගමනික ශ්‍රමිකයින් ගණන | 3,374<br>05 | |

- **විගමනික ශ්‍රමිකයන්ගේ දූදරුවන් වෙනුවෙන් ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම**

**වගුව 2.2** විගමනික ශ්‍රමිකයන්ගේ දූදරුවන් වෙනුවෙන් ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම - ශ්‍රී.ලං.වි.සේ.නි.කාර්.

| විස්තරය | ප්‍රතිලාභ ලැබූ සිසුන් සංඛ්‍යාව | වියදම (රු. මි.) |
|---|---|---|
| 5 ශ්‍රේණිය ශිෂ්‍යත්වය සමත් සිසුන් | 21 | 0.42 |
| අ.පො.ස. සාමාන්‍ය පෙළ සමත් සිසුන් | 69 | 1.725 |
| අ.පො.ස. උසස් පෙළ සමත් සිසුන් | 32 | 1.12 |
| **එකතුව** | **122** | **3.265** |

- **පුහුණු වැඩසටහන් පැවැත්වීම**

**වගුව 2.3** පුහුණු වැඩසටහන් පැවැත්වීම - ශ්‍රී.ලං.වි.සේ.නි.කාර්.

| වැඩසටහන | පැවැත් වූ වැඩසටහන් සංඛ්‍යාව | පුද්ගලයින් සංඛ්‍යාව |
|---|---|---|
| ගෘහස්ථ අංශයේ ගෘහපාලක සහායක පුහුණුව - මැද පෙරදිග | 556 | 27,923 |
| නැගෙනහිර ආසියාතික සහ යුරෝපා රටවල් සඳහා ගෘහස්ථ අංශයේ ගෘහපාලක සහායක පුහුණුව | 37 | 1,426 |
| සාත්තු සේවක පුහුණුව (ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම III) | 74 | 4,497 |
| ගෘහස්ථ අංශයේ ගෘහපාලන පුහුණු වැඩසටහන (IFE) | 57 | 1,398 |
| ගෘහස්ථ නොවන රැකියා සඳහා පිටත්ව යන ශ්‍රමිකයින් සඳහා වූ පුහුණුව | 1,621 | 46,051 |
| පෙර විගමනික පුහුණුව - දකුණු කොරියාව | 44 | 1,468 |
| පෙර විගමනික පුහුණු පාඨමාලාව - ජපන් තාක්ෂණික සේවාස්ථ පුහුණු පාඨමාලාව | 6 | 50 |

| | | |
|---|---|---|
| විශේෂ භාෂා පුහුණුව (ජපන්) | 88 | 3,488 |
| විශේෂ භාෂා පුහුණුව (ඉංග්‍රීසි) | 42 | 1,978 |

- **විගමනික ශ්‍රමිකයින්ට තම පැමිණිලි කාර්යාංශය වෙත ඉදිරිපත් කිරීම හා ඒ පිළිබඳ ප්‍රගතිය පරීක්ෂා කිරීම ඇතුළු පහසුකම් සැලැස්වීම සඳහා ජංගම දුරකථන මෘදුකාංගයක් හඳුන්වා දීම.**

### 2.2.5 විදේශ රැකියා ක්ෂේත්‍රයේ පාලනය හා නියාමනය

**වගුව 2.4** විදේශ රැකියා නියෝජිත ආයතන සඳහා බලපත් නිකුත් කිරීම්, විදේශ රැකියා ඇණවුම් අනුමත කිරීම් සහ විදේශ රැකියා සඳහා ලියාපදිංචි කිරීම්

| | විස්තරය | සංඛ්‍යාව |
|---|---|---|
| විදේශ රැකියා නියෝජිත ආයතන සඳහා බලපත්‍ර නිකුත් කිරීම | නිකුත් කරන ලද නව බලපත්‍ර සංඛ්‍යාව | 111 |
| | අලුත් කරන ලද බලපත්‍ර සංඛ්‍යාව (වාර්ෂික අලුත්කිරීම්) | 1,269 |
| ශ්‍රී ලාංකිකයින් බඳවා ගන්නා විදේශයන්හි පිහිටි රැකියා නියෝජිත ආයතන සහ සමාගම් කාර්යාංශයේ ලියාපදිංචි කිරීම අළුත් කිරීම | ලියාපදිංචි කළ/ අළුත් කළ විදේශීය රැකියා නියෝජිත ආයතන/ සමාගම් සංඛ්‍යාව (සත්කාරක රටවල) | 1,324 |
| විදේශ රැකියා නියෝජිත ආයතන විසින් ඉදිරිපත් කරනු ලබන විදේශ රැකියා ඇණවුම් සහ දැන්වීම් සඳහා අනුමැතිය ලබාදීම | අනුමත කරන ලද රැකියා ඇණවුම් සංඛ්‍යාව | 3,146 |
| | අනුමත කරන ලද දැන්වීම් ඇණවුම් සංඛ්‍යාව | 1,004 |
| විදේශ රැකියා සඳහා ලියාපංදිංචි කිරීම් | බලපත්‍රලාභී විදේශ රැකියා නියෝජිත ආයතන මගින් විදේශ රැකියා ඇබෑර්තු සඳහා ශ්‍රී ලාංකිකයින් බඳවා ගෙන විදේශගත කිරීම සඳහා ලබාදුන් අනුමැති සංඛ්‍යාව | 122,146 |
| | පුද්ගලික මාර්ගයෙන් විදේශ රැකියා සඳහා පිටත්ව යෑමට ලියාපදිංචි වූ විගමනික ශ්‍රමිකයන් සංඛ්‍යාව | 101,713 |
| | ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය හරහා දකුණු කොරියාව, ජපානය හා ඊශ්‍රායලය යන රටවල් සඳහා ලියාපදිංචි වූ විගමනික ශ්‍රමිකයන් සංඛ්‍යාව | 6,998 |
| | පුද්ගලික මාර්ගයෙන් විදේශ රැකියා සඳහා ලියාපදිංචිය අළුත් කළ විගමනික ශ්‍රමිකයන් සංඛ්‍යාව | 72,449 |
| | විදේශයන්හි පිහිටි දූත මණ්ඩල කාර්යාල හරහා ලියාපදිංචි වූ විගමනික ශ්‍රමිකයන් සංඛ්‍යාව | 3,470 |
| | විදේශයන්හි පිහිටි දූත මණ්ඩල කාර්යාල හරහා ලියාපදිංචිය අළුත් කළ විගමනික ශ්‍රමිකයන් සංඛ්‍යාව | 6,068 |

| වගුව 2.5 | විදේශ රැකියා සඳහා බඳවා ගැනීම් සම්බන්ධව බලපත්‍රලාභී නියෝජිත ආයතන/ බලපත්‍රලාභී නොවන වෙනත් පාර්ශවවලට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීම |
|---|---|

| විස්තරය | සංඛ්‍යාව |
|---|---|
| සිදුකළ පැමිණිලි පරීක්ෂණ සංඛ්‍යාව | 1,336 |
| විසඳන ලද පැමිණිලි පරීක්ෂණ සංඛ්‍යාව | 921 |
| නීති විරෝධී බඳවා ගැනිම් සම්බන්ධව සාර්ථකව සිදුකරන ලද වැටලීම් සංඛ්‍යාව | 25 |
| නීතිය උල්ලංඝනය කරන ලද බලපත්‍රලාභී/ බලපත්‍රලාභී නොවන පාර්ශවයන්ට එරෙහිව අධිකරණයේ ගොනු කළ නඩු සංඛ්‍යාව | 137 |
| නීතිය උල්ලංඝනය කරන ලද බලපත්‍රලාභී/ බලපත්‍රලාභී නොවන පාර්ශවයන්ට එරෙහිව අධිකරණයේ/ කම්කරු විනිශ්චය සභාවේ පැවරූ නඩු සඳහා පෙනී සිටි වාර සංඛ්‍යාව | 4,121 |

### 2.2.6 විදේශ රැකියා ක්ෂේත්‍රයේ ප්‍රවර්ධනය

**1. අන්තර්ජාලගත රැකියා බැංකුවෙහි ලියාපදිංචි වීම**

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය මගින් පවත්වාගෙන යනු ලබන අන්තර්ජාලගත රැකියා බැංකුවෙහි විදේශ රැකියා අපේක්ෂිකයින්ට කාර්යාංශයේ වෙබ් අඩවිය හරහා පුද්ගලිකවම ලියාපදිංචි විය හැක. ප්‍රධාන කාර්යාලය සහ පළාත් කාර්යාල මගින් ද ලියාපදිංචි විය හැක. තම අයදුම්පත රැකියා බැංකුවට යොමු කළ දින සිට උපරිම වසර 2ක කාලයක් සඳහා එය වලංගු වේ. මෙම රැකියා බැංකුව හරහා විදේශ රැකියා යෝජකයින් හට හා බලපත්‍රලාභී රැකියා නියෝජිත ආයතනවලට විදේශ රැකියා අපේක්ෂකයින් සොයා ගැනීමට පහසුකම් සැලසේ.

| වගුව 2.6 | රැකියා බැංකුව හරහා රැකියා අපේක්ෂකයින් ලියාපදිංචි කිරීම - ශ්‍රී.ලං.වි.සේ.නි.කාර්. |
|---|---|

| විස්තරය | සංඛ්‍යාව |
|---|---|
| ලියාපදිංචි වූ රැකියා අපේක්ෂකයන් සංඛ්‍යාව | 41,568 |
| ලියාපදිංචි වූ රැකියා අපේක්ෂකයන් අතුරින් රැකියා සඳහා විදේශගත වූ ප්‍රමාණය | 5,881 |

**2. ශ්‍රී ලාංකිකයින් වැඩි වශයෙන් විදේශ රැකියා නියුක්තිය ප්‍රවර්ධනය කිරීම සඳහා බලපත්‍රලාභී විදේශ රැකියා නියෝජිතායතනවල සහභාගිත්වයෙන් යුතුව දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මට්ටමේ විදේශ රැකියා පොළ වැඩසටහන් පැවැත්වීම**

**3. නීත්‍යානුකූල හා සුරක්ෂිත අයුරින් විදේශ රැකියා සඳහා යොමුවිය හැකි ආකාරය පිළිබඳව විදේශ රැකියා අපේක්ෂකයින් දැනුවත් කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාල, වෘත්තීය පුහුණු ආයතන, කාර්මික විද්‍යාල වැනි ආයතනවල සහයෝගයෙන් විදේශ රැකියා අපේක්ෂකයින් හා වෘත්තීය පුහුණුලාභීන් දැනුවත් කිරීම කාර්යාංශයේ පළාත් කාර්යාල මඟින් සිදු කෙරේ**

**4. විවිධ විදේශ රැකියා ප්‍රවර්ධන වැඩසටහන්වලදී හඳුනාගනු ලබන විදේශ රැකියා අපේක්ෂකයින්ට, බලපත්‍රලාභී විදේශ රැකියා ආයතනවලට ලැබී ඇති විදේශ රැකියා අවස්ථා සඳහා යොමුවීම පහසු කිරීම සඳහා ප්‍රාදේශීය හා දිස්ත්‍රික් මට්ටමෙන් සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම සංවිධානය කිරීම කාර්යාංශයේ පළාත් කාර්යාල මගින් සිදු කෙරේ**

5. **ඉහළ ශ්‍රමික ඉපයීම් අවස්ථා ඇති රටවල ශ්‍රී ලාංකිකයින්ට රැකියා ලබාගැනීම සඳහා ගිවිසුම්වලට එළඹීම (උදා: දකුණු කොරියාව, ජපානය, ඊශ්‍රායලය)**

6. **බලපත්‍රලාභී විදේශ රැකියා නියෝජිතායතන මඟින් විදේශ රැකියා අපේක්ෂකයින් රැකියාවලට බඳවා ගැනීමේ සහ ස්වයං මාර්ගයෙන් විදේශ රැකියා සඳහා ලියාපදිංචි කිරීමේ ක්‍රියාපටිපාටි සරල කිරීම**

7. **ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය හා ආගමන විගමන දෙපාර්තමේන්තුව එක්ව විදේශ රැකියා සඳහා පිටත්ව යන ශ්‍රමිකයින්ට කඩිනමින් විදේශ ගමන් බලපත්‍ර ලබා ගැනීම සඳහා විශේෂ කවුළුවක් ආගමන විගමන දෙපාර්තමේන්තුවේදී ස්ථාපිත කිරීම**

### 2.2.7 කාර්මික සාමය සුරක්ෂිත කිරීම මඟින් ආර්ථික සංවර්ධනය වේගවත් කිරීම

අන්තර්ජාතිකව තරඟකාරී ආර්ථිකයක් සඳහා කල්පවත්නා කාර්මික සාමයක් සහිත රටක් නිර්මාණය කිරීම සඳහා දායකත්වය සැපයීම **කම්කරු දෙපාර්තමේන්තුවෙහි** දැක්ම වන හෙයින් කාර්මික සාමය පවත්වා ගැනීම කම්කරු දෙපාර්තමේන්තුවේ මූලික හා අත්‍යවශ්‍ය කාර්යය වේ.

මූලික වශයෙන් සේව්‍ය සේවක දෙපාර්ශවය අතර කතිකාවක් පවත්වාගෙන යාම, ඒකාබද්ධ ශ්‍රමික පරීක්ෂණ සිදු කිරීම, ව්‍යවස්ථාපිත හිමිකම් අහිමිවීම් පිළිබඳ පැමිණිලි විසඳීම සහ කාර්මික ආරවුල් නිරවුල් කිරීම, ශ්‍රමිකයන්ගේ වෘත්තීය අයිතිවාසිකම් සුරැකීම සඳහා අධිකරණ ක්‍රියාමාර්ග ගැනීම යන ප්‍රධාන කාර්යයන් හතර යටතේ කම්කරු දෙපාර්තමේන්තුව ක්‍රියාත්මක වේ.

1. **සේව්‍ය සේවක දෙපාර්ශවය අතර කතිකාවතක් පවත්වා ගැනීම**

පෞද්ගලික හා අර්ධ රාජ්‍ය අංශයේ ආයතනවල සේව්‍ය සේවක දෙපාර්ශවය අතර කාර්මික සාමය තහවුරු කෙරෙන වැඩ පරිසරයක් නිර්මාණය කිරීම උදෙසා එම අංශයේ ආයතනවල සේව්‍ය සේවක දෙපාර්ශවයම කම්කරු නීති පිළිබඳ දැනුවත් කිරීම සඳහා වැඩසටහන් මෙන්ම රාජකාරි කටයුතු සිදු කිරීමේදී කම්කරු නීති පිළිබඳව දැනුවත්භාවයක් ලැබිය යුතු අනෙකුත් රාජ්‍ය ආයතනවල නිලධාරීන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන්ද දෙපාර්තමේන්තුව විසින් සංවිධානය කොට පවත්වන ලදී.


**වගුව 2.7** 2022.01.01 දින සිට 2022.12.31 දින දක්වා සිදු කරන ලද දැනුවත් කිරීමේ වැඩසටහන් - කම්කරු දෙපා.

| වැඩසටහනෙහි ස්වභාවය | වැඩසටහනෙහි නම | පැවැත්වූ වැඩසටහන් සංඛ්‍යාව | ප්‍රතිලාභීන් සංඛ්‍යාව |
|---|---|---|---|
| සමාජ කතිකාව ප්‍රවර්ධනය | මානව සම්පත් සංවර්ධන අංශය විසින් පැවැත්වූ සමාජ කතිකා ප්‍රවර්ධන වැඩසටහන් | 167 | 9,489 |
| | දිස්ත්‍රික් හා උප කම්කරු කාර්යාල විසින් පැවැත්වූ සමාජ කතිකා ප්‍රවර්ධන වැඩසටහන් | 51 | 1,904 |
| | කලාප සමාජ වේදිකා වැඩසටහන් (Zoom තාක්ෂණය මඟින්) | 11 | 1,100 (දළ වශයෙන්) |
| කර්මාන්තමය සුරක්ෂිතතාවය ප්‍රවර්ධනය | දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු කාර්යාල මඟින් ප්‍රාදේශීයව පැවැත්වූ දැනුවත් කිරීමේ වැඩසටහන් සහ දේශන | 107 | 4,370 |

| | | | |
|---|---|---|---|
| වෘත්තීය සෞඛ්‍යය ප්‍රවර්ධනය | වෘත්තීය ස්වස්ථතා අංශය විසින් පැවැත්වූ සේව්‍යයන්, සේවකයන් හා වෛද්‍ය සිසුන් සඳහා වූ අධ්‍යාපනික, පුහුණු හා දැනුවත් කිරීමේ වැඩසටහන් | 289 | 2,380 |
| ස්ත්‍රීන් සහ තරුණ අයගේ වෘත්තීය අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සහ ළමා ශ්‍රමය පිටු දැකීම | පෞද්ගලික අංශයේ කාන්තා සේවිකාවන් සඳහා කාන්තාවන් හා ළමයින් සම්බන්ධ කම්කරු නීති සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ වැඩසටහන් | 16 | 716 |
| | ළමා ශ්‍රමය සම්බන්ධව පරිවාස නිලධාරීන්, කම්කරු නිලධාරීන් සහ පොලිස් නිලධාරීන් සම්බන්ධීකරණය කිරීමේ වැඩසටහන | 04 | 180 |
| | ළමා ශ්‍රමය සම්බන්ධව දිස්ත්‍රික් කාර්යාල මට්ටමින් සියලුම ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ළමා සංවර්ධන නිලධාරීන්, ළමා සමාජවල නිලධාරීන්, ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරීන්, පාසල් ළමා ආරක්ෂක කමිටු නිලධාරීන්, තරුණ සේවා, ප්‍රජා සංවර්ධන නිලධාරීන් සහ ග්‍රාම නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන් | 52 | 2,600 |
| **එකතුව** | | **697** | **21,639** |

## 2. පරීක්ෂණ සිදු කිරීම

සේවා ස්ථානයන්හිදී සේවකයන්ගේ ව්‍යවස්ථාපිත හිමිකම් ආරක්ෂා කිරීම සඳහා පනවා ඇති නීති හා රෙගුලාසි නිසි පරිදි ක්‍රියාත්මක වේද යන්න පරීක්ෂාවට ලක් කර, අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සහ සේව්‍ය සේවක දෙපාර්ශවය අතර ගැටලු ඇති වීම පාලනය කර සුහද සම්බන්ධතාවයක් ඇති කිරීම උදෙසා 2022 වර්ෂය තුළ සිදු කළ පරීක්ෂණ පිළිබඳ තොරතුරු පහත පරිදි වේ.





**රූපසටහන 2.1** 2022 වර්ෂය තුළ සිදු කළ කම්කරු පරීක්ෂණ

දිස්ත්‍රික් හා උප කම්කරු කාර්යාලයන්හි කම්කරු නිලධාරීන් විසින් පරීක්ෂණ සිදු කිරීමෙන් අනතුරුව ලබා දෙන කම්කරු පරීක්ෂණ වාර්තාවන් මඟින් ලබා දෙන තොරතුරු වඩාත් සවිස්තරාත්මකව ලබා ගැනීම සහ ඒවායේ ගුණාත්මකභාවය වර්ධනය කිරීමේ අරමුණින් ඒකාබද්ධ ශ්‍රමික පරීක්ෂණ වාර්තාව සංශෝධනයට අවශ්‍ය කටයුතු ද 2022 වර්ෂයේදී සිදු කරන ලදී. සංශෝධිත ආකෘති ප්‍රමාණවත් පරිදි මුද්‍රණය කර ගැනීමෙන් අනතුරුව 2023 වර්ෂයේ සිට පරීක්ෂණ කටයුතු සඳහා භාවිතා කිරීමට අපේක්ෂිතය.

## 3. ව්‍යවස්ථාපිත හිමිකම් උල්ලංඝනය වීම් පිළිබඳ පැමිණිලි විසඳීම සහ කාර්මික ආරවුල් නිරවුල් කිරීම


කම්කරු දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය වෙත සහ දිස්ත්‍රික් හා උපකාර්යාල වෙත සේවකයන් හෝ වෘත්තීය සමිති විසින් සිදු කරනු ලැබූ ව්‍යවස්ථාපිත නීති උල්ලංඝනය වීම් පිළිබඳව සහ කාර්මික ආරවුල් සම්බන්ධයෙන් ලද පැමිණිලි විසඳීමට කටයුතු කරන ලදී. එසේම, දෙපාර්තමේන්තුවේ අංශයක් හෝ කම්කරු කාර්යාලයක් විසින් සිදු කරන ලද පැමිණිලි විමර්ශනයක් හෝ ආයතන පරීක්ෂණයක් සම්බන්ධයෙන් සෑහීමට පත් නොවන අයකු විසින් විධිමත් පරීක්ෂණයක් ලබාගනු පිණිස කම්කරු කොමසාරිස් ජනරාල් වෙත කරනු ලබන ඉල්ලීම් අවශ්‍යතාවය පරිදි නැවත විමර්ශනය කිරීමද සිදු කරන ලදී.

**2018 සිට 2022 දක්වා ව්‍යවස්ථාපිත හිමිකම් කඩවීම් පිළිබඳ පැමිණිලි ලැබීම හා විසඳීම**




**ප්‍රස්තාරය 2.3** 2018 සිට 2022 දක්වා ව්‍යවස්ථාපිත හිමිකම් කඩවීම් පිළිබඳ පැමිණිලි ලැබීම් හා විසඳීම්

සටහන - වර්ෂය තුළ විසඳූ පැමිණිලිවල අදාළ වර්ෂය තුළ ලද පැමිණිලි විසඳීම් සහ පෙර වර්ෂයන් තුළ ලැබී නොවිසඳී තිබූ පැමිණිලි විසඳීම් ඇතුළත්ය.




**ප්‍රස්තාරය 2.4** 2018 සිට 2022 දක්වා කාර්මික ආරවුල් පිළිබඳ පැමිණිලි ලැබීම් හා විසඳීම්

සටහන - වර්ෂය තුළ විසඳූ පැමිණිලිවල අදාල වර්ෂය තුළ ලද පැමිණිලි විසඳීම් සහ පෙර වර්ෂයන් තුළ ලැබී නොවිසඳී තිබූ පැමිණිලි විසඳීම් ඇතුලත්ය.

ඉහත ප්‍රස්තාර අනුව කාර්මික ආරවුල් සහ ව්‍යවස්ථාපිත හිමිකම් කඩවීම් පිළිබඳ පැමිණිලි ලැබීමේ අඩුවන ප්‍රවණතාවයක් පෙන්නුම් කෙරේ. කම්කරු දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලද විවිධ දැනුවත් කිරීමේ වැඩසටහන් ප්‍රමාණාත්මකව හා ගුණාත්මකව වර්ධනය කිරීම හේතුවෙන් සේව්‍ය සේවක දෙපාර්ශවය අතර සමාජ කතිකාව වර්ධනය වීම මෙසේ ආරවුල් සංඛ්‍යාව සහ පැමිණිලි ලැබීම් අඩුවීමට හේතුවී ඇති බව නිරීක්ෂණය වේ.

සියලු කාර්යාලයන් සහ අංශයන් විසින් පැමිණිලි විසඳීමේ ක්‍රියාවලිය ක්‍රමානුකූල කිරීම සඳහා කම්කරු දෙපාර්තමේන්තුවට ලැබෙන පැමිණිලි / පෙත්සම් විසඳීම සඳහා සම්මත කාර්ය පරිපාටියක් (Standard Operating Procedure (SOP) in settlement / resolution of labour complaints / disputes) සකස් කරන ලදී. 2021 නොවැම්බර් මස සිට සියලු කම්කරු කාර්යාලයන් විසින් මෙම පරිපාටිය භාවිතා කරමින් පැමිණිලි කඩිනමින් විසඳීමට කටයුතු කරනු ලැබේ.

## 4. වැඩ වර්ජනවලදී අදාළ මැදිහත්වීම් සිදු කිරීම

කාර්මික ආරවුලක් වැඩ වර්ජනයක් දක්වා වර්ධනය විය හැකි තත්ත්වයන් නිරීක්ෂණය වූ වහාම දෙපාර්තමේන්තු නිලධරයන් විසින් එම තත්ත්වය පාලනය කිරීමට කටයුතු කරන අතර, වැඩ වර්ජනයක් ඇති වුවහොත් ඒ සඳහා අවශ්‍ය මැදිහත්වීම් සිදු කර විසඳීමට කටයුතු කරනු ලැබේ. 2022 වර්ෂය තුළ වාර්තා වූ වැඩ වර්ජන පිළිබඳ තොරතුරු පහත පරිදි වේ.




**රූපසටහන 2.2** 2022 වර්ෂය තුළ වාර්තා වූ වැඩ වර්ජන පිළිබඳ තොරතුරු

### 5. සාමූහික ගිවිසුම් සඳහා සේවා - සේවක දෙපාර්ශවය පෙළඹවීම

කාර්මික ආරවුල් නිරවුල් කිරීමේදී සාමූහික ගිවිසුම්වලට එළඹීම මඟින් සේව්‍ය සේවක දෙපාර්ශවය වෙත වඩා ස්ථිර විසඳුමක් ලැබීම මෙන්ම කම්කරු නීතිරීතිවලින් ලබාදී ඇති අයිතිවාසිකම්වලට වඩා වැඩි වරප්‍රසාද ලබා ගැනීමට හැකියාවද ලැබේ. එබැවින්, සාමූහික ගිවිසුම් සඳහා සමාජ කතිකාවත තුළින් පෙළඹවීමක් සිදුකිරීමට දෙපාර්තමේන්තුව විසින් නිරන්තරයෙන් උත්සාහ ගනු ලැබේ. ඒ අනුව, 2022 වර්ෂය තුළදී ගැසට් පත්‍රයේ පළ කරන ලද සාමූහික ගිවිසුම් 23 ද ඇතුළුව 2022.12.31 දිනට ක්‍රියාත්මකව පවතින සාමූහික ගිවිසුම් සංඛ්‍යාව 194කි.

### 6. බේරුම්කරණ කටයුතු සිදු කිරීම

ප්‍රාදේශීය කාර්යාල මඟින් හෝ ප්‍රධාන කාර්යාලයේ කාර්මික සම්බන්ධතා අංශය මඟින් කටයුතු කළ ද නිරවුල් කළ නොහැකි වූ කාර්මික ආරවුල්, අනිවාර්ය බේරුම්කරණය වෙත හෝ කාර්මික අධිකරණය වෙත යොමු කිරීම සිදු කරනු ලබන අතර 2022 වර්ෂය තුළදී අනිවාර්ය බේරුම්කරණය වෙත යොමු කිරීම් 93ක්ද ප්‍රදාන ලබාදීම් 93ක්ද සිදු කර ඇත.

### 7. වෘත්තීය සමිති ලියාපදිංචි කිරීම

සෑම වෘත්තීය සමිතියක්ම කම්කරු දෙපාර්තමේන්තුවේ වෘත්තීය සමිති රෙජිස්ට්‍රාර් වෙත ලියාපදිංචි වීම අනිවාර්ය කටයුත්තකි. ඒ අනුව, 2022 වර්ෂය තුළදී දෙපාර්තමේන්තුවෙහි ලියාපදිංචි කරන ලද වෘත්තීය සමිති සංඛ්‍යාව 143කි. 2022.12.31 දිනට වලංගු මුළු වෘත්තීය සමිති සංඛ්‍යාව 2,053කි.

## 2.2.8 ශ්‍රම ප්‍රමිතීන් ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය කිරීම

පෞද්ගලික අංශයේ සේවා නියුක්තයන්ගේ රැකියා සුරක්ෂිතභාවය හා සුභසාධනය කෙරෙහි බලපාන්නා වූ වැටුප්, සේවා තත්ත්වයන් හා කොන්දේසි පිළිබඳව ප්‍රමිතීන් සකස් කිරීම, යාවත්කාලීන කිරීම හා ඒවාට නෛතික තත්ත්වය ලබාදීම කම්කරු දෙපාර්තමේන්තුවේ ප්‍රමුඛ කාර්යභාරයක් වේ. ඒ අනුව, 2022 වර්ෂය තුලදී පහත ක්‍රියාකාරකම් සිදු කරන ලදී.


### 1. පඩිපාලක සභාවල අවම වැටුප් යාවත්කාලීන කිරීම.

**වගුව 2.8** පඩිපාලක සභාවල අවම වැටුප් යාවත්කාලීන කිරීම - කම්කරු දෙපා.

| අ.අ. | පඩිපාලක සභාව | පළමු රැස්වීම පවත්වා ඇත | විරෝධතා කැඳවා ඇත | වැටුප් සංශෝධනය කර ඇත |
|---|---|---|---|---|
| 01. | ගොඩනැගිලි කර්මාන්තය | | ✓ | |
| 02. | බේකරි කර්මාන්තය | | | ✓ |
| 03. | ගුදරි කොහු හා ඇට කෙඳි කොහු පිටරට යැවීමේ කර්මාන්තය | | | ✓ |
| 04. | ඇඳුම් සෑදීමේ කර්මාන්තය | | ✓ | |
| 05. | හොසියරි (මේස් භාණ්ඩ) සෑදීමේ කර්මාන්තය | ✓ | | |
| 06. | පිඟන් භාණ්ඩ නිෂ්පාදන කර්මාන්තය | | ✓ | |
| 07. | ගල් කොරි හා කළුගල් කැඩීමේ කර්මාන්තය | | ✓ | |
| 08. | කුරුඳු කර්මාන්තය | | ✓ | |
| 09. | මෝටර් රථ ගමනාගමන කර්මාන්තය | | ✓ | |
| 10. | සිනමා කර්මාන්තය | | ✓ | |
| 11. | නාවික ප්‍රවාහන හා මෙහෙයුම් සේවා කර්මාන්තය | | | ✓ |


| | | පළමු රැස්වීම පවත්වා ඇත | විරෝධතා කැඳවා ඇත | වැටුප් සංශෝධනය කර ඇත |
|---|---|---|---|---|
| 12. | බතික් කර්මාන්තය | | | ✓ |
| 13. | පෙර පාසල් කර්මාන්තය | | | ✓ |
| 14. | බීඩී සෑදීමේ කර්මාන්තය | | | ✓ |
| 15. | මල් විසිතුරු පැල එළවළු හා පළතුරු වගා කිරීමේ හා අපනයනය කිරීමේ කර්මාන්තය | | | ✓ |

**2. දින 05 වැඩ සතිය සඳහා අනුමැතිය ලබා දීම**





**රූපසටහන 2.3** දින 05 වැඩසතිය සඳහා අනුමැතිය ලබා දීම

**3. සාමූහික ගිවිසුම්වල නීතිමය වලංගුභාවය පරීක්ෂා කිරීම්**





**රූපසටහන 2.4** සාමූහික ගිවිසුම්වල නීතිමය වලංගුතාවය පරීක්ෂා කිරීම

**4. පඩි පාලක සභා අඟදාපනත හා සාප්පු හා කාර්යාල සේවක පනත යටතේ වැටුපෙන් අඩු කිරීම් සඳහා ලැබෙන ඉල්ලීම් සඳහා අනුමැතිය ලබා දීම**





**රූපසටහන 2.5** වැටුපෙන් අඩු කිරීම් සඳහා ලැබෙන ඉල්ලීම්වලට අනුමැතිය ලබා දීම

5. **පඩි පාලක සභා ආඥා පනත හා සාප්පු හා කාර්යාල සේවක පනත යටතේ දඩ අරමුදල් පිහිටුවීම සඳහා ලැබෙන ඉල්ලීම් සඳහා අනුමැතිය ලබා දීම**




**රූපසටහන 2.6** දඩ අරමුදල් පිහිටුවීම සඳහා ලැබෙන ඉල්ලීම්වලට අනුමැතිය ලබා දීම

6. **අණ පනත් පිලිබඳව මහජනතාව හා විවිධ ආයතන මඟින් කරනු ලබන විමසීම්වලට පැහැදිළි කිරීම් හා අර්ථ නිරූපණ ඉදිරිපත් කිරීම**




**රූපසටහන 2.7** අණපනත් සම්බන්ධව විමසීම්වලට පැහැදිලි කිරීම් ලබා දීම

### 2.2.9 සේවකයාගේ වෘත්තීය සුරක්ෂිතතාවය සඳහා වූ සුනිසි වැඩ පරිසරය තහවුරු කිරීම

කර්මාන්තශාලා තුළ සේවයෙහි යෙදෙන ශ්‍රමිකයන් හට භෞතිකමය වශයෙන් යම් ශාරීරික හානි සිදුවීම්, විදුලිය, තාපය, වායු පීඩනය, අධික ආලෝකය හා ශබ්දය මඟින් ශාරීරික හානි හෝ මරණය පවා සිදුවීමේ අවදානමක් පවතී. එබැවින්, අනතුරු ඇති වීම අවම කිරීම කම්කරු දෙපාර්තමේන්තුවේ වගකීමක් වේ. ශ්‍රී ලංකාවේ කර්මාන්තශාලාවල සේවය කරන සේවක සේවිකාවන්ගේ වෘත්තීය සුරක්ෂිතතාවය, සෞඛ්‍ය හා සුභසාධනයට අදාළ ප්‍රධානම නීතිමය ප්‍රතිපාදනයක් වනුයේ වර්ෂ 1942 අංක 45 දරණ කර්මාන්තශාලා ආඥා පනත හා ඒ යටතේ පනවා ඇති රෙගුලාසින්ය.

අනතුරු රහිත වැඩ පරිසරය තහවුරු කිරීම සඳහා කම්කරු දෙපාර්තමේන්තුව විසින් ප්‍රධාන වශයෙන් පහත ක්‍රියාකාරකම් සිදු කරන ලදී.

## 2022.01.01 සිට 2022.12.31 දක්වා කාලය තුළ ඉටු කළ ක්‍රියාකාරකම්



2022 වර්ෂය තුළ අළුතින් ආරම්භ කරන ලද කර්මාන්තශාලා සංඛ්‍යාව = 881

2022.12.31 දිනට පවත්වාගෙන යනු ලබන මුළු කර්මාන්තශාලා සංඛ්‍යාව = 33,056

(2022 වර්ෂය තුළ නව රෙගුලාසි අනුව කර්මාන්තශාලා 1261ක් ලියාපදිංචි කරන ලද අතර 2022.12.31 දිනට නව රෙගුලාසි අනුව ලියාපදිංචි වී ඇති මුළු කර්මාන්තශාලා සංඛ්‍යාව 3222කි)




පරීක්ෂා කර අනුමත කළ ගොඩනැගිලි පිඹුරුපත් සංඛ්‍යාව = 275



පරීක්ෂා කළ කර්මාන්තශාලා සංඛ්‍යාව = 3,274



වාර්තා වී ඇති මරණීය අනතුරු සංඛ්‍යාව = 66

වාර්තා වී ඇති මරණීය නොවන අනතුරු සංඛ්‍යාව = 1,260



අධිඅන්තරායදායී යන්ත්‍ර පරීක්ෂාව නියාමනය කිරීම් සංඛ්‍යාව = 11,669

**රූපසටහන 2.8** කර්මාන්තශාලා පරීක්ෂණ කටයුතු - 2022

### 2.2.10 සේවකයාගේ වෘත්තීය සෞඛ්‍යාරක්ෂිත බව තහවුරු කිරීම සඳහා සිදු කරන ලද ක්‍රියාකාරකම්

සේවා ස්ථානයන්හි සෞඛ්‍යාරක්ෂිත බව තහවුරු කිරීම සඳහා සේවා ස්ථානවල සෞඛ්‍ය ගැටලු හෝ අනතුරු සිදුවීමට හැකි අවස්ථා තිබේද යන්න විද්‍යාත්මක ක්‍රමවේදයන් යටතේ සොයාබැලීම සහ එම අනතුරු වැළැක්වීම සඳහා පියවර ගැනීම හා වලක්වා ගැනීමට ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳ දැනුවත් කිරීම කම්කරු දෙපාර්තමේන්තුව සතු වගකීමකි. ඒ අනුව,

2022.01.01 දින සිට 2022.12.31 දින දක්වා පහත ක්‍රියාකාරකම් සිදු කරන ලදී.

පාරිසරික මිනුම් සංඛ්‍යාව = 148

පාරිසරික මිනුම් ලබා ගැනීම යටතේ පරීක්ෂා කළ නියැදි ප්‍රමාණයන් ආලෝක තීව්‍රතාවය = 2,620
ශබ්දය = 520
සුළඟේ වේගය = 435

WBGT index, “Dry bulb” උෂ්ණත්වය, “Wet bulb” උෂ්ණත්වය, “Globe” උෂ්ණත්වය සහ සාපේක්ෂ ආර්ද්‍රතාවය සඳහා 425 බැගින්

ජෛව විද්‍යාත්මක පරීක්ෂණ සංඛ්‍යාව = 1,413



වෘත්තීය සෞඛ්‍ය හා සුරක්ෂිතතා විගණනයන් සංඛ්‍යාව = 170

සේ.අ.අ. (EPF) ප්‍රතිලාභීන් 720ක්ද සේ.නි.භා.අ. (ETF) ප්‍රතිලාභීන් 240ක්ද සඳහා වෛද්‍ය මණ්ඩල තීරණ ලබා දී ඇත.

වෛද්‍ය හේතු මත සේවක අර්ථසාධක අරමුදල් සහ සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් ප්‍රතිලාභ ඉල්ලුම් කරන අයදුම්කරුවන් වෙනුවෙන් වෛද්‍ය මණ්ඩල පවත්වා තීරණ ලබා දීම් සංඛ්‍යාව = 30

**රූපසටහන 2.9** සේවකයාගේ වෘත්තීය සෞඛ්‍යාරක්ෂිත බව තහවුරු කිරීම සඳහා සිදු කරන ලද ක්‍රියාකාරකම්


### 2.2.11 සේවයේ යෙදෙන ස්ත්‍රීන් සහ තරුණ අයගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම හා ළමා ශ්‍රමය පිටු දැකීම

කාන්තාවන්ගේ වෘත්තීය අයිතිවාසිකම් ආරක්ෂාවන පරිදි කම්කරු නීතීන් ක්‍රියාත්මක කිරීම, එම නීති කාලීනව සමාලෝචනය කරමින් අවශ්‍ය සංශෝධනයන් නිර්දේශ කිරීම මඟින් ඵලදායී කාන්තා ශ්‍රම දායකත්වයක් රටට ලබාදීම කම්කරු දෙපාර්තමේන්තුවේ එක් ප්‍රමුඛ වගකීමක් වේ.

එසේම, සියලු පාර්ශවකරුවන්ගේ දායකත්වය තුළින් ශ්‍රී ලංකාව තුළ ළමා ශ්‍රමය තුරන් කිරීමේ ක්‍රියාවලියේ ප්‍රමුඛ කාර්යයක් ඉටු කිරීමට කටයුතු කිරීම මෙන්ම, වයස අවුරුදු 18ට අඩු ළමුන් සඳහා වන කම්කරු නීති ක්‍රියාත්මක කිරීමත්, ස්ත්‍රීන් තරුණ අය සහ ළමුන් සේවයේ යෙදවීම පිළිබඳ නීතිරීති කාලීනව සංශෝධනය කිරීම සඳහා නිර්දේශයන් ඉදිරිපත් කරමින් ඒවා ක්‍රියාත්මක කිරීමත් කම්කරු දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලැබේ.


ඒ අනුව, 2022.01.01 දින සිට 2022.12.31 දින දක්වා පහත ක්‍රියාකාරකම් සිදු කරන ලදී.

1. **ළමා ශ්‍රමය පිළිබඳ ලද පැමිණිලි සඳහා පරීක්ෂණ සිදු කිරීම**




**රූපසටහන 2.10** ළමා ශ්‍රමය පිළිබඳ ලද පැමිණිලි සඳහා පරීක්ෂණ සිදු කිරීම


2. **කාන්තාවන් රාත්‍රී සේවයේ යෙදවීමට අදාළ සේවා කොන්දේසි කඩකිරීම් සම්බන්ධයෙන් ලැබුණු පැමිණිලි පිළිබඳ පරීක්ෂණ**




ළමා ශ්‍රමයක් ඇති බවට අනාවරණය වූ පැමිණිලි 11 ක් සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගන්නා ලදී.

**රූපසටහන 2.11** කාන්තාවන් රාත්‍රී සේවයේ යෙදවීමට අදාළ සේවා කොන්දේසි කඩකිරීම් සම්බන්ධයෙන් ලැබුණු පැමිණිලි පිළිබඳ පරීක්ෂණ

3. කාන්තාවන් රාත්‍රී සේවයේ යෙදවීම සඳහා අනුමැතිය ලබා දීම




**රූපසටහන 2.12** කාන්තාවන් රාත්‍රී සේවයේ යොදවීම සඳහා අනුමැතිය ලබා දීම - 2022

**4. ගම්පහ, කළුතර, බදුල්ල සහ ගාල්ල යන දිස්ත්‍රික්ක 'ළමා ශ්‍රමයෙන් තොර කලාප' ලෙස ප්‍රකාශයට පත් කිරීම සඳහා එම දිස්ත්‍රික්කයන්ට අදාළව දිස්ත්‍රික් කමිටු පත් කිරීම සහ ක්‍රියාකාරී සැලසුම් සකස් කිරීම**

2022 වර්ෂය තුළදී, ගාල්ල, බදුල්ල සහ ගම්පහ දිස්ත්‍රික්ක සඳහා වන දිස්ත්‍රික් කමිටු රැස්වීම් පවත්වා ඒකාබද්ධ ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම සඳහා වන මූලික සාකච්ඡා සිදුකරන ලදී. ඉන් අනතුරුව ග්‍රාම නිලධාරී සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා එම දිස්ත්‍රික්ක තුළ වයස අවුරුදු 18ට අඩු දරුවන් පිළිබඳ තොරතුරු රැස්කිරීමේ කටයුතු සිදු කිරීම 2 වන පියවර වශයෙන් ක්‍රියාත්මක කරන ලදී. එසේම, ගාල්ල, බදුල්ල සහ ගම්පහ දිස්ත්‍රික්ක සඳහා ළමා සංවර්ධන සැලැසුම් සකස් කර අවසන් කර ඇත. ඒ අනුව සෘජු පාර්ශවකරුවන් පුහුණු කිරීම සඳහා ගාල්ල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 22න් 17ක්ද බදුල්ල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 15හිමද ගම්පහ දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය 13න් 03ක වැඩමුළු පවත්වන ලදී. කළුතර දිස්ත්‍රික්කය සඳහා මූලික සාකච්ඡාව පවත්වා ඇති අතර එහි ඉදිරි කටයුතු සිදු කල යුතු වේ.

**5. ළමා ශ්‍රමයට ලක් වූ සහ ළමා ශ්‍රමයට අවදානමක් සහිත දරුවන් සිටින පවුල්වල දරුවන්ගේ අනාගත සුරක්ෂිතභාවය වර්ධනය කිරීම**

මැලිබන් බිස්කට් මැනුෆැක්චරීස් පුද්ගලික සමාගම සමඟ කම්කරු දෙපාර්තමේන්තුව විසින් අත්සන් කළ අවබෝධතා ගිවිසුමට අනුව ළමුන් රැකියාවන්හි නිරතකර තිබූ සහ ඒ සඳහා අවදානමක් සහිත දරුවන් සිටින පවුල් 50ක් තෝරාගනිමින් එම පවුල්වල දරුවන්ගේ අනාගත සුරක්ෂිතභාවය ඇති කිරීම උදෙසා එම පවුල්වල ආර්ථිකය නඟා සිටුවීමට "නිදහසේ රන් දරුවෝ අරමුදල" හරහා අවශ්‍ය උපකරණ සහ මූල්‍යමය සහය ලබා දීමේ ව්‍යාපෘතියේ මූලික පියවරක් ලෙස ආර්ථික අපහසුතා පවතින දරුවන් සිටින තෝරාගත් පවුල් සඳහා අවශ්‍ය ප්‍රතිලාභ ලබා දීමට පහත පරිදි කටයුතු කරන ලදී.

**වගුව 2.9** ආර්ථික අපහසුතා පවතින දරුවන් සිටින තෝරාගත් පවුල් සඳහා අවශ්‍ය ප්‍රතිලාභ ලබා දීම - කම්කරු දෙපා.

| වැඩසටහන | වැඩසටහන ක්‍රියාත්මක කරන ලද දිස්ත්‍රික්කය | ප්‍රතිලාභ ලබා දුන් පවුල් සංඛ්‍යාව |
|---|---|---|
| පළමු | මාතර | පවුල් 4 |
| දෙවන | අනුරාධපුර<br>පොළොන්නරුව | පවුල් 6 |
| තෙවන | කොළඹ | පවුල් 4 |
| සිව්වන | කුරුණෑගල | පවුල් 5 |
| පස්වන | රත්නපුර | පවුල් 2 |

ඒ අනුව 2022 වර්ෂය ඇතුළත ආර්ථික අපහසුතා සහිත සහ ළමා ශ්‍රමයට යෙදවූ සහ අවදානම් සහිත පාසල් වයසේ දරුවන්ගේ පවුල් 21ක් සඳහා ප්‍රතිලාභ ලබා දී ඇති අතර මාසිකව රු.7500.00 බැගින් අවුරුද්දක කාලයක් දරුවන් 21 දෙනකු සඳහා ශිෂ්‍යත්වද ලබා දී ඇත. එමගින් දරුවන් 21 දෙනකුගේ අධ්‍යාපනය ද සුරක්ෂිත කර ඇත.

### 6. ලෝක ළමා දින සැමරුම

ලෝක ළමා දින වැඩසටහන "මැලිබන් ගෝල්ඩ් මාරි නිදහසේ රන් දරුවෝ අරමුදල" හා එක්ව 2022.10.06 වන දින කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය ගරු මනුෂ නානායක්කාර මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් මෙහෙවර පියෙස නව ශ්‍රවණාගාරයේදී පවත්වන ලදි.

එසේම, ලෝක ළමා දිනට සමගාමීව කළුතර දිස්ත්‍රික්කයේ දරුවන් 28 දෙනෙකු සඳහා පාසල් උපකරණ/පොත් කට්ටල බෙදා දීමේ වැඩසටහනක් 2022.10.07 වන දින බස්නාහිර කලාප II නියෝජ්‍ය කම්කරු කොමසාරිස් කාර්යාලයේදී ද ගම්පහ දිස්ත්‍රික්කයේ දරුවන් 25 දෙනෙකු සඳහා පාසල් උපකරණ/පොත් කට්ටල බෙදා දීමේ වැඩසටහනක් 2022.10.08 වන දින ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාල ශ්‍රවණාගාරයේ දී ද පවත්වන ලදී.

මීට අතිරේකව, ළමා ශ්‍රමය තුරන් කිරීම සම්බන්ධව " මල් කැකුළු ඉකි බිඳිද්දී... ළමා ශ්‍රමය පිටු දකිමු" යන වාර්තාමය වැඩසටහනෙහි සිංහල මාධ්‍ය වැඩසටහන 2022.10.02 වන දින ප.ව.7.30ට ජාතික රූපවාහිනී නාලිකාව ඔස්සේද දෙමළ මාධ්‍ය වැඩසටහන 2022.10.01 වන දින ප.ව.2.00 ට චැනල් අයි (Channel eye) නාලිකාව ඔස්සේද විකාශනය කරන ලදී.

### 2.2.12 සේවකයන්ගේ සමාජ ආරක්ෂණය

ශ්‍රී ලංකාවේ පෞද්ගලික අංශයේ සහ අර්ධ රාජ්‍ය අංශයේ සේවයේ යෙදෙන සේවකයන් සඳහා සුරක්ෂිත විශ්‍රාම දිවියක් උරුම කරදීමේ මූලික පරමාර්ථය පෙරදැරි කරගෙන 1958 අංක 15 දරණ සේවක අර්ථසාධක අරමුදල් පනත මඟින් සේවක අර්ථසාධක අරමුදල ස්ථාපිත කර ඇත. මෙම අරමුදලෙහි පරිපාලන කටයුතු කම්කරු දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලබන අතර, එහි අරමුදල් කළමනාකරණය පිළිබඳ වගකීම ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් දරනු ලැබේ. වරින් වර සංශෝධනය වූ මෙම පනත යටතේ දෙපාර්තමේන්තුව විසින් මේ වන විට ඉටුකරනු ලබන කාර්යභාරය පහත සඳහන් පරිදි වේ.


- සේවක අර්ථසාධක අරමුදල සඳහා සේවා යෝජකයින් ලියාපදිංචි කිරීම
- සේවක අර්ථසාධක අරමුදල සඳහා සාමාජිකයන් ලියාපදිංචි කිරීම
- දායක මුදල් නොගෙවන සේවා යෝජකයන්ගෙන් දායක මුදල් අයකර ගැනීම
- සාමාජිකයන් වෙත ප්‍රතිලාභ මුදල් ගෙවීම් සිදුකිරීම සඳහා ගෙවීම් නියෝග ලබාදීම
- අනුමත අර්ථසාධක අරමුදල් අධීක්ෂණය

#### 1. සේවක අර්ථසාධක අරමුදල සඳහා ආයතන ලියාපදිංචි කිරීම සහ සාමාජිකයන් ලියාපදිංචි කිරීම

සේවක අර්ථසාධක අරමුදල් පනත යටතේ ආවරණය වන සියලුම සේව්‍යයන් අරමුදලේ ලියාපදිංචි විය යුතුය. එසේම, සේවක අර්ථසාධක අරමුදල් පනත මඟින් ආවරණය වන සියලු සේවකයින් වෙත සාමාජික අංක ලබා දී ඔවුන් අරමුදලේ ලියාපදිංචි කරවීම සේවා යෝජකගේ වගකීම වන අතර එය අධීක්ෂණය කම්කරු දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලැබේ.

ඒ අනුව, සේවා යෝජක ලියාපදිංචි අයදුම්පත් සහ ප්‍රතිලාභ අයදුම්පත් භාරදීමේ කටයුතු පහසු කිරීම සඳහා කම්කරු දෙපාර්තමේන්තුව විසින් 'සේවක අර්ථසාධක අරමුදල් අයදුම්පත් භාරදීමට වේලාවක් වෙන් කරවා ගැනීමේ පද්ධතිය' (EPF Appointment Management System) 2022.09.01 දින සිට ක්‍රියාත්මක කරන ලදී.

## නව පද්ධතිය හරහා වේලාවක් වෙන් කරවාගත් සංඛ්‍යාව





| ප්‍රස්තාරය 2.5 | 'සේවක අර්ථසාධක අරමුදල් අයදුම්පත් භාරදීමට වේලාවක් වෙන් කරවා ගැනීමේ පද්ධතිය හරහා වේලාවක් වෙන් කරගත් සංඛ්‍යාව - සැප්තැම්බර් මාසයේ සිට |
|---|---|

### 2. සේවක අර්ථසාධක අරමුදලේ ප්‍රතිලාභ ගෙවීම

2022.01.01 දින සිට 2022.12.31 දින දක්වා සේවක අර්ථසාධක අරමුදලේ ප්‍රතිලාභ ලැබූ මුළු ප්‍රතිලාභීන් සංඛ්‍යාව 166,110ක් වන අතර ඒ පිළිබඳ වර්ගීකරණය පහත ප්‍රස්තාරය මඟින් දැක්වේ.


## 2022.01.01 දින සිට 2022.12.31 දින දක්වා සේවක අර්ථසාධක අරමුදලේ ප්‍රතිලාභ ලැබූ සංඛ්‍යාව




| ප්‍රස්තාරය 2.6 | 2022.01.01 දින සිට 2022.12.31 දින දක්වා සේවක අර්ථසාධක අරමුදලේ ප්‍රතිලාභ ලැබූ ප්‍රතිලාභීන් |
|---|---|

පසුගිය වර්ෂ හයක කාලය තුළදී කම්කරු දෙපාර්තමේන්තුව විසින් සේවක අර්ථසාධක අරමුදල් ප්‍රතිලාභ ගෙවීම් කටයුතු කාර්යක්ෂම කිරීමට ගන්නා ලද පියවරයන්ගේ ප්‍රතිඵලයක් ලෙස සේවක අර්ථසාධක අරමුදල් ප්‍රතිලාභ ගෙවීම් කටයුතුවල ක්‍රමික ප්‍රගතියක් දක්නට ඇති අතර 2017 වර්ෂයට සාපේක්ෂව 2022 වර්ෂය වන විට දින 14ක් තුළ ප්‍රතිලාභ ගෙවූ ප්‍රතිශතය 43% සිට 66% දක්වා වර්ධනය වී ඇත. ඒ අනුව ප්‍රතිලාභ ගෙවීමේ කාර්යක්ෂමතාවය වර්ධනය වී ඇත.

**සේවක අර්ථසාධක අරමුදල් ප්‍රතිලාභ ගෙවීම් සඳහා ගතවූ කාලය - 2017 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා**




**ප්‍රස්තාරය 2.7** සේවක අර්ථසාධක අරමුදල් ප්‍රතිලාභ ගෙවීම් සඳහා ගතවූ කාලය - 2017 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා

## දායක මුදල් ගෙවීම පැහැර හරින සේවායෝජකයන් වෙතින් දායක මුදල් අයකර ගැනීමට නිවේදන යැවීම

දායක මුදල් පැහැර හරින සේවායෝජකයන්ගෙන් එම මුදල් අයකර ගැනීම සඳහා කම්කරු දෙපාර්තමේන්තුව විසින් ප්‍රථම නිවේදන හා රතු නිවේදන නිකුත් කෙරෙන අතර ඒ සඳහා ප්‍රතිචාර නොදක්වන්නේ නම් නීති මඟින් කටයුතු කර එම දායක මුදල් හා අධිභාර අයකර ගිණුම් ගත කිරීමට ක්‍රියා කරනු ලැබේ.

**රූපසටහන 2.13** 2022.01.01 දින සිට 2022.12.31 දක්වා සේ.අ.අ. නිවේදන යැවීමේ ප්‍රගතිය

| යැවූ පළමු නිවේදන සංඛ්‍යාව | පළමු නිවේදනවලින් අයකර ගත් මුදල රු. | යැවූ රතු නිවේදන සංඛ්‍යාව | රතු නිවේදන වලින් අයකර ගත් මුදල රු. |
|---|---|---|---|
| 10,428 | මිලියන 7,614 | 8,409 | මිලියන 5,230 |









### 3. අනුමත අර්ථසාධක අරමුදල් අධීක්ෂණය

2022.12.31 දින වන විට සේවක අර්ථසාධක අරමුදල යටතේ අනුමත අර්ථසාධක අරමුදල් පවතින ආයතන 117ක් ලියාපදිංචිව ඇති අතර, එදිනට සමස්ත සාමාජික සංඛ්‍යාව 88,627කි.

### 2.2.13 සේවකයන්ගේ අයිතිවාසිකම් සුරැකීම සඳහා නෛතික රැකවරණය


සේවකයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කර දීම සඳහා කම්කරු දෙපාර්තමේන්තුව විසින් පනත් ගණනාවක් ක්‍රියාත්මක කරනු ලබයි. ඒ අනුව, කම්කරු දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාවට නැංවිය යුතු එම අණ පනත්හි ප්‍රතිපාදන දිවයින පුරා ඒකාකාරීව ක්‍රියාත්මක කිරීම සහතික කිරීම සඳහා එම නීති උල්ලංඝනය කරන්නන්ට එරෙහිව අධිකරණ ක්‍රියාමාර්ග ගැනීමත් ඒ තුළින් සේවක අයිතීන් සුරක්ෂිත කිරීමත් දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලබයි.

ඒ අනුව, 2020.01.01. දින සිට 2022.12.31 දක්වා දෙපාර්තමේන්තුවේ නෛතික ක්‍රියාකාරකම්වල ප්‍රගතිය පහත වගු පරිදි වේ.

**වගුව 2.10** අධිකරණ අනුව නඩුවල කාර්යසාධනය - 2022.01.01 සිට 2022.12.31 දක්වා - කම්කරු දෙපා.

| අධිකරණය | 2022 වර්ෂයට ඉදිරියට ගෙන ආ ශේෂය | 2022 වර්ෂයේදී ආරම්භ කරන ලද නඩු | 2022.12.31 දිනට අවසන් කරන ලද නඩු |
|---|---|---|---|
| ශ්‍රේෂ්ඨාධිකරණය | 119 | 17 | 31 |
| අභියාචනාධිකරණය | 252 | 107 | 35 |
| මහාධිකරණය | 110 | 27 | 44 |
| දිසා අධිකරණය සහ වාණිජ මහාධිකරණය | 216 | 11 | 20 |
| මහේස්ත්‍රාත් අධිකරණය | 98 | 82 | 74 |

**මහේස්ත්‍රාත් අධිකරණයන්හි පවරා ඇති නඩු සහ විසඳා ඇති නඩු - 2022.01.01 සිට 2022.12.31 දක්වා**




**ප්‍රස්තාරය 2.8** මහේස්ත්‍රාත් අධිකරණයන්හි පවරා ඇති නඩු සහ විසඳා ඇති නඩු

පහත සඳහන් පරිදි නීති සංශෝධන සහ නව නීති සම්පාදනය සඳහා කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශයට සහාය වීම.

1. නව පනත් සහ රෙගුලාසි කෙටුම්පත් කිරීම
2. වත්මන් නීතිමය තත්ත්වය විශ්ලේෂණය කිරීම සහ අදාළ නිරීක්ෂණ සැපයීම
3. වත්මන් තත්ත්වය සහ අවශ්‍යතාව අධ්‍යයනය කිරීමෙන් පසු නව නීති සම්පාදනය සඳහා නිරීක්ෂණ සැපයීම.

### 2.2.14 සේවා කාර්යක්ෂමතාව වර්ධනය හා කම්කරු සුභසාධනය සඳහා කම්කරු දෙපාර්තමේන්තුව සිදු කළ විශේෂ ක්‍රියාකාරකම්

#### 1. සේව්‍ය / සේවක සුරක්ෂිතතාවය ඉහළ නැංවීම සඳහා විධිමත් සුරක්ෂිතතා කමිටු පිහිටුවීම

කම්කරු දෙපාර්තමේන්තුවේ සම්බන්ධීකරණයෙන් අවිස්සාවේල්ල ආයෝජන ප්‍රවර්ධන කලාපය තුළ සුරක්ෂිතතා සහ සෞඛ්‍ය කමිටු ප්‍රවර්ධනය කර සේව්‍ය / සේවක සුරක්ෂිතතාවය ඉහළ නැංවීම සඳහා නියමු ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරන ලදී. අවිස්සාවේල්ල ආයෝජන ප්‍රවර්ධන කලාපය තුළ විධිමත් ආකාරයේ සුරක්ෂිතතා කමිටු නොතිබූ බව නිරීක්ෂණය වූ බැවින් එක් එක් කර්මාන්තශාලා පරීක්ෂා කර වැඩපළ සහයෝගීත්වයෙන් සුරක්ෂිතතා කමිටු පිහිටුවන ලදී. ඒ අනුව, 2022.12.31 දින වන ආයෝජන කලාපය තුළ කර්මාන්තශාලා 2ක විධිමත් කමිටු පිහිටුවන ලදී.

එසේම, 2022.10.11 දින ජාතික වෘත්තීය සුරක්ෂිතතාව හා සෞඛ්‍ය පිළිබඳ සතිය ජාතික වැඩසටහනේදී ගරු කම්කරු හා විදේශ රැකියා අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් මාර්ගගත ක්‍රමය ඔස්සේ සුරක්ෂිතතා කමිටු පිහිටුවීමේ කටයුතු ආරම්භ කරන ලදි. ඒ අනුව, 2022.12.31 දිනට මුළු දිවයිනම ආවරණය වන පරිදි සුරක්ෂිතතා කමිටු 241ක් පිහිටුවා ඇත.

#### 2. කම්කරු ක්ෂේත්‍රයට අදාළ ජාත්‍යන්තර සංවිධාන සහ රටවල් සමඟ සබඳතා වර්ධනය කර ගැනීම

- ‘කම්කරු පරීක්ෂණ මාර්ගෝපදේශ සංග්‍රහය’ (Field Guide to Labour Inspections) සංශෝධනය කිරීම සඳහා සහ ‘කම්කරු නීති සංග්‍රහය’ (Compilation of Labour Laws) නව සංශෝධන ඇතුලත් කර නැවත මුද්‍රණය කිරීම සඳහා ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ අනුග්‍රහය යටතේ කමිටු දෙකක් පිහිටුවන ලදී. ඒ අනුව, ‘කම්කරු නීති සංග්‍රහය’ ඉංග්‍රීසි භාෂා කෙටුම්පත සකස් කරන ලද අතර එය මුද්‍රණය සඳහා මූල්‍ය සහය ලබා දෙන ලෙස ජාත්‍යන්තර කම්කරු සංවිධානය වෙතින් ඉල්ලීමක් සිදු කරන ලදී. ’කම්කරු පරීක්ෂණ මාර්ගෝපදේශ සංග්‍රහය’ ඉංග්‍රීසි භාෂා කෙටුම්පත සකස් කරන ලද අතර එය සිංහල සහ දෙමළ භාෂාවන්ට පරිවර්තනය කර මුද්‍රණය කිරීමේ කටයුතු ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ අනුග්‍රහය යටතේ සිදු කරමින් පවතී.
- ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ මූල්‍ය දායකත්වය යටතේ දෙපාර්තමේන්තුවේ නිල යූ ටියුබ් චැනලය වෙත ඇතුලත් කිරීම සඳහා දෙපාර්තමේන්තුවේ ප්‍රධාන සේවා පිළිබඳව කෙටි වීඩියෝපට එක් භාෂාවකින් 30 බැගින් සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාත්‍රයෙන්ම සකස් කර යූ ටියුබ් චැනලය වෙත ඇතුලත් කරන ලදී. මෙම වීඩියෝ පට මගින් සේවක අර්ථසාධක අරමුදල සම්බන්ධයෙන්, කාර්මික සම්බන්ධතාවයට අදාළ නීතිමය තත්ත්වයන් පිළිබඳව, කාන්තාවන්, තරුණ අය සහ ළමුන් සේවයේ යෙදවීමට අදාළ නීතිමය තත්ත්වයන් සම්බන්ධයෙන් සහ ශ්‍රම ප්‍රමිතීන් සම්බන්ධයෙන් තොරතුරු ඉදිරිපත් කර ඇත.
- එක්සත් ජනපද රාජ්‍ය දෙපාර්තමේන්තුව විසින් 2022 ජූලි 19 වනදා නිකුත් කරන ලද 2022 එක්සත් ජනපද

පුද්ගලයින් වෙළඳාම (මිනිස් ජාවාරම) පිළිබඳ වාර්තාව (US TIP REPORT 2022) සඳහා අවශ්‍ය තොරතුරු ලබා දීමෙන් වාර්තාව සකස් කිරීම සඳහා රාජ්‍ය පාර්ශවකරුවන් ලෙස සම්බන්ධ වී කම්කරු දෙපාර්තමේන්තුවේ සහය ලබා දෙන ලදී. එම වාර්තාවට අනුව 2021 වර්ෂයේදී Tire 2 Watch List මට්ටමේ රටවල් සහිත ලැයිස්තුව තුළ පැවති ශ්‍රී ලංකාව 2022 වර්ෂයේදී Tire 2 මට්ටමේ රටවල් සහිත ලැයිස්තුව තුළ පැවතීම හේතුවෙන් ශ්‍රී ලංකාවේ මට්ටම උසස් කර ඇති බව නිරීක්ෂණය විය. ඒ අනුව, එම වාර්තාව සකස් කිරීමට අවශ්‍ය තොරතුරු ලබා දීමෙන් සහය දැක්වූ ආයතන අගයමින් ආරක්ෂක අමාත්‍යාංශය විසින් සංවිධානය කරන ලද ඇගයීම් උත්සවයේදී කම්කරු දෙපාර්තමේන්තුවද ඇගයීමට ලක් වන ලදී.

- සේවයේ නියුක්තව සිටියදී මියගිය සේවකයින් දස දෙනෙකුගේ පාසැල් දරුවන් දස දෙනෙකු වෙත රුසියානු සංස්කෘතික මධ්‍යස්ථානයේ මූල්‍ය අනුග්‍රහය ඇතිව ශිෂ්‍යාධාර පිරිනමන ලදී. මෙම වැඩසටහන රුසියානු සමූහ ආණ්ඩුවේ මූල්‍ය අනුග්‍රහය මත ඉදිරි වර්ෂයේදී ද සිදු කිරීමට අපේක්ෂිතය.

**3. කඩදාසි භාවිතය අවම කරමින් පිරිමැසුම්දායී සහ කඩිනම් අභ්‍යන්තර සන්නිවේදන මාධ්‍යයක් ලෙස Slack යෙදවුම භාවිතය වර්ධනය කිරීම**

කම්කරු දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර දැනුවත් කිරීම් කඩිනමින් දෙපාර්තමේන්තු නිලධරයින් අතරට ගෙනයමින් රාජකාරිමය අභ්‍යන්තර සන්නිවේදන මාධ්‍යයක් ලෙස, කඩදාසි භාවිතය අවම කරමින් සහ තැපැල් පිරිවැය අවම කරමින් Slack යෙදවුම සාර්ථකව භාවිතා කරන රාජ්‍ය ආයතන අතරින් ප්‍රමුඛ ස්ථානයක් කම්කරු දෙපාර්තමේන්තුව හිමි කර ගෙන ඇත.

### 2.2.15 කම්කරු දෙපාර්තමේන්තුවේ තොරතුරු සන්නිවේදන කටයුතු

**1. ප්‍රකාශන කටයුතු**

කම්කරු ක්ෂේත්‍රය පිළිබඳ මහජනතාවගේ දැනුවත්භාවය වර්ධනය කිරීම සඳහා පහත ප්‍රකාශන එළි දක්වන ලදී.

- Prime Work සඟරාව

ආයතනවල සේවකයන් හා සේවා යෝජකයන් අතර කම්කරු නීති හා ඒ හා බැඳුනු විෂයන් පිළිබඳ දැනුම සහ කතිකාවත වර්ධනය කර කාර්මික සාමය සුරක්ෂිත කිරීමේ අරමුණින් 2021 වර්ෂයේදී ආරම්භ කරන ලද මෙම සඟරාවෙහි තෙවන කලාපය 2022 ජූනි මාසයේදී Attitudes යන තේමාව යටතේ විද්‍යුත් කලාපයක් (e-version) ලෙස දෙපාර්තමේන්තු වෙබ් අඩවියෙන් බාගත කර ගත හැකි පරිදි එළි දක්වන ලදී.

- වැඩ කළ පැය ගණන හා ශ්‍රම පිරිවැය පිළිබද සමීක්ෂණය

මෙම සමීක්ෂණය මඟින් රටේ සංවර්ධන ක්‍රමෝපායන් සැකසීම සඳහා අවශ්‍ය ශ්‍රම පිරිවැය, වැඩකළ පැය ගණන හා සාමාන්‍ය ඉපයීම් පිළිබඳ දත්ත ලබා දීම සිදු කෙරේ. එමඟින් රජයේ සහ පෞද්ගලික අංශයේ සැලසුම් සම්පාදනය හා තීරණ ගැනීම සඳහා මෙන්ම සේව්‍ය සේවක දෙපාර්ශවයේ උන්නතිය වෙනුවෙන් සකස් කරනු ලබන ඉදිරි සැලසුම් සකස් කිරීමට අවශ්‍ය තොරතුරු ලබා දීම සිදුකෙරේ. 2022 වර්ෂයේදී වැඩ කළ පැය ගණන හා ශ්‍රම පිරිවැය පිළිබද සමීක්ෂණයේ 2020 වාර්තාව ප්‍රකාශයට පත් කරන ලදී.

- කම්කරු සංඛ්‍යාති වාර්ෂික වාර්තාව 2020 සහ 2021

කම්කරු ක්ෂේත්‍රයට අදාළ ප්‍රතිපත්ති සැලසුම් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය දත්ත ප්‍රකාශයට පත් කිරීම සහ දත්ත පරිශීලකයන් සඳහා අවශ්‍ය දත්ත ලබා දිමේ අරමුණින් සකස් කරනු ලබන කම්කරු සංඛ්‍යාති වාර්ෂික වාර්තාව 2020 සහ 2021 ප්‍රකාශයට පත් කරන ලදී.

**2. දෙපාර්තමේන්තුවේ නිල සමාජ මාධ්‍ය කටයුතු**

කම්කරු දෙපාර්තමේන්තුව විසින් නිල යූ ටියුබ්

චැනලයක්, ෆේස් බුක් පිටුවක් සහ ට්විටර් ගිණුමක් පවත්වාගෙන යමින් යාවත්කාලීනව තොරතුරු මහජනතාව වෙත ලබා දීමට කටයුතු කරනු ලැබේ.

| | | |
|---|---|---|
| YouTube Channel | Subscribers: 859 / Number of Videos included : 118 | |
| Facebook Page | Followers: 2,900 | |
| Twitter | Followers: 56 | |

### 3. කම්කරු දෙපාර්තමේන්තු වෙබ් අඩවිය යාවත්කාලීන කිරීම

මහජනතාවට සේවා ලබා ගැනීමට අවශ්‍ය අයදුම්පත්, ආකෘති හා කම්කරු අණපනත්, සේවා යෝජකයින් විසින් අවධානය යොමු කළ යුතු පඩි පාලක සභා තීරණ ආදී අවශ්‍ය ලේඛන බාගත කරගත හැකි පරිදි සහ කම්කරු දෙපාර්තමේන්තුවේ නව සේවා, මාධ්‍ය නිවේදන, ලංසු කැඳවීම් වැනි තොරතුරු ලබා ගත හැකි වන පරිදි www.labourdept.gov.lk යන දෙපාර්තමේන්තු වෙබ් අඩවියෙහි පළ කර ඇති අතර එම තොරතුරු නිරන්තරයෙන් යාවත්කාලීන කිරීමට කටයුතු කරනු ලැබේ. එසේම, දෙපාර්තමේන්තුව සඳහා නව නිල වෙබ් අඩවියක් සකස් කිරීමේ කටයුතු ආරම්භ කර ඇති අතර 2022 වර්ෂය අවසන් වන විට වෙබ් අඩවියෙහි ප්‍රධාන අතුරු මුහුණතෙහි දළ සැකැස්ම සකස් කර දෙපාර්තමේන්තුවේ ඊ-සේවාවන් ලබා දෙන අංශයන්ට අදාළ කොටස් සංවර්ධනය කරන ලදී.

### 4. ජනමාධ්‍ය ආයතන විසින් සංවිධානය කරන ලද විවිධ වැඩසටහන් සඳහා සහභාගීත්වය ලබා දීම

- චරණ ටීවී මාධ්‍ය මඟින් සංවිධානය කරන ලද කාලත්‍රයේ කතාබහ සංවාද වැඩසටහනේ 2022.07.11 දින "පරිපාලන වගකීම් සහ සේවා සේවක යුතුකම්" යන මාතෘකාව යටතේ පැවති වැඩසටහන සඳහා කම්කරු කොමසාරිස් ජනරාල්ගේ සහභාගීත්වය ලබා දෙන ලදී.

- ලෝක ළමා ශ්‍රම විරෝධී දිනයට සමගාමීව 2022.06.12 වන දින ජාතික රූපවාහිනී නාලිකාව ඔස්සේ විකාශනය වන "ඉරිදා ආයුබෝවන්" වැඩසටහන සඳහා කම්කරු කොමසාරිස් ජනරාල් සහ කම්කරු කොමසාරිස් (කාන්තා හා ළමා කටයුතු) සහභාගීත්වය ලබා දෙන ලදී. එම වැඩසටහන හරහා ළමා ශ්‍රමය සම්බන්ධ දැනුවත් කිරීම සිදු කරන ලදී.

- ජනමාධ්‍ය අමාත්‍යාංශය ජාතික සංවර්ධන මාධ්‍ය මධ්‍යස්ථානයේ ඇසිදිසි පෙරමඟ කණ්ඩායම හා රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව එක්ව සංවිධානය කරනු ලබන ඇසිදිසි පෙරමඟ සංවාද




**ඡායාරූපය 2.3** සේ.අ.අ. වේලාව වෙන් කරවා ගැනීමේ පද්ධතිය ආරම්භ කිරීම

වැඩසටහනේ 2022.09.26 වන දින වැඩසටහන "මහජන සේවාවන් විධිමත් කිරීම සඳහා කම්කරු දෙපාර්තමේන්තුව විසින් ගෙන ඇති නව පියවර" යන මාතෘකාව යටතේ කම්කරු කොමසාරිස් (කර්මාන්තමය සුරක්ෂිතතා) හා කම්කරු කොමසාරිස් (සේවක අර්ථසාධක අරමුදල) සමඟින් පවත්වන ලදී.

**5. ප්‍රධාන සැමරුම් දිනයන් පැවැත්වීම**

- ජාත්‍යන්තර කාන්තා දිනය 2022

"රටකි දැයකි ලොවකි ඇය" තේමාව කරගත් 2022.03.08 දිනට යෙදුන ජාත්‍යන්තර කාන්තා දිනයට සමගාමීව කම්කරු දෙපාර්තමේන්තුවේ කාන්තා දින වැඩසටහන කටුනායක අපනයන සැලසුම් කලාපයේ සේවිකාවන් 100ක් සඳහා කම්කරු අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් 2022.03.09 දින කටුනායක ආයෝජන මණ්ඩල ශ්‍රවණාගාරයේදී පවත්වන ලදී.

- ලෝක ළමා දින සැමරුම

ලෝක ළමා දින වැඩසටහන "මැලිබන් ගෝල්ඩ් මාරි නිදහසේ රන් දරුවෝ" අරමුදල හා එක්ව 2022.10.06 වන දින කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය ගරු මනුෂ නානායක්කාර මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් මෙහෙවර පියෙස නව ශ්‍රවණාගාරයේදී පවත්වන ලදි.

එසේම, ලෝක ළමා දිනට සමගාමීව කළුතර දිස්ත්‍රික්කයේ දරුවන් 28 දෙනෙකු සඳහා පාසල් උපකරණ / පොත් කට්ටල බෙදා දීමේ වැඩසටහනක් 2022.10.07 වන දින බස්නාහිර කලාප II නියෝජ්‍ය කම්කරු කොමසාරිස් කාර්යාලයේදී ද ගම්පහ දිස්ත්‍රික්කයේ දරුවන් 25 දෙනෙකු සඳහා පාසල් උපකරණ/පොත් කට්ටල බෙදා දීමේ වැඩසටහනක් 2022.10.08 වන දින ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාල ශ්‍රවණාගාරයේදී ද පවත්වන ලදි.

මීට අතිරේකව, ළමා ශ්‍රමය තුරන් කිරීම සම්බන්ධව "මල් කැකුළු ඉකි බිඳිද්දී... ළමා ශ්‍රමය පිටු දකිමු" යන වාර්තාමය වැඩසටහනේ සිංහල මාධ්‍ය වැඩසටහන 2022.10.02 වන දින ප.ව.7.30ට ජාතික රූපවාහිනී නාලිකාව ඔස්සේද දෙමළ මාධ්‍ය වැඩසටහන 2022.10.01 වන දින ප.ව.2.00ට චැනල් අයි (Channel eye) නාලිකාව ඔස්සේද විකාශනය කරන ලදි.

- ජාත්‍යන්තර ළමා ශ්‍රම විරෝධි දින වැඩසටහන - 2022

ලෝක ළමා ශ්‍රම විරෝධී දිනයට සමගාමීව ළමා ශ්‍රමය තුරන් කිරීම සම්බන්ධ කෙටි පණිවිඩයක් සමාජගත කිරීම සඳහා 2022.06.12 වන දින සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් Mobitel, Dialog, Hutch සහ Airtel යන සේවා ජාල හරහා කෙටි පණිවිඩයක් සමාජගත කරන ලදි.

මීට අමතරව ලෝක ළමා ශ්‍රම විරෝධි දිනයට සමගාමීව 2022.06.12 වන දින ජාතික රූපවාහිනී නාලිකාව ඔස්සේ විකාශනය වන "ඉරිදා ආයුබෝවන්" වැඩසටහන හරහා ළමා ශ්‍රමය සම්බන්ධ දැනුවත් කිරීම සිදු කරන ලදි.

**2.2.16 වෘත්තීය මාර්ගෝපදේශනය, ශ්‍රම වෙළඳපළ තොරතුරු පවත්වා ගැනීම හා මහජන රැකියා සේවා කටයුතු**

රටේ මානව සම්පත සංවර්ධනය සහ කළමනාකරණය සඳහා **මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව** විසින් විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරයි.

**1. වෘත්තීය මාර්ගෝපදේශන කටයුතු**

රටේ මානව සම්පත්වල මුළු ශක්තිය කාර්යක්ෂම හා ඵලදායි ලෙස රටේ සංවර්ධනයට යොදා ගනිමින්, දේශීය විදේශීය ශ්‍රම වෙළඳපොළට ගැලපෙන මානව සම්පතක් බිහිකිරීම අරමුණු කර ගනිමින් වෘත්තීය මාර්ගෝපදේශ සේවා සැපයීම සිදු කරනු ලබයි.

මෙම වෘත්තීය මාර්ගෝපදේශ වැඩසටහන් සඳහා මනෝමිතික පරීක්ෂණ, අභියෝග්‍යතා පරීක්ෂණ, ලිඛිත හා ප්‍රායෝගික පරීක්ෂණ, සම්මුඛ පරීක්ෂණ, විවිධ නිරීක්ෂණාත්මක පරීක්ෂණ යන මෙවලම් භාවිතා කෙරේ.

මෙම වෘත්තීය මාර්ගෝපදේශ වැඩසටහන් පුද්ගල, කණ්ඩායම් සහ සමූහ වශයෙන් ගෙන පුද්ගල උපදේශන හා මාර්ගෝපදේශය, මූලික දැනුවත් කිරීම්, වැඩමුළු, ප්‍රායෝගික ක්‍රියාකාරකම් මඟින් සිදු කරනු ලැබේ.

| වගුව 2.11 | වෘත්තීය මාර්ගෝපදේශ වැඩසටහන්වල ප්‍රගතිය - මි.හා රැ.දෙපා. |
|---|---|

| | වැඩසටහන / ක්‍රියාකාරකම | 2022.01.01 දින සිට 2022.12.31 දක්වා භෞතික | මූල්‍ය (රු.මි.) | ප්‍රතිලාභීන් සංඛ්‍යාව |
|---|---|---|---|---|
| ශ්‍රම වෙළඳපොළට වඩාත් ගැලපෙන රැකියා යෝග්‍ය කුසලතාවලින් යුත් මානව සම්පතක් බිහි කිරීම | | | | |
| 1. | දිස්ත්‍රික් රැකියා පොළ පැවැත්වීම | 80 | 2.500 | 22,723 |
| | දිස්ත්‍රික් වෘත්තීය පොළ පැවැත්වීම | 43 | | 4,845 |
| | ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන් පැවැත්වීම | 33 | | 1156 |
| | ප්‍රවර්ධන වීඩියෝපට සැකසීම | 4 | 0.217 | |
| ශ්‍රම වෙළඳපොළ තොරතුරු පර්යේෂණ | | | | |
| 2. | සිද්ධි අධ්‍යයනයන් සිදු කිරීම | 20 | 0.197 | |
| | ශ්‍රම වෙළඳපොළ තොරතුරු පිළිබඳව බුද්ධි කලම්භන සැසි සිදු කිරීම | 10 | 0.092 | |
| | සිද්ධි අධ්‍යයනයන් පදනම් කරගෙන වීඩියෝ පට සැකසීම | 100% | 0.307 | |
| | දිස්ත්‍රික් මානව සම්පත් පැතිකඩ සැකසීම | 100% | දිස්ත්‍රික් සඳහා රු.මි.0.870ක මුදලක් පවරා ඇත. | |
| වෘත්තීය මාර්ගෝපදේශ වැඩසටහන් පැවැත්වීම | | | | |
| 3. | 9 වසර සිසුන් සඳහා වෘත්තීය මාර්ගෝපදේශ වැඩසටහන් පැවැත්වීම | 1,869 | 2.077 | 55,100 |
| | අ.පො.ස (සාමාන්‍ය පෙළ) වෘත්තීය මාර්ගෝපදේශ වැඩසටහන | 2,406 | | 60,506 |
| | අ.පො.ස. (උසස් පෙළ) වෘත්තීය මාර්ගෝපදේශ වැඩසටහන | 1151 | | 31,365 |
| | අත්පොත් මුද්‍රණය සහ මනෝමිතික පරීක්ෂණයන් ස්වයංක්‍රීය කිරීම | 100% | 0.822 | |
| | රැකියා නිර්මාණ වැඩසටහනක් පැවැත්වීම | 1 | 0.995 | |
| | Life Talk වැඩසටහන | 70 | | 23,688 |
| මහජන රැකියා සේවය | | | | |
| 4. | රැකියා අපේක්ෂිතයන් ලියාපදිංචි කිරීම | | | 59,758 |
| | රැකියා ඇබෑර්තු ලියාපදිංචි කිරීම | | | 33,885 |
| | රැකියා අපේක්ෂිතයන් රැකියා සඳහා යොමු කිරීම | | | 37,151 |
| | රැකියා අපේක්ෂිතයන් රැකියා ගත කිරීම | | | 9,606 |
| 5. | ක්‍රියාකාරී ශ්‍රම වෙළඳපොළක් සඳහා අභ්‍යන්තර කළමනාකරණ තොරතුරු පද්ධතියක් ස්ථාපනය කිරීම | 80% | 0.641 | |

| | | | | |
|---|---|---|---|---|
| 6. | අත්පොත් මුද්‍රණය | 100% | 0.257 | 300 |
| 7. | උතුරු පළාතේ රැකියා ස්ථානගත කිරීම සහ ස්වයං රැකියා මාර්ගෝපදේශනය තුළින් ආබාධිත පුද්ගලයන් ආර්ථික අංශයට ඇතුලත් කර ගැනීම ප්‍රවර්ධනය කිරීමට සහය වීම (ජාත්‍යන්තර කම්කරු සංවිධානය) | | | |
| 8. | වෘත්තීය මාර්ගෝපදේශ වැඩසටහන් ප්‍රවර්ධනය කිරීම සඳහා කෙටි වීඩියෝපට 04ක් සකස් කර දෙපාර්තමේන්තු වෙබ් අඩවියේ උඩුගතකිරීම | | | |
| 9. | වෘත්තීය මාර්ගෝපදේශ නිලධාරීන්ගේ ප්‍රයෝජනය සඳහා අත්පොත් සකස් කිරීම | | | |

**2. 2022 වර්ෂය තුළ මූල්‍ය ප්‍රතිපාදන නොමැතිව සිදු කරන ලද වැඩසටහන් සඳහා ගණනය කළ මූල්‍යමය වටිනාකම් පැවරීම**

**වගුව 2.12** මූල්‍ය ප්‍රතිපාදන නොමැතිව සිදු කරන ලද වැඩසටහන් - මි.හා රැ.දෙපා

| අ. අ. | වැඩසටහන | මූල්‍ය ප්‍රතිපාදන යටතේ වැඩසටහන සිදුකලේ නම් එක් ප්‍රතිලාභියෙකු සඳහා වියදම (A) | ප්‍රතිලාභීන් සංඛ්‍යාව (B) | ගණනය කළ මූල්‍යමය අගය (A)* (B) |
|---|---|---|---|---|
| 01 | දෙමාපියන් දැනුවත් කිරීමේ වැඩසටහන | 200.00 | 15,346 | 3,069,200.00 |
| 02 | ස්වයං රැකියා පෙළඹවීම වැඩසටහන | 200.00 | 3,346 | 669,200.00 |
| 03 | අවශ්‍යතා මත පුහුණු වැඩසටහන් | 200.00 | 286 | 57,200.00 |
| 04 | ප්‍රාදේශීය රැකියා පොළ | 200.00 | 3,912 | 782,400.00 |
| 05 | ගුරුවරුන් දැනුවත් කිරීමේ වැඩසටහන | 200.00 | 933 | 186,600.00 |
| 06 | රැකියා අපේක්ෂිතයින් දැනුවත් කිරීම | 200.00 | 6,724 | 1,344,800.00 |
| 07 | ව්‍යවසායකත්ව සංවර්ධන එක්දින වැඩසටහන | 200.00 | 1,840 | 368,000.00 |
| 08 | Life Talk වැඩසටහන | 200.00 | 23,688 | 4,737,600.00 |
| **මුළු එකතුව** | | | **56,075** | **11,215,000.00** |



**ඡායාරූපය 2.4** කොරියානු මිනිස්බල අමාත්‍යාංශ නිලධාරීන් සමඟ සාකච්ඡාව

## 3. ශ්‍රම වෙළඳපොළ තොරතුරු

| වගුව 2.13 | ශ්‍රම වෙළඳපොළ තොරතුරු ප්‍රකාශයට පත් කිරීම - මී.හා රැ.දෙපා |
|---|---|

| අ. අ. | වැඩසටහන | භෞතික ප්‍රගතිය | මූල්‍ය ප්‍රගතිය | මූල්‍ය සාරාංශය (රු) | |
|---|---|---|---|---|---|
| | | | | වෙන් කළ මුදල (රු.) | වැය කළ මුදල (රු.) |
| 01 | විවිධ මාතෘකා යටතේ සිද්ධි අධ්‍යයන වාර්තා 20ක් සකස්කර වෙබ් අඩවියේ පළ කිරීම | 100% | 98.5% | 200,000 | 197,019 |
| 02 | විවිධ ක්ෂේත්‍රයන්හි පවතින රැකියා අවස්ථා හඳුනාගැනීම සඳහා විවිධ වෘත්තිකයන්ගේ සහභාගීත්වයෙන් බුද්ධි කලම්භන සැසි 10ක් පැවැත්වීම හා එම වාර්තා පිළිබඳ අදාළ ආයතන දැනුවත් කර දෙපාර්තමේන්තු වෙබ් අඩවියේ පළ කිරීම | 100% | 85.47% | 108,000 | 92,310 |
| 03 | සිද්ධි අධ්‍යයන වාර්තා හා බුද්ධි කළම්භන සැසි වාර්තා ඇසුරෙන් වීඩියෝපට 10ක් සකස් කිරීම | 100% | 61.51% | 500,000 | 307,528 |

## 4. මානව සම්පත් කළමණාකරණ හා ජාත්‍යන්තර සබඳතා

| වගුව 2.14 | මානව සම්පත් කළමණාකරණ හා ජාත්‍යන්තර සබඳතා - මී.හා රැ.දෙපා |
|---|---|

| අංශය | සිදු කළ වැඩසටහන් |
|---|---|
| ජාතික මානව සම්පත් හා රැකීරක්ෂා ප්‍රතිපත්ති කටයුතු | 1. ජාතික මානව සම්පත් හා රැකියා ප්‍රතිපත්තිය (NHREP) ක්‍රියාත්මක කිරීමට අදාළ අංශ සමඟ සම්බන්ධීකරණය<br>2. ශ්‍රී ලංකාවේ කාන්තා ශ්‍රම දායකත්වය ඉහළ නැංවීමේ අරමුණින්, දිවා සුරැකුම් සේවාව වඩාත් විශ්වාසදායි හා සඵලදායි අන්දමින් ගොඩනැංවීම කෙරෙහි අවධානය යොමු කරමින් කටයුතු කළ යුතු ආකාරය පිළිබඳ කාන්තා හා ළමා කටයුතු හා සමාජ සවිබල ගැන්වීම් අමාත්‍යාංශය සමඟ සාකච්ඡා සිදු කිරීම<br>3. දෙපාර්තමේන්තු වෙබ් අඩවියෙහි ලිපි පළ කිරීම<br>4. දෙපාර්තමේන්තුවේ නිලධාරීන් වෙත රාජකාරි ඉටු කිරීමේ දෙමුහුම් ක්‍රමවේදය (Hybrid System) හඳුන්වා දීම |

5. රාජ්‍ය සේවයේ සේවක සංඛ්‍යාව ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා රාජ්‍ය නිලධාරීන් විදේශ රැකියා සඳහා යොමු කිරීමේ වැඩසටහනට අදාළ සංකල්ප පත්‍රිකාව ඉදිරිපත් කිරීම

6. තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය මඟින් මෙහෙයවනු ලැබූ YouthCan Innovation තරඟාවලියේ තාක්ෂණ හා නව නිපැයුම් අංශ තරඟාවලියට අදාළ අයදුම්පත් YouthCan Innovation නවෝත්පාදක ඇගයුම් කමිටු සාමාජික නියෝජිතයින්ගේ අනුග්‍රාහකත්වයෙන් සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම

**තොරතුරු තාක්ෂණ කටයුතු**

1. ශ්‍රම වෙළඳපොළ තොරතුරු පද්ධතියක් ස්ථාපිත කිරීමට කොරියානු රජය විසින් ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරගෙන යනු ලබන අතර, එයට අවශ්‍ය තාක්ෂණික සහාය ලබා දීම (Documentation work and participation for the meetings)

2. දෙපාර්තමේන්තුව තුළ කළමනාකරණ තොරතුරු පද්ධතියක් (MIS) සෑදීම සිදුකරනු ලබන අතර එයට අවශ්‍ය තොරතුරු හා සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම

3. දෙපාර්තමේන්තු වෙබ් අඩවියට අදාළ යාවත්කාලීන කටයුතු සිදු කිරීම සහ Procons ආයතනය (Developer) සහ ICTA ආයතනය සමඟ කටයුතු කිරීම

4. දිස්ත්‍රික් නිලධාරීන් වෙතින් යාවත්කාලීන වූ රැකියා අපේක්ෂිත විස්තර ලබා ගැනීමට මාර්ගගත ක්‍රමවේදයක් සකස් කර තිබීම

5. මාර්ගගත වැඩසටහන් සඳහා පහසුකම් සැලසීම

6. දෙපාර්තමේන්තුවේ සමාජ මාධ්‍ය (Facebook, YouTube, LinkedIn හා Tik Tok) ප්‍රවර්ධනය කිරීම හා පවත්වාගෙන යාම

7. දෙපාර්තමේන්තු රාජකාරි කටයුතු 80%ක් පමණ මාර්ගගත ක්‍රමයට සිදු කිරීම තුළ පරිශ්‍රයේ කඩදාසි භාවිතය අවම කිරීම

8. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ එක් එක් අංශවල නිලධාරීන් පරිහරණය කරන Desktop පරිගණක යන්ත්‍ර, Laptop පරිගණක යන්ත්‍ර හා මානව සම්පත් කළමනාකරණ හා ජාත්‍යන්තර සබඳතා ඒකකයේ භාණ්ඩ තීරුකේත අංකගත (bar- code) කිරීමේ ක්‍රියාවලිය සිදු කිරීම

| | |
|---|---|
| ජාත්‍යන්තර සබඳතා | 1. ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ (ILO) සහයෝගය ඇතිව ආරම්භ කරන ලද ආබාධිත ප්‍රජාව රැකියාගත කිරීමේ වැඩසටහනෙහි උතුරු පළාත් ආරම්භක වැඩසටහන 2022/03/31 දින සිදු කිරීම<br><br>2. ශ්‍රම වෙළඳපොළ තොරතුරු පද්ධතියක් ස්ථාපිත කිරීමේ අරමුණින් කොරියානු ජනරජයේ KEIS ආයතනය සමඟ එක් වී උපාය මාර්ගික සැලසුම් පද්ධතිය (ISP - Information Strategic Planning) 2022 වසර තුළදී සිදු කරන ලදී<br><br>3. රැකිරක්ෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක මට්ටමට ගෙන ඒමට කටයුතු කරමින් පවතින අතර රැකිරක්ෂා ප්‍රතිපත්තිය හා මානව සම්පත් සංවර්ධනයට අදාළ දේශීය, විදේශීය ආයතන සමඟ අඛණ්ඩව සබඳතා ගොඩ නගා ගනිමින් ඉදිරි කටයුතු සඳහා සැලසුම් කිරීම<br><br>4. ජාත්‍යන්තර කම්කරු සංවිධානය සමඟ එක්ව කොවිඩ් - 19 වසංගතයෙන් පීඩාවට පත් වූ ශ්‍රී ලාංකික විගමනික ශ්‍රමිකයින් ඵලදායි රැකියාවලට යොමු කිරීම, කුසලතා සංවර්ධන පුහුණු සඳහා යොමු කිරීම, මෘදු කුසලතා සංවර්ධනයට යොමු කිරීම හා ව්‍යවසායකයින් බවට පත් කිරීමේ අරමුණින් ව්‍යාපෘතියක් ආරම්භ කරන ලදී. මේ යටතේ ප්‍රතිලාභීන් 9,763කට අවශ්‍ය මඟ පෙන්වීම් සිදු කර ඇති අතර අමාත්‍යාංශයේ විදේශ රැකියා අංශය, ජාතික යොවුන් සේනාංකය සහ කුඩා ව්‍යාපාර සංවර්ධන අංශය සමඟ ඒකාබද්ධව ක්‍රියාත්මක කරන ලද මෙම ව්‍යාපෘතිය 2022/10/31 දින අවසන් කරන ලදි<br><br>5. ජාත්‍යන්තර කම්කරු සංවිධානය සමඟ සහයෝගය ඇතිව නැගෙනහිර පළාතේ ආබාධිත ප්‍රජාව රැකියාගත කිරීමේ වැඩසටහන වෙනුවෙන් ආයතනයේ නිලධාරීන්ගේ ධාරිතාව ගොඩ නැගීම සහ ආබාධිත ප්‍රජාව රැකියා සඳහා යොමු කිරීමේ අරමුණින් ව්‍යාපෘතියක් 2022 දෙසැම්බර් සිට 2023 මාර්තු දක්වා පවත්වා ගෙන යාමට සැලසුම් කිරීම<br><br>6. ජපාන ජනරජයේ විදේශ රැකියා පුරප්පාඩු ඉලක්ක කර ගනිමින් ජාතික යොවුන් සේනාංකය සමඟ ජපන් භාෂා පුහුණු වැඩසටහන් ආරම්භ කිරීම |

## 5. මහජන රැකියා සේවා කටයුතු

- රැකියා අපේක්ෂිතයින් හා රැකියා සපයන ආයතන ලියාපදිංචි කර එම ආයතනවල පවත්නා රැකියා පුරප්පාඩු සඳහා සුදුසු රැකියා අපේක්ෂිතයින් රැකියාගත කිරීමට කටයුතු කිරීම

- ප්‍රධාන කාර්යාලයේ මහජන රැකියා සේවා අංශය විසින් Whatsapp සමූහය මඟින් සපයනු ලබන සති අග සිළුමිණ, ලංකාදීප, Sunday Observer, වීරකේසරී (දමිළ) යන පුවත්පත්වල සදහන් රැකියා ඇබෑර්තු ප්‍රසිද්ධ කිරීම හා රැකියා අපේක්ෂිතයින් රැ කියාගත කිරීම. එමගින් 2021 වසරට සාපේක්ෂව පුවත්පත් මිළදී ගැනීම සඳහා වෙන්කළ ප්‍රතිපාදන රු. ලක්ෂයකට වඩා වැඩි මුදලක් ඉතිරි කර ගැනීමට හැකිවිය

- ජනාධිපති කාර්යාලය මඟින් යොමුකරන ලද රැකියා ඉල්ලීම් 495ක් පුද්ගලික අංශයේ රැකියා අවස්ථා ලබාදීම සඳහා අදාළ දිස්ත්‍රික් මහජන රැකියා සේවා මධ්‍යස්ථාන වෙත යොමුකිරීමට කටයුතු කළ අතර, එහි ප්‍රගතිය ජනාධිපති කාර්යාලය වෙත ලබාදීමට කටයුතු කිරීම

- අග්‍රාමාත්‍ය කාර්යාලය මඟින් යොමුකරන ලද රැකියා ඉල්ලීම් 386ක් පුද්ගලික අංශයේ රැකියා අවස්ථා ලබාදීම සඳහා අදාළ දිස්ත්‍රික් මහජන රැකියා සේවා මධ්‍යස්ථාන වෙත යොමු කිරීමට කටයුතු කළ අතර, එහි ප්‍රගතිය අග්‍රාමාත්‍ය කාර්යාලය වෙත ලබාදීමට කටයුතු කිරීම

- පෙර පාසල් ගුරුවරුන්, පාසල් ගුරුවරුන්, තරුණ තරුණියින්, ව්‍යවසායකත්ව ප්‍රජාව හා පවුල ඉලක්ක කර ගනිමින් සතියේ දින පහ තුළ රාත්‍රී 8.00 සිට 9.00 දක්වා Zoom තාක්ෂණ ඔස්සේ අදාළ ක්ෂේත්‍රවල ප්‍රවීණයන්ගේ සම්පත් දායකත්වයෙන් Life talk නමින් බුද්ධිමය හා දැනුවත් කිරීමේ වැඩසටහන් මාලාවක් ක්‍රියාත්මක කිරීම

- ප්‍රධාන පෙළේ පුද්ගලික ආයතන, ජාතික හා ප්‍රාදේශීය වාණිජ මණ්ඩල සහ ව්‍යාපාරික සමූහ සමඟ සහයෝගිතාවය ගොඩනගාගැනීමත් ඒ තුළින් පවතින රැකියා ඇබෑර්තු සඳහා රැකියා අපේක්ෂිතයින් යොමුකිරීමේ විශේෂ වැඩසටහන් මාලාවක් ක්‍රියාත්මක කිරීම

- ක්‍රියාත්මක කරනු ලබන මහජන රැකියා සේවා කටයුතු වඩාත් කාර්යක්ෂම හා ඵලදායි තත්වයට පත්කිරීම සඳහා පුද්ගලික අංශය සමඟ අත්දැකීම් හුවමාරු කර ගැනීම සඳහා වැඩමුළුවක් පැවැත්වීම.(ජෝන් කීල්ස් ආයතනය)

- වෘත්තීය පුහුණු පාඨමාලා හා රැකියා අවස්ථා සම්බන්ධයෙන් රැකියා අපේක්ෂිතයින් දැනුවත් කිරීම සහ ඒ සඳහා රැකියා අපේක්ෂිතයින් යොමුකිරීම

  දේශීය රැකියා අවස්ථා සහ වෘත්තීය පාඨමාලා සහ විෂයන් පිළිබඳ පවතින ගැටලු සම්බන්ධයෙන් තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව (TVEC) සමඟ සාකච්ඡා පැවැත්වීම හා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම

- 2020 වසරේ අ.පො.ස (සා.පෙළ) සඳහා පෙනී සිට අ.පො.ස (උ.පෙළ) සඳහා පෙනී සිටීමට සුදුසුකම් නොලද 80,000 කට ආසන්න සිසුන් අතරින් ප්‍රතිචාර දක්වන ලද සිසුන් 30,000ක් සම්බන්ධයෙන් වෘත්තීය මාර්ගෝපදේශ ලබාදීම, වෘත්තීය මඟපෙන්වීම හා රැකියාගත කිරීම.

## 6. රැකියාපොළ වැඩසටහන්

**වගුව 2.15** රැකියාපොළ වැඩසටහන් - මී.හා රැ.දෙපා

| අනු අංකය | දිස්ත්‍රික්කය | සහභාගී වූ ආයතන සංඛ්‍යාව | සහභාගී වූ රැකියා අපේක්ෂිතයන් සංඛ්‍යාව | රැකියා ගැලපීමේ සංඛ්‍යාව | රැකියාගත කිරීමේ සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| 01 | ගාල්ල | 16 | 1,257 | 644 | 644 |
| 02 | යාපනය | 42 | 734 | 510 | 15 |
| 03 | මාතලේ | 5 | 82 | 65 | - |
| 04 | මන්නාරම | 8 | 36 | 11 | 7 |
| 05 | මඩකලපුව | 5 | 128 | 40 | 5 |
| 06 | පුත්තලම | 37 | 2,000 | 750 | - |
| 07 | මාතර | 13 | 167 | 138 | - |
| 08 | කළුතර | 9 | 217 | - | 16 |
| 09 | පුත්තලම | 52 | 1,550 | 598 | - |
| 10 | කොළඹ | 15 | 92 | 150 | 28 |
| 11 | කුරුණෑගල | 20 | 750 | 315 | 204 |
| 12 | පොළොන්නරුව | 14 | 262 | - | - |
| 13 | බදුල්ල | 16 | 427 | 395 | 21 |
| 14 | ගම්පහ | 12 | 202 | 125 | - |
| 15 | මහනුවර | 10 | 125 | 82 | - |
| 16 | වවුනියාව | 11 | 33 | 14 | 3 |
| 17 | මොණරාගල | 6 | 85 | 46 | 13 |
| 18 | රත්නපුර | 10 | 71 | - | - |
| **එකතුව** | | **301** | **8,218** | **3883** | **956** |

## 7. වෘත්තීයපොළ වැඩසටහන්

| අනු අංකය | දිස්ත්‍රික්කය | සහභාගී වූ ආයතන සංඛ්‍යාව | සහභාගී වූ පුහුණුලාභීන් සංඛ්‍යාව | පුහුණුව සඳහා යොමු කළ සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 1 | අම්පාර | 7 | 192 | 43 |
| 2 | හම්බන්තොට | 10 | 142 | 119 |
| 3 | ත්‍රිකුණාමලය | 10 | 173 | 118 |
| 4 | මාතලේ | 3 | 32 | 32 |
| 5 | පුත්තලම | 1 | 480 | - |
| 6 | යාපනය | 5 | 164 | 30 |
| 7 | කෑගල්ල | 10 | 82 | 12 |
| 8 | කිලිනොච්චිය | 8 | 208 | - |
| 9 | මඩකලපුව | 4 | 29 | 14 |
| 10 | පොළොන්නරුව | 8 | 262 | - |
| 11 | වවුනියාව | 19 | 395 | - |
| **එකතුව** | | **85** | **2,159** | **368** |

## 8. මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව සිදුකරන ලද වෙනත් වැඩසටහන්

| අ. අ. | කාර්යය | ප්‍රගතිය |
|---|---|---|
| 01 | Career Guidance Right for Every Child සංකල්ප පත්‍රිකාව ක්‍රියාත්මක කිරීම | සෑම ළමයෙකුටම සිය ජීවිතයේ අධ්‍යාපන හා වෘත්තීය තීරණ ගැනීමේ ක්‍රියාවලියට සහය දීම අත්‍යවශය වේ. එයට හේතුව වේගයෙන් වෙනස්වන ලෝකය තුළ වැඩ ලෝකයට ඵලදායි පුද්ගලයෙකු ලෙස බිහි කිරීම අත්‍යවශ්‍ය වන බැවිනි. ඒ සඳහා සිය ජීවිතයේ විධිමත් ලෙස අධ්‍යාපන හා වෘත්තීය තීරණ ගැනීමේදී සෑම ළමයෙකුටම වෘත්තීය මාර්ගෝපදේශ සේවා ලබාදීමේ යෝජනාව සකස් කිරීම |
| 02 | වෘත්තීය යතුර (Career Key Test) හා බහුවිධ බුද්ධි න්‍යාය (MI) මනෝමිතික පරීක්ෂණ මාර්ගගතව පැවැත්වීමට හැකිවන පරිදි ස්වයංක්‍රීයකරණය කිරීම | මෙම සේවාව භෞතිකව ලබාදීමේදී පත්‍රිකා සඳහා ඉහළ පිරිවැයක් දරණ බැවින් එම පිරිවැය අවම කරමින් ඉහළ ඵලදායිතාවයෙන් යුතුව වැඩි ප්‍රමාණයකට ප්‍රතිලාභ ලබා ගැනීමට හැකිවන සේ සකස් කර ඇත |
| 03 | FAQ වැඩසටහන | වෘත්තීය මාර්ගෝපදේශයට සම්බන්ධ විවිධ ක්ෂේත්‍රවල අධ්‍යාපනික හා වෘත්තීය තොරතුරු පිළිබඳ සිසුන්ගේ දැනුම වර්ධනය කිරීම අරමුණු කරගනිමින් ක්‍රියාත්මක වන එම වැඩසටහනෙහි මූලික කටයුතු අවසන් කර ඇත |
| 04 | Skill Scan Clinic වැඩ සටහන | රාජ්‍ය අංශයේ නිලධාරින්ගේ දරුවන්හට, අ.පො.ස. (උසස් පෙළ) සඳහා සුදුසුකම් නොලද සිසුන් සඳහා හා සේවාලාභීන්ට අධ්‍යාපනික හා වෘත්තීය තීරණ ගැනීමට සහය වීම සඳහා මෙම වැඩසටහන සකස් කර ඇත. 2023 වර්ෂයේ මුල් සති දෙක තුළ පැවැත්වීමට නියමිත මෙම වැඩසටහනෙහි මූලික කටයුතු අවසන් කර ඇත |
| 05 | ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණු වැඩසටහන - දිවයින පුරා | වර්ෂය තුළ පුහුණු වැඩසටහන් 1,156 ක් පවත්වා ඇත |



ඡායාරූපය 2.5 එක්සත් රාජධානියේ වෘත්තිය සමිති නියෝජිත හමුව

**2.2.17 වඩා හොඳ කාර්මික සබඳතා සඳහා ත්‍රෛපාර්ශවීය හවුල්කරුවන් දැනුවත් කිරීම**


**1 කම්කරු නීතිය, කාර්මික සබඳතා සහ මානව සම්පත් සංවර්ධනය පිළිබඳ අධ්‍යාපනය**

**ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය** (NILS) සිය අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා කම්කරු නීතිය හා කාර්මික සබඳතා, මානව සම්පත් කළමනාකරණය සහ වැඩබිම් ඵලදායිතාව යන ප්‍රධාන විෂය ක්ෂේත්‍රයන් තුන ඔස්සේ පාඨමාලා පවත්වනු ලබයි. එසේම එම පාඨමාලා භාෂා ත්‍රිත්වයෙන්ම ගුණාත්මක සේවාවක් ලෙස රාජ්‍ය අංශය හා පෞද්ගලික අංශයේ සේවාලාභීන් වෙත ලබා දීමට ආයතනය මේ වනවිට කටයුතු කරනු ලැබේ. ඩිප්ලෝමා හා කෙටිකාලීන පාඨමාලා, සහතික පත්‍ර, පුහුණු සහ වැඩමුළු වශයෙන් මෙම පාඨමාලා පැවැත්වේ.

**වගුව 2.16** පුහුණු වැඩසටහන්වල භෞතික ප්‍රගතිය - ජා.ශ්‍ර.අ.ආ.

| | වැඩසටහන් වර්ගය | පැවැත්වීමට සැලසුම් කළ වැඩසටහන් ගණන | පැවැත් වූ වැඩසටහන් ගණන |
|---|---|---|---|
| 01 | ඩිප්ලෝමා පාඨමාලා | 6 | 6 |
| 02 | සහතික පත්‍ර පාඨමාලා | 12 | 11 |
| 03 | බාහිරගත පුහුණු පාඨමාලා | 1 | 0 |
| 04 | වැඩමුළු | 2 | 2 |
| 05 | එක්දින වැඩසටහන් | 40 | 37 |
| 06 | දෙදින වැඩසටහන් | 19 | 12 |
| 07 | තෙදින වැඩසටහන් | 4 | 1 |
| 08 | සකස් කළ පාඨමාලා | 12 | 37 |
| 09 | සුනිසි මෙහෙවර ව්‍යාපෘතිය යටතේ වැඩසටහන් | 3 | 8 |

- **පුහුණු වැඩසටහන්වලින් ලද ආදායම**




**ප්‍රස්තාරය 2.9** පුහුණු වැඩසටහන්වලින් ලද ආදායම - ජා.ශ්‍ර.අ.ආ.

- **විභාග**

ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය විසින් රාජ්‍ය අංශයේ, සංස්ථා සහ ව්‍යවස්ථාපිත ආයතනයන්හි මෙන්ම පෞද්ගලික අංශයේ ආයතනයන්හි ඉල්ලීම් මත කාර්ය මණ්ඩල බඳවා ගැනීම් විභාග, කාර්යක්ෂමතා කඩඉම් විභාග, ඇගයීම් සහ සේවා උසස් කිරීම් සඳහා වූ විභාග ආයතනික අවශ්‍යතාව මත පවත්වනු ලබයි. 2022 වසරේ අවසානය වන විට ආයතනය මගින් විභාග 34ක් පවත්වා ඇති අතර බාහිර ආයතන වෙනුවෙන් සිදු කරන ලද විභාග වෙනුවෙන් රුපියල් මිලියන 7.5ක ආදායමක් උපයා ඇත. මේ සඳහා අයදුම්කරුවන් 2,153ක ප්‍රමාණයක් සහභාගි වී ඇත.

**වගුව 2.17** 2022 වර්ෂයේදී සිදු කරන ලද විභාග සම්බන්ධ තොරතුරු - ජා.ශ්‍ර.අ.ආ.

| | 2021.12.31 දිනට | 2022.12.31 දිනට |
|---|---|---|
| පවත්වන ලද විභාග ගණන | 42 | 34 |
| අපේක්ෂකයින් සංඛ්‍යාව | 3,690 | 2,153 |
| **මුළු ආදායම (රු.)** | **7,226,466.01** | **7,582,972.90** |

## 2.2.18 වෘත්තීය ආරක්ෂාව සහ සෞඛ්‍ය වැඩි දියුණු කිරීම

සේවා ස්ථානවල සිදුවන වෘත්තීය අනතුරු අවම කිරීම සඳහා **ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය (NIOSH)** වෘත්තීය සුරක්ෂිතතා නිලධාරීන් පුහුණුව සඳහා ඩිප්ලෝමා පාඨමාලාවන්, සහතික පත්‍ර පාඨමාලාව මෙන්ම වෘත්තීය සුරක්ෂිතතාවය හා ආරක්ෂාව සම්බන්ධයෙන් විවිධ පාඨමාලාවන් පවත්වනු ලබයි.

වැඩබිමෙහි ආරක්ෂාව හා සෞඛ්‍ය වෙනුවෙන් වාතයේ තත්ත්වය සමීක්ෂණය කිරීම හා දුම් පරීක්ෂා කිරීම, කර්මාන්තශාලා තුළ දූවිලි මට්ටම් සමීක්ෂණය කිරීම, ඝෝෂා මට්ටම සමීක්ෂණය කිරීම හා ශබ්ද මැනීම, උෂ්ණත්ත්ව මට්ටම සමීක්ෂණය කිරීම ආදි පාරිසරික මිනුම් ලබා ගන්නා අතර අවදානම් හඳුනා ගැනීම සඳහා ඇගයීම් සිදුකරනු ලබයි. 2022 වර්ෂයේදී අවදානම් ඇගයීමේ සමීක්ෂණ 181 සිදු කළ ඇති අතර එහි දළ ආදායම රු.මි. 12.03 පමණ වේ.

එමෙන්ම, සේවයේ නිරතවන්නන්ට සේවය සඳහා සුදුසු සෞඛ්‍ය මට්ටමක් පවතී ද පරීක්ෂා කිරීම උදෙසා පුද්ගලයන්ගේ ශ්‍රවණ තත්ත්වය මැනීමේ පරීක්ෂණ, රුධිර විශ්ලේෂණය, වැඩ




**ඡායාරූපය 2.6** ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය සම්මන්ත්‍රණය

කිරීමට යෝග්‍යතාව තක්සේරු කිරීම, පෙනහළු ක්‍රියාකාරිත්වය පිළිබඳ පරීක්ෂණ, දෘෂ්ටි පරීක්ෂණ සිදුකිරීම ආදී වෛද්‍ය පරීක්ෂණ සිදු කරනු ලැබේ.

ආයතනය විසින් 2022 වර්ෂය තුළ සිදු කරන ලද වැඩසටහන්වල ප්‍රගතිය පහත පරිදි වේ.

**වගුව 2.18** වෘත්තීය ආරක්ෂාව සහ සෞඛ්‍ය වැඩි දියුණු කිරීම සඳහා සිදු කළ වැඩසටහන් - ජා.වෘ.සු.හා සෞ.ආ.

| | පාඨමාලාව | පැවැත් වූ පාඨමාලා ගණන | සහභාගී වූ සංඛ්‍යාව | මූල්‍ය ප්‍රගතිය (රු. මි.) |
|---|---|---|---|---|
| 01 | ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව | 4 | 97 | 11.51* |
| 02 | ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව | 4 | 125 | 5.20 |
| 03 | ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය පිළිබඳ පදනම් පාඨමාලාව | 3 | 45 | 0.54 |
| 04 | විධායක ශ්‍රේණි නිලධාරීන් සඳහා වන පාඨමාලාව | 5 | 75 | 1.19* |

* දැනට පවත්වාගෙන යනු ලබන පාඨමාලාවන් සඳහා ලද වාරික මුදල් ද අන්තර්ගත වේ

අමාත්‍ය මණ්ඩලය විසින් සෑම වර්ෂයකම ඔක්තෝබර් මස දෙවන සතිය රැකියාවල නියුක්ත වෘත්තිකයන්ගේ සෞඛ්‍ය හා සුරක්ෂිතතාවය තහවුරු කිරීම හා ප්‍රවර්ධනය කිරීම සඳහා ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය සතිය ප්‍රකාශයට පත් කොට ඇත. එයට සමගාමීව ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය සේවා / සේවක දෙපාර්තමේන්තුවයේ වෘත්තීය සුරක්ෂිතතාවය ඉහළ නැංවීම උදෙසා වෘත්තීය සුරක්ෂිතතාවය පිළිබඳ ප්‍රවීණ දේශීය හා විදේශීය සම්පත්දායකයින්ගේ සහභාගීත්වයෙන් ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය සම්මන්ත්‍රණය 2022 නොවැම්බර් මසදී පවත්වන ලදී.

2022 වර්ෂයේ නොවැම්බර් මස 17 වන දින කොළඹ ගලධාරී හෝටලයේදී "Win Safety Through OSH Management System" යන තේමාව මුල්කරගෙන වෘත්තීය සුරක්ෂිතතා සම්මන්ත්‍රණය පැවැත්විණි. මේ සඳහා ශ්‍රී ලාංකික සේව්‍ය සේවක දෙපාර්තමේන්තුවයම නියෝජනය කරමින් 350කට වැඩි පිරිසකගේ සහභාගීත්වය සිදු විය. මෙහි මූලික අරමුණ වූයේ වෘත්තීකයන්ගේ සේවා සුරක්ෂිතතාවය හා ආරක්ෂාව තහවුරු කිරීම සඳහා අප රට තුළ හා අනෙකුත් ජාත්‍යන්තර රටවල්වල නව තාක්ෂණය හා නව ක්‍රමවේදයන් භාවිතය, සෞඛ්‍ය ප්‍රමිති පිළිබඳ අවබෝධය හා වර්ධනය වැඩිකරමින් සහභාගිවන සමාජිකයන් දැනුවත් කිරීමය.

ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ මූල්‍ය අනුග්‍රහය යටතේ තේ/පොල්/රබර් යන වතු ආශ්‍රිතව සේවය කරන සේවක සේවිකාවන්ගේ වෘත්තීය සුරක්ෂිතතාවය පිළිබඳ සමීක්ෂණයක් කර වාර්තාවක් ඉදිරිපත් කරන ලද අතර ඒ සඳහා රු. 6,264,500/-ක ආදායමක් හිමි විය. මීට අමතරව පහත සඳහන් විශේෂ වැඩසටහන් ද සිදු කරන ලදී.

**වගුව 2.19** වෘත්තීය ආරක්ෂාව සහ සෞඛ්‍ය වැඩි දියුණු කිරීම සඳහා සිදු කළ විශේෂ වැඩසටහන් - ජා.වෘ.සු.හා සෞ.ආ.

| | පාඨමාලාව | සහභාගී වූ සංඛ්‍යාව | මූල්‍ය ප්‍රගතිය (රු.) |
|---|---|---|---|
| 01 | කොළඹ මහ නගර සභාවේ තාක්ෂණික නිලධාරීන් සඳහා සහතිකපත් පාඨමාලාව | 30 | 727,500.00 |
| 02 | කොළඹ මහ නගර සභාවේ ඉංජිනේරු නිලධාරීන් සඳහා සහතික පත් පාඨමාලාව | 15 | 202,500.00 |

| | | | |
|---|---|---|---|
| 03 | කොළඹ මහ නගර සභාවේ සුළු සේවකයින් සඳහා සහතිකපත් පාඨමාලාව | 600 | 3,150,000.00 |
| 04 | ආයෝජන මණ්ඩලයේ විධායක ගණයේ නිලධාරීන් සඳහා වූ වෘත්තීය සුරක්ෂිතතා පාඨමාලාව (සුනිසි මෙහෙවර වැඩසටහන යටතේ) | විධායක නිලධාරීන් | 3,454,500.00 |
| 05 | Surado ආයතනය සම්බන්ධීකරණයෙන් පවත්වනු ලබන සාත්තු සේවකයින් සඳහා වෘත්තීය සුරක්ෂිතතා සහතික පත් පාඨමාලාව | 261 | 1,305,000.00 |

### 2.2.19 කම්කරු දෙපාර්තමේන්තුවේ මානව සම්පත් සංවර්ධනය

කම්කරු දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩල අවශ්‍යතා හඳුනා ගැනීම, අවශ්‍යතාවය පරිදි බඳවා ගැනීම් සිදු කිරීම, නිලධාරීන්ගේ උසස් කිරීම්, කාර්යක්ෂමතා කඩඉම් විභාග පැවැත්වීම්, කාර්යසාධනය ඇගයීම, වැටුප් වර්ධක ලබා දීම, ස්ථාන මාරු කිරීම්, නිලධාරීන් විශ්‍රාම ගැන්වීම, නිලධාරීන්ගේ නිවාඩු කටයුතු සහ කාර්ය මණ්ඩලයේ විනය කටයුතු යන දෛනික කාර්ය මණ්ඩල පරිපාලන කටයුතු සිදු කරන ලදී.

දේශීය පුහුණු වැඩසටහන් සඳහා 2022 වර්ෂය සඳහා රු. 5,800,000.00ක ප්‍රතිපාදන ප්‍රමාණයක් ලැබී තිබුණි. එයින් 2022.12.31 දිනට වියදම රු. 5,311,943ක් වන අතර වියදම ප්‍රතිපාදනයන්ගේ ප්‍රතිශතයක් ලෙස ගත් කල 92%කි. මේ සම්බන්ධ තොරතුරු සයවන පරිච්ඡේදයේ දක්වා ඇත.

### 2.2.20 කම්කරු දෙපාර්තමේන්තුවේ යටිතල පහසුකම් සංවර්ධනය

දිවයින පුරා විසිරී සිටින කම්කරු ජනතාවට වඩාත් කාර්යක්ෂම සේවයක් සලසා දීමේ අරමුණ පෙරදැරිව දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි සහ දිවයින පුරා පිහිටි ප්‍රාදේශීය කම්කරු කාර්යාලයන්හි යටිතල පහසුකම් සංවර්ධනයට දෙපාර්තමේන්තුව විසින් කටයුතු කරන ලදී.


ඒ අනුව, අළුතින් ඉදි කරන ලද බදුල්ල සහ හැටන් කම්කරු කාර්යාල ගොඩනැගිලි විවෘත කර කාර්යාල කටයුතු ආරම්භ කරන ලදී.

### 2.2.21 වෘත්තීය අනතුරු සඳහා වන්දි ගෙවීම

සේවා නියුක්තියේදී තුවාල ලබන, රැකියාවේ ස්වභාවය හේතුවෙන් වැළඳෙන රෝගවලට ගොදුරු වන සේවකයන්ට සහ සේවා ස්ථානවල අනතුරු හේතුවෙන් මිය යන ශ්‍රමිකයින්ගේ යැපෙන්නන්ට **කම්කරු වන්දි කොමසාරිස් කාර්යාලය** මඟින් වන්දි ගෙවීමට කටයුතු කරයි. වාර්තා වූ අනතුරු ප්‍රමාණයන් සම්බන්ධ තොරතුරු සහ වන්දි ගෙවා ඇති සංඛ්‍යා පහත පරිදි වේ.


**1. 2022 වර්ෂය තුළ වාර්තා වූ මාරක සහ මාරක නොවන අනතුරු ප්‍රමාණය**

වාර්තා වූ මාරක අනතුරු ප්‍රමාණය - 180




**ප්‍රස්තාරය 2.10** වාර්තා වූ මාරක අනතුරු ප්‍රමාණය

වාර්තා වූ මාරක නොවන අනතුරු ප්‍රමාණය - 182




**ප්‍රස්තාරය 2.11** වාර්තා වූ මාරක නොවන අනතුරු ප්‍රමාණය

## 2. 2022 වර්ෂය තුළ වාර්තා වූ මාරක සහ මාරක නොවන අනතුරුවල ස්වභාවය

**වගුව 2.20** වාර්තා වූ මාරක සහ මාරක නොවන අනතුරුවල ස්වභාවය


| අනතුරෙහි ස්වභාවය | මාරක අනතුරු | මාරක නොවන අනතුරු |
|---|---|---|
| උස් ස්ථානයකින් ඇදවැටීමක් | 30 | 16 |
| විදුලිසැර | 10 | 02 |
| ගිනි / රසායනික ද්‍රව්‍ය / අපද්‍රව්‍ය | 02 | 03 |
| කම්හල් යන්ත්‍ර සූත්‍ර සහ වෙනත් යන්ත්‍ර | 07 | 79 |
| රිය අනතුරු | 48 | 16 |
| සතුන්ගෙන් | 04 | 01 |
| ලිස්සායාම / වැටීම හෝ ගැටීම | 04 | 30 |
| වෙනත් ද්‍රව්‍ය පුද්ගලයා මතට පතිතවීම | 21 | 11 |
| ජල | 05 | 01 |
| අසනීප / වෙනත් | 49 | 23 |
| එකතුව | 180 | 182 |

## 3. 2022 වර්ෂය තුළ වාර්තා වූ මාරක නොවන අනතුරුවල හානියේ ස්වභාවය

**වගුව 2.21** වාර්තා වූ මාරක නොවන අනතුරුවල හානියේ ස්වභාවය

| හානිය | අනතුරු ප්‍රමාණය |
|---|---|
| තාවකාලික සුළු තුවාල | 66 |
| පිළිස්සීම් | - |
| ඇඟිලි අහිමිවීම් | 19 |
| අස්ථි බිඳීම් | 27 |
| අත / අත්ලේ කොටස් ඉවත්කිරීම් | 14 |
| කොන්ද / සුෂුම්නාවට හානි | 09 |
| පා ඇඟිලි / පාද අහිමිවීම් | 24 |
| ඇසට හානිවීම | 08 |
| වෙනත් | 15 |
| එකතුව | 182 |

## 4. සංචාරක අධිකරණ ප්‍රදේශ අනුව වාර්තා වූ අනතුරු ප්‍රමාණය




**ප්‍රස්තාරය 2.12** සංචාරක අධිකරණ ප්‍රදේශ අනුව වාර්තා වූ අනතුරු ප්‍රමාණය

## 5. වන්දි ගෙවීමේ කටයුතුවල ප්‍රගතිය

**වගුව 2.22** වන්දි ගෙවීමේ කටයුතුවල ප්‍රගතිය

| ක්‍රියාකාරකම | භෞතික | | මූල්‍ය (රු. මිලි.) | |
|---|---|---|---|---|
| | අපේක්ෂිත සංඛ්‍යාව | තත්‍ය සංඛ්‍යාව | අපේක්ෂිත සංඛ්‍යාව | තත්‍ය සංඛ්‍යාව |
| අවසන් කළ මාරක හා මාරක නොවන නඩු ගොනු ගණන | 300 | 385 | 120 | 183.1 |
| ගිවිසුම් | 80 | 61 | 7 | 9.1 |
| ආරම්භ කළ බාල වයස්කාර ගිණුම් | 100 | 129 | 20 | 49.7 |
| නිදහස් කළ බාල වයස්කාර ගිණුම් | 150 | 184 | 20.2 | 31.8 |

### 2.2.22 රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ඵලදායිතාව ප්‍රවර්ධනය කිරීම

ශ්‍රී ලංකාවේ රාජ්‍ය සහ පෞද්ගලික අංශයන්හි වඩාත් කාර්යක්ෂම හා ගුණාත්මක සේවා සැපයීමක් සඳහා **ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය** විසින් ඵලදායිතා ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලැබේ. සේවාලාභින් ආයතන පරිශ්‍රය තුළ රැඳී සිටීමේ කාලය අවම කිරීම සඳහා සුදුසු ක්‍රමවේද සැකසීමත්, ඒ තුළින් ආයතනික කාර්යක්ෂමතාවය සහ සඵලතාවය ඉහළ නැංවීම සහ සතුටුදායක හා කාර්යක්ෂම පාරිභෝගික සේවා ක්‍රියාවලි වර්ධනය කිරීම සඳහා වර්තමානයේ භාවිතා වන පාරිභෝගික සේවා ක්‍රියාවලි විශ්ලේෂණය කිරීම, පාරිභෝගික හා සේවක තෘප්තිය පිළිබඳ සංගණනයක් සිදුකිරීම, ඉහළ කළමනාකාරිත්වය සහ කාර්ය මණ්ඩලය සමඟ සාකච්ඡා සිදුකිරීම හා ක්‍රියාවලි සංශෝධන

ඇතුළත් වාර්තාවක් ඉහළ කළමනාකාරීත්වය වෙත යොමුකිරීම තුළින් අදාළ වැඩිදියුණු කිරීම් සිදුකරනු ලැබේ. ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය විසින් 2022 වර්ෂය තුළ අත්කරගත් ප්‍රගතිය පහත පරිදි වේ.

- ඵලදායිතාව පිළිබඳ ඩිප්ලෝමා වැඩසටහන

දිවයින පුරා පිහිටි රාජ්‍ය හා පෞද්ගලික අංශයන්හි සේවයේ නියුතු පිරිස් සඳහා එක් අවුරුදු ඩිප්ලෝමා පාඨමාලාවක්, 54 දෙනෙකුගේ සහභාගිත්වය සහිතව ක්‍රියාත්මක කරන ලදී. දේශන, ක්ෂේත්‍ර අධ්‍යයන චාරිකා, ආසියානු ඵලදායිතා සංවිධානය මඟින් ක්‍රියාත්මක මාර්ගගත පාඨමාලා, අවසාන වාර පරීක්ෂණය සහ ව්‍යාපෘති හා සම්බන්ධ ප්‍රායෝගික පරීක්ෂණ යන කාණ්ඩයන් තුළින් මෙය ක්‍රියාත්මක විය. සුදුසුකම් ලත් පිරිස් වෙත ඩිප්ලෝමා සහතික පත්‍ර ප්‍රදානෝත්සවය කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශ ලේකම්වරයාගේ ප්‍රධානත්වයෙන් 2022.12.14 දින ශ්‍රී ලංකා පදනම් ආයතනයේදී පවත්වන ලදී.

- නවක ඵලදායිතා සංවර්ධන නිලධාරීන් සඳහා පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන

ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය වෙත අනුයුක්ත වූ නවක නිලධාරීන් සඳහා ප්‍රායෝගික හා න්‍යායාත්මක දැණුම ලබාදීම සහ ආකල්ප හා කුසලතා සංවර්ධනය අරමුණු කර ගනිමින් මෙම වැඩසටහන පවත්වන ලදී. දින 40ක් පුරාවට විවිධ විෂයන් පිළිබඳ දැනුවත්වීම් ලබාදුන් අතර, සුදුසුකම් ලත් නිලධාරීන් 146 දෙනෙක් සඳහා 2023.01.18 දින සහතික පත්‍ර ප්‍රදානෝත්සවය සිදුකරන ලදී.

- පාසල් සිසුන් සඳහා ඵලදායිතාවය හා ගුණාත්මක කළමනාකරණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව

බදුල්ල, ගාල්ල, මාතර, කුරුණෑගල, කෑගල්ල, මහනුවර, මාතලේ, ගම්පහ යන දිස්ත්‍රික්කවල මෙම පාඨමාලාව පවත්වන ලද අතර, 2022 වසරේදී සිසුන් 2,542ක් මෙම වැඩසටහන සඳහා සහභාගී වූහ. පාසල් ප්‍රජාව මෙම වැඩසටහන් කෙරෙහි අනුගත කිරීම තුළින් ඵලදායී සංස්කෘතියක් බිහිකිරීමට හැකියාව ලැබෙන බැවින්, මෙවන් වැඩසටහන් ප්‍රවර්ධනය කිරීම අවශ්‍ය වේ.

- කුඩා පරිමාණ ව්‍යවසායක සංවර්ධන වැඩසටහන

සුළු පරිමාණ ව්‍යවසායක ප්‍රජාව සවිබල ගැන්වීම තුළින් ආර්ථික ක්‍රියාවලියට සවියක් ලබාදීමේ අරමුණින් මෙම වැඩසටහන 2021 හා




ඡායාරූපය 2.7 ජාතික ඵලදායිතා සම්මාන උළෙල

2022 වසර තුළදී ක්‍රියාත්මක කරන ලදී. එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකින් පවුල් 20 බැගින් තෝරාගෙන ඇති අතර, මේ වනවිට පවුල් 6620ක් ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය සමඟ අත්වැල් බැඳගෙන ඇත. 2022 වසර තුළදී දැනුවත් කිරීමේ වැඩසටහන්, පුහුණු වැඩසටහන් හා නියාමන වැඩසටහන් 39ක් ක්‍රියාත්මක කර ඇති අතර, ආර්ථික, සමාජයීය, හා පාරිසරික තත්ව වර්ධනය තුලින් ජීවන තත්වය නඟා සිටුවීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම ඉදිරි වසර තුළදීද සිදුවනු ඇත.

- **ආසියානු ඵලදායිතා සංවිධානයේ දායකත්වය මත ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම**

**වගුව 2.23** ආසියානු ඵලදායිතා සංවිධානයේ දායකත්වය මත ක්‍රියාත්මක කළ ව්‍යාපෘති - ජා.ඵ.ලේ.කා.

| ව්‍යාපෘතියේ නම | ව්‍යාපෘති කාල සීමාව | ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත වියදම (USD) |
|---|---|---|
| මහියංගන මූලික රෝහලේ කොවිඩ් පර්යේෂණාගාරය ස්ථාපිත කිරීම | මාස 5 | 68,435 |
| තෙල්දෙණිය මූලික රෝහලේ ගුණාත්මක කළමනාකරණ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම | මාස 7 | 21,565 |
| බදුල්ල දිස්ත්‍රික්කය තුළ ගුණාත්මක කොම්පෝස්ට් නිෂ්පාදනය හා භාවිතය | අවු. 1 | 40,000 |
| නවෝත්පාදනය තුළින් ඵලදායිතාවය ඉහළ නැංවීම | මාස 4 | 25,000 |
| ධාරිතා සංවර්ධනය තුළින් තිරසාර අගය එකතු කිරීමේ දාම සඳහා ආහාර සුරක්ෂිතතතාවය හා ගුණාත්මකභාවය වර්ධනය | අවු. 1 | 50,000 |
| **මුළු එකතුව** | | **205,000** |

- **ජාතික ඵලදායිතා සම්මාන ප්‍රදානෝත්සවය පැවැත්වීම**

ජාතික ඵලදායිතා සම්මාන තරඟාවලිය - 2020හි පළවන, දෙවන හා තෙවන ස්ථාන ලබාගත් ජයග්‍රාහකයින් 269 දෙනෙක් සඳහා සම්මාන ප්‍රදානෝත්සවය 2022.12.15 දින ගරු අග්‍රාමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් සහ ගරු කම්කරු හා විදේශ රැකියා අමාත්‍යතුමා ඇතුළු සම්භාවනීය අමුත්තන්ගේ සහභාගිත්වයෙන් අරලියගහ මන්දිරයේදී පවත්වන ලදී. විශේෂ කුසලතා හා කුසලතා ස්ථාන අත්කරගත් ආයතන සඳහා සම්මාන සහ සහතික පත්‍ර ප්‍රදානෝත්සවය පළාත් මට්ටමින් පවත්වන ලදී.

### 2.2.23 ශ්‍රමිකයින්ගේ සුභසාධනය

**ශ්‍රම වාසනා අරමුදල** මඟින් කම්කරු ප්‍රජාවගේ ජීවන තත්ත්වය නංවාලීම සඳහා සුබසාධන වැඩසටහන් පවත්වනු ලැබේ. මේ යටතේ ශ්‍රම වාසනා අරමුදල මඟින් අක්ෂි කඳවුරු, වෛද්‍ය කඳවුරු, මියගිය සේවකයින්ගේ පවුල්වල පාසල් දරුවන්ට ශිෂ්‍යත්ව, පාසල් උපකරණ, ජීවනෝපාය ආධාර සඳහා තාක්ෂණික අධ්‍යාපනය සහ අනෙකුත් සුබසාධන වැඩසටහන් දිවයින පුරා පවත්වනු ලැබේ.

ශ්‍රම වාසනා අරමුදලේ ප්‍රධාන ආදායම් මාර්ගය වන ලොතරැයි ආදායම අඩුවීම හේතුවෙන් වාර්ෂිකව ලැබෙන ආදායම සීඝ්‍රයෙන් පහත වැටීම හා විශේෂයෙන්ම රට තුළ උද්ගත වූ අර්බුදකාරී තත්ත්වය, ඉන්ධන හිඟය හා ආර්ථික පරිහානිය වැනි හේතුන් නිසා 2022 අරමුදලේ කාර්යසාධනය ප්‍රශස්ත මට්ටමට ළඟාකර ගැනීමට නොහැකි විය. ඒ අනුව, 2022 වසරට සැලසුම් කරන ලද වැඩසටහන්, අධ්‍යක්ෂ මණ්ඩලයේ උපදෙස් පරිදි සංශෝධනය කර සිදු කිරීමට තීරණය කරන ලදී.

1. දැනුවත් කිරීමේ වැඩසටහන්

වෘත්තීය අනතුරු වැලැක්වීමේ පූර්ව සූදානමක් ලෙස පසුගිය වසරවල අනතුරු වාර්තා වී ඇති හා අවදානම් තත්ත්වයන් ඇති කර්මාන්තශාලා හඳුනාගෙන ආරක්ෂිතව වැඩ කිරීම පිළිබඳ පුහුණු වැඩමුළු හා දැනුවත් කිරීමේ වැඩසටහන් ඒ පිළිබඳව දැනුමක් ඇති ඉංජිනේරුවරුන් මාර්ගයෙන් සිදුකරන ලදී.

එසේම, කම්කරු නීති, අණපනත් පිළිබඳව සේවක සේවිකාවන් මෙන්ම ආයතන හිමිකරුවන්ට පැන නගින ගැටළුකාරි තත්වයන් පිළිබඳ දැනුවත් කිරීමේ අරමුණින් ක්ෂේත්‍රයේ පළපුරුදු සම්පත්දායකවරුන් මාර්ගයෙන් දැනුවත් කිරීමේ වැඩසටහන් සිදු කරන ලදී.

2022 වසර වෙනුවෙන් රුපියල් 585,101.66 මුදලක් වැය කරමින් මෙවැනි වැඩසටහන් 28ක් මුළු දිවයිනම ආවරණය වන පරිදි පවත්වන ලද අතර මේ තුළින් සෘජුවම සේවක සේවිකාවන් 1100 දෙනෙකු ප්‍රතිලාභ හිමිකරගන්නා ලදී.

2. සුබසාධන වැඩසටහන්

කම්කරු පවුල් නඟා සිටුවීම අරමුණු කර අඩු ආදායම්ලාභී කම්කරු පවුල්වල අධ්‍යාපනය ලබන දූ දරුවන් වෙත අධ්‍යාපන ආධාර ලබා දීම මේ යටතේ සිදුකරන ලදී. මෙහිදී දූ දරුවන් 1720 දෙනෙකු ප්‍රතිලාභ ලැබූ අතර ඔවුන් වෙනුවෙන් රුපියල් 8,707,733/- පමණ පාසල් උපකරණ ලබා දෙන ලදී.

3. මරණීය අනතුරු ශිෂ්‍යත්ව වැඩසටහන

කර්මාන්තශාලාවල සිදුවන අනතුරුවලින් මියගිය හෝ පූර්ණ බෙලහීන තත්ත්වයට පත් කම්කරු ජනතාවගේ අධ්‍යාපනය ලබන දූ දරුවන් වෙනුවෙන් මෙම වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි. යම් කර්මාන්තශාලාවක, වැඩබිමක හෝ සේවා ස්ථානයක සිදු වන කාර්මික අනතුරු පිළිබඳ කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරුවරුන් මඟින් ලබාගන්නා තොරතුරු හා කම්කරු වන්දි කොමසාරිස් කාර්යාලය හරහා ලබාගන්නා තොරතුරු පදනම් කරගෙන ප්‍රතිලාභීන් හඳුනාගන්නා අතර මියගිය හෝ පූර්ණ ආබාධිත තත්ත්වයට පත් වන සේවක සේවිකාවන්ගේ අධ්‍යාපනය ලබන දූ දරුවන් (පෙර පාසල් අධ්‍යාපනයේ සිට විශ්ව විද්‍යාල



ඡායාරූපය 2.8 අඩු ආදායම්ලාභී කම්කරු පවුල්වල දරුවන් සඳහා පාසල් උපකරණ ලබා දීම

අධ්‍යාපනය දක්වා එනම්, වයස අවු. 3-25 දක්වා) දරුවන් මේ සඳහා සුදුසුකම් ලබන අතර, මෙම දරුවන් සඳහා රු. 50,000ක ස්ථාවර තැන්පතුවක් හා අධ්‍යාපන උපකරණ ලබා දේ.

වර්තමානයේ රට තුළ පවතින තත්ත්වය හේතුවෙන් ශිෂ්‍යත්ව වැඩසටහනක් ලෙස නොපැවැත් වූ අතර ප්‍රතිලාභීන් වෙත ඔවුන්ට අවශ්‍ය පාසල් උපකරණ කට්ටලය මිලදී ගැනීමට මුදල් ඔවුන්ගේ ගිණුම්වලට බැර කරන ලදී. අනතුරුව එම උපකරණ මිලදී ගත් සත්‍ය බිල්පත ශ්‍රම වාසනා අරමුදල වෙත ලබා ගැනීමෙන් පසු ඔවුන්ට හිමි ස්ථාවර තැන්පතු සහතිකය හා පාසල් පාවහන් වවුචරය ලබා දෙන ලදී. 2022 වර්ෂය තුළ ශිෂ්‍යත්වලාභීන් 68 දෙනෙකු සඳහා ප්‍රතිලාභ ලබා දී ඇති අතර මේ වෙනුවෙන් රුපියල් 4,081,883.75 මුදලක් වැය වී ඇත.

4. නීති ආධාර ලබාදීමේ වැඩසටහන

පෞද්ගලික අංශයේ සේවකයන් අසාධාරණ ලෙස සේවයෙන් ඉවත් කර ඇති අවස්ථාවලදී, පූර්ව දැනුම්දීමකින් තොරව ආයතන වසා දමන අවස්ථාවකදී සහ කම්කරු වන්දි කොමසාරිස් ඉදිරියේ පැමිණිල්ලක් ගොනුකර ඇති අවස්ථාවකදී සේවකයන්ට සහන ලබාදීම වෙනුවෙන් මෙම වැඩසටහන ක්‍රියාත්මක කරයි. 2022 වසර වෙනුවෙන් මේ යටතේ සිදුකරන ලද වැඩසටහන් පහත දක්වා ඇත.

**වගුව 2.24** නීති ආධාර ලබාදීම - ශ්‍රම වාසනා අරමුදල

| වැඩසටහන | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | ලබාදුන් මුදල (රු.) |
|---|---|---|
| නීති ආධාර | 38 | 938,761.85 |
| නීති ආධාර අභියාචනා හා ප්‍රතිශෝධන | 02 | 30,000.00 |
| නීති ආධාර ශිෂ්‍යත්ව | 15 | 147,150.00 |

5. වෛද්‍ය ආධාර ලබාදීමේ වැඩසටහන


සේවයේ යෙදී සිටියදී උද්ගත වූ වෘත්තීය රෝගයකින් / කාර්මික රෝගයකින් පෙලෙන සේවා නියුක්තයන් සඳහා සහන සැලසීම වෙනුවෙන් මෙම වැඩසටහන ක්‍රියාත්මක කරන අතර 2022 වසර තුළ ප්‍රතිලාභීන් 08 දෙනෙකු වෙත රුපියල් 280,000.00 මුදලක් වෛද්‍ය ආධාර ලෙස ප්‍රදානය කර ඇත.

6. සනීපාරක්ෂක ව්‍යාපෘතිය

බදුල්ල දිස්ත්‍රික්කය ඉලක්ක කර මෙම ව්‍යාපෘතිය සිදුකරන ලද අතර මෙහිදී අඩු ආදායම්ලාභී කම්කරු පවුල් තෝරා එම පවුල්වල සනීපාරක්ෂක පහසුකම් වර්ධනය කිරීම සඳහා වැසිකිළි 147ක් ඉදිකිරීමට ශ්‍රම වාසනා අරමුදල රුපියල් 2,774,705/= මුදලක් වැයකර ඇත.

7. ශ්‍රම වාසනා අරමුදලේ වර්ධනය

ශ්‍රම වාසනා අරමුදලේ ප්‍රධාන ආදායම් ප්‍රභවය වන සෙනසුරාදා හා ඉරිදා දිනුම් අදින "ජාතික සම්පත" ලොතරැයිය වන අතර තරඟකාරීව තවත් ලොතරැයි ක්‍රියාත්මක වීමත්, එවැනි විවිධ ලොතරැයි තුලින් පිරිනමන ප්‍රථම ත්‍යාග මුදලේ වටිනාකම ඉතා ඉහළ අගයක් ගැනීම වැනි හේතුවෙන් එවැනි ලොතරැයිවලට සාපේක්ෂව "ජාතික සම්පත" ලොතරැයි ටිකට් පත් අලෙවිය අඩු මට්ටමක පවතී. මෙම තත්ත්වය අරමුදලේ වර්ධනයට අහිතකර ලෙස බලපාන බැවින් ලොතරැයි අලෙවිය වැඩි කර ගැනීම සඳහා ප්‍රචාරණ හා අලෙවි ප්‍රවර්ධන කටයුතු වැඩි කිරීමට තීරණය කර ඇත. එසේම පාරිභෝගිකයන්ට ටිකට්පත් අන්තර්ජාලය හරහා මිලදී ගැනීමට හැකිවන පරිදි පහසු ක්‍රමවේදයන් සැලසුම් කිරීම පිළිබඳව ද සාකච්ඡා කරමින් පවතී.




**ප්‍රස්තාරය 2.13** ශ්‍රම වාසනා අරමුදලේ වර්ධනය

8. ශ්‍රම වාසනා අරමුදල ලබා ගත් විශේෂ ජයග්‍රහණ

- ISO ජාත්‍යන්තර තත්ත්ව සහතිකය දිනා ගැනීම - 2016
- පරිගණකගත තොරතුරු පද්ධතියක් ස්ථාපිත කිරීම
- හොඳම වාර්ෂික වාර්තා හා ගිණුම් තරගයේ තෙවන ස්ථානය හිමිකර ගැනීම - 2019
- ජාතික ඵලදායිතා ඇගයීම් සහතිකය දිනා ගැනීම - 2020


### 2.2.24 විදේශ රැකියා සඳහා ශ්‍රමිකයින් යොමු කිරීම.

**ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සි (පුද්.) සමාගම** විසින් විදේශ රැකියා සඳහා පුද්ගලයින් යොමු කිරීම සිදු කරනු ලබයි. ඒ අනුව, 2022 වර්ෂයේදී විදේශගත වූ ශ්‍රමිකයින් සංඛ්‍යාව 324ක් වේ.




**ඡායාරූපය 2.9** ලියාපදිංචි රැකියා අපේක්ෂිතයින් විදේශ රැකියා සඳහා යොමු කිරීම

**විදේශගත වූ ශ්‍රමිකයින් සංඛ්‍යාව - 2022**




**ප්‍රස්තාරය 2.14** ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සි (පුද්.) සමාගම මඟින් විදේශගත වූ ශ්‍රමිකයින් සංඛ්‍යාව

### රැකියා ක්ෂේත්‍ර අනුව විදේශගත වූ ශ්‍රමිකයන් සංඛ්‍යාව

**වගුව 2.25** රැකියා ක්ෂේත්‍ර අනුව විදේශගත වූ ශ්‍රමිකයන් සංඛ්‍යාව - ශ්‍රී ලං.වි.රැ.ඒ.

| අංක | රැකියා ක්ෂේත්‍රය | එකතුව |
|---|---|---|
| 1 | ගෘහස්ථ සේවක | 117 |
| 2 | සාත්තු සේවක | 2 |
| 3 | මාළු කපන්නා | 11 |
| 4 | Bus captain | 5 |
| 5 | බේකරිකරු | 10 |
| 6 | ආහාර හසුරුවන්නා | 7 |
| 7 | ලොන්ඩ්‍රිකරු | 2 |
| 8 | කම්කරු | 2 |
| 9 | කෘෂි කම්කරු | 17 |
| 10 | ස්ටුවර්ඩ් | 3 |
| 11 | අරක්කැමි | 5 |
| 12 | ගෘහපාලක | 18 |
| 13 | අරක්කැමි (බටහිර) | 4 |
| 14 | අත්උදව්කරු | 15 |
| 15 | රියදුරු | 5 |
| 16 | මාළු අභිජනනය කරන්නා | 2 |
| 17 | ජුකී යන්ත්‍ර ක්‍රියාකරු | 33 |
| 18 | යන්ත්‍ර අළුත්වැඩියා කරන්නා | 2 |
| 19 | පිරිසිදු කරන්නා | 16 |
| 20 | මුළුතැන්ගෙය උදව්කරු | 1 |
| 21 | මුළුතැන්ගෙය සහායක | 1 |
| 22 | බෙදාහරින්නා | 37 |
| 23 | හෙදිය | 2 |
| 24 | House boy | 1 |
| 25 | විදුලි කාර්මික | 1 |
| 26 | චොකොලට් ඔතන්නා | 2 |
| 27 | Ramp officer | 3 |
| | **එකතුව** | **324** |

### 2.2.25 සුනිසි මෙහෙවර වැඩසටහන

සංවර්ධනය කරා යන මාර්ගයට ශ්‍රී ලංකාව අවතීර්ණ වීමට නම් යහපත් රැකියා ප්‍රවර්ධනය කළ යුතු වේ. මෙමගින් නිදහස, සාධාරණත්වය, ආරක්ෂාව හා මානව ගරුත්වය යන තත්ත්වයන් තුළ ඵලදායී වැඩ ලබා ගැනීමට කාන්තාවන්ට හා පිරිමින්ට සමාන අවස්ථා

ප්‍රවර්ධනය කිරීමට අපේක්ෂිතය. එසේම රැකියා නිර්මාණය කිරීම පමණක් අපේක්ෂා නොකරන අතර එම නිර්මාණය කෙරෙන රැකියා පිළිගත හැකි තත්ත්වයේ ඒවා විය යුතු වීම විශේෂත්වයකි. සුනිසි මෙහෙවර වැඩසටහන ප්‍රධාන ස්ථම්භයන් හතරක් තුළ ක්‍රියාත්මක වේ. එනම්, රැකියා උත්පාදනය, ප්‍රවර්ධනය හා ජාතික ඵලදායීතාව, වැඩබිමෙහි හිමිකම, සමාජ ආරක්ෂණය සහ සමාජ කතිකාවත. මෙම ප්‍රධාන ස්ථම්භ 4ට අමතරව ඵලදායිතා ප්‍රවර්ධනය හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය තහවුරු කිරීම යන විෂය ක්ෂේත්‍රයන් ආවරණය වන පරිදි වැඩසටහන් ක්‍රියාත්මක කරමින් සෑම අංශයක්ම සම්බන්ධීකරණය කරනු ලැබේ.

සුනිසි මෙහෙවර වැඩසටහන යටතේ විවිධ වැඩසටහන් හා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට රුපියල් මිලියන 14.95ක් පහත සඳහන් ආයතනවලට වෙන් කර විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.

**වගුව 2.26** සුනිසි මෙහෙවර වැඩසටහන ක්‍රියාත්මක කිරීම - 2022

| | ආයතනය | වෙන් කර ඇති ප්‍රතිපාදනය (රු) | උපයෝජනය කරන ලද ප්‍රමාණය (රු.) | වියදම් ප්‍රතිශතය |
|---|---|---|---|---|
| 01 | කම්කරු දෙපාර්තමේන්තුව | | | |
| i | කාන්තා හා ළමා කටයුතු අංශය | 4,202,034.00 | 2,213,902.80 | 52.68% |
| ii | මානව සම්පත් සංවර්ධන අංශය | 1,423,010.00 | 1,315,215.00 | 92.42% |
| iii | කර්මාන්තමය සුරක්ෂිතතා අංශය | 125,000.00 | 125,000.00 | 100% |
| iv | ශ්‍රම ප්‍රමිති අංශය | 375,000.00 | - | - |
| v | සැලසුම් පර්යේෂණ පුහුණු හා ප්‍රකාශන අංශය | 2,189,405.20 | 489,405.20 | 22.35% |
| | | **8,314,449.00** | **4,143,523.20** | **49.83%** |
| 02 | ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය | 3,500,000.00 | 3,454,500.00 | 98.7% |
| 03 | ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය | 3,136,000.00 | 3,059,500.00 | 97.56% |
| | **මුළු එකතුව** | **14,950,449.00** | **10,657,523.20** | **71.28%** |

### 2.2.26 සැලසුම්, පර්යේෂණ හා සංවර්ධන කටයුතු

**1. අමාත්‍යාංශ කාර්යාලය**

I. මෙම අමාත්‍යාංශය විසින් වාර්ෂිකව කම්කරු ක්ෂේත්‍රයේ විවිධ කාලෝචිත තේමාවන් පාදක කර ගනිමින් පර්යේෂණ ජර්නලයක් ප්‍රකාශයට පත් කරයි. ඒ අනුව, 2022 වර්ෂයේ "Dawn for Informal Sector Workers" යන තේමාව පදනම් කර ගනිමින් පර්යේෂණාත්මක ලිපි කැඳවීම සිදු කර අවසන් අතර ඒවා කම්කරු විෂය පිළිබඳ හසළ දැනුමැති විද්වත් කමිටුවක් විසින් ඇගයීමෙන් අනතුරුව ඊ ජර්නලයක් ලෙස ප්‍රකාශයට පත් කිරීමට නියමිතය.

II. කම්කරු හා විදේශ රැකියා ගරු අමාත්‍යතුමාගේ සංකල්පයක් මත කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය යටතේ පවතින ආයතන තුළින් මහජනතාව වෙත ලබා දෙන සේවාවන් ජනතාවට වඩාත් සමීප කරවීම සඳහා GLOCAL FAIR - 2022 ජංගම සේවා වැඩසටහන - ගාල්ල, සමනල ක්‍රීඩාංගණයේදී 2022 ඔක්තෝබර් 15 සහ 16 දෙදින තුළ පවත්වන ලදී. මෙම වැඩසටහන සඳහා 9,750ක මහජන සහභාගීත්වයක් පැවති අතර

ගාල්ල දිස්ත්‍රික්කයේ ජංගම සේවාව පැවැත්වුව ද, මුළු සහභාගීත්වයෙන් 14%ක් වෙනත් දිස්ත්‍රික්කවලින් පැමිණ තිබීම මඟින් සේවා ලබා ගැනීම සඳහා ජනතාවට පැවති අවශ්‍යතාව හා උනන්දුව පිළිඹිබු වේ.

III. සුනිසි මෙහෙවර වැඩසටහන ක්‍රියාත්මක කිරීමට අදාළ සියලු සම්බන්ධීකරණ කටයුතු සිදු කරන ලද අතර එහි ප්‍රගතිය 2.2.25 යටතේ දක්වා ඇත.

IV. ශ්‍රී ලංකා සේවක සඟරාව ප්‍රකාශයට පත් කිරීම සම්බන්ධ සියලු කටයුතු සිදු කිරීම. වර්තමානයේ දී අර්ධ වාර්ෂිකව ප්‍රකාශයට පත් කරනු ලබන ශ්‍රී ලංකා සේවක සඟරාවේ සමාලෝචිත කාලයට අදාළව කාණ්ඩ අංක 72හි II කලාපය හා 73හි I කලාපය ප්‍රකාශයට පත් කරන ලදී.

V. අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති ආයතන විසින් සිදු කරනු ලබන සංවර්ධන ඉලක්කයන් ඇතුලත් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කර අදාළ පාර්ශව වෙත යොමු කිරීම. ශුන්‍ය පාදක අයවැය සංවර්ධන වැඩසටහන යටතේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ සෑම මසකම ප්‍රගතිය ඇගයීම මඟින් ඉලක්ක වෙත ළඟාවීම අධීක්ෂණය හා දිරිගැන්වීම

VI. ජාතික අයවැය චක්‍රලේඛ අනුව ජනාධිපති ලේකම් කාර්යාලය, මුදල් අමාත්‍යාංශය, ව්‍යාපෘති කළමණාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව හා ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධීකරණය පැවැත්වීම හා ප්‍රගති වාර්තා මාසිකව හා ත්‍රෛමාසිකව ඉදිරිපත් කිරීම

VII. අමාත්‍යාංශය විසින් 2021 වර්ෂයේදී අත්කරගත් ප්‍රගතිය ඇතුලත් වාර්ෂික කාර්යසාධන වාර්තාව සකස් කිරීම

VIII. අමාත්‍යාංශයේ 2023 වර්ෂයට අදාළ අයවැය ප්‍රතිපාදන අනුමත කර ගැනීම සඳහා පවත්වනු ලබන පාර්ලිමේන්තුවේ අයවැය කාරක සභා විවාදයට ඉදිරිපත් කිරීම සඳහා ප්‍රගති වාර්තාව සකස් කිරීම

**2. කම්කරු දෙපාර්තමේන්තු කාර්යයන් අධීක්ෂණය මඟින් ඉලක්කයන් කරා මෙහෙයවීම**

කම්කරු දෙපාර්තමේන්තුවේ 2022 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කරන ලද අතර ඒ යටතේ වන ඉලක්කයන් සාක්ෂාත් කර ගැනීම උදෙසා දෙපාර්තමේන්තුවේ සියලුම අංශයන් හා ප්‍රාදේශීය කාර්යාල කටයුතු කරනු ලබන ආකාරය සහ ප්‍රගතිය පරීක්ෂා කරන ලදී.

ඒ අනුව, කම්කරු කොමසාරිස්වරුන්ගේ මාසික රැස්වීම සෑම මාසයකදීම පවත්වන ලද අතර එහිදී එක් එක් අංශයන්හි ප්‍රගතිය සහ අංශයන්හි කටයුතු සිදු කරගෙන යාමේදී මතුවී ඇති ගැටලු සම්බන්ධයෙන් ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳව සාකච්ඡා කරන ලදී.

එසේම, දිස්ත්‍රික් හා උප කම්කරු කාර්යාලයන් විසින් අදාළ වාර්ෂික ඉලක්ක කරා යොමු වීම අධීක්ෂණය ද සිදු කරන ලදී. 2021.12.31 දින දක්වා වන කාල සීමාව සඳහා ප්‍රාදේශීය කාර්යාලයන්හි ප්‍රධානීන්ගේ ප්‍රගති සමාලෝචන සම්මන්ත්‍රණය 2022.03.30 දින කම්කරු අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් පවත්වන ලදී.

### 2.2.27 පාලන සහ ආයතන කටයුතු

- 2022 ජනවාරි මස සිට දෙසැම්බර් 31 දක්වා මෙම අමාත්‍යාංශය විසින් අමාත්‍ය මණ්ඩල සංදේශ 43ක් අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කර ඇති අතර ඉන් 39ක් සඳහා අමාත්‍ය මණ්ඩල තීරණ ලැබී ඇත.

- ජුලි වර්ජකයින්ට සහන සැලසීම යටතේ වයස අවු. 65 සම්පූර්ණ වන ජුලි වර්ජකයින් 55ක් වෙනුවෙන් එක් වරක් පමණක් ගෙවන සහන දීමනාව, ගෙවීම් කටයුතු සඳහා අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අයවැය

දෙපාර්තමේන්තුව වෙත නිර්දේශ ඉදිරිපත් කර ඇත

- මහජන පැමිණිලි 580ක් සමාලෝචිත කාලය තුළ ලැබී ඇති අතර සියල්ල ඉදිරි පියවර ගැනීම සඳහා අදාළ අංශ වෙත යොමු කර ඇත. එම අංශවලින් පිළිතුරු වාර්තා 251ක් ලැබී ඇත

- තොරතුරු දැන ගැනීමේ පනත යටතේ ඉල්ලීම් 07ක් ලැබී ඇති අතර සියලුම ඉල්ලීම් සම්බන්ධයෙන් තොරතුරු ලබා දී ඇත

- විවිධ ආයතන මඟින් පවත්වනු ලබන පුහුණු පාඨමාලා සඳහා අමාත්‍යාංශ නිලධාරීන් 200ක් සමාලෝචිත කාලය තුළ සහභාගි කරවා ඇත. පෞද්ගලික ලිපි ගොනු කළමණාකරණය, ව්‍යාපෘති වාර්තා සැකසීම, බැහැරගත නායකත්ව හා පෞරුෂ සංවර්ධන වැඩමුළු සහ පශ්චාත් උපාධි පාඨමාලා වැනි පාඨමාලාවන් සඳහා මෙම නිලධාරීන් යොමු කරවා ඇත

- අමාත්‍යාංශයේ විදේශ රැකියා අංශයෙහි සේවයේ නියුක්ත සංවර්ධන නිලධරයන් සඳහා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත. මෙම පුහුණු වැඩසටහන්, වත්මන් විදේශ රැකියා අවස්ථා පිළිබඳ දැනුවත් කිරීම, පවුල් පසුබිම් වාර්තා නව චක්‍රලේඛය පිළිබඳ දැනුවත් කිරීම හා පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන් වශයෙන් පවත්වා ඇත

- විදේශීය ශිෂ්‍යත්ව වැඩමුළු සහ පුහුණු වැඩසටහන් සඳහා මෙම අමාත්‍යාංශයට අදාළ අනෙකුත් ආයතන සහ කම්කරු දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සහභාගි කිරීමට පියවර ගැනීම. 2022 ජනවාරි සිට දෙසැම්බර් දක්වා කාල සීමාව තුළ නිලධාරීන් 47ක් විදේශ පුහුණු පාඨමාලා සහ වැඩමුළු සඳහා සහභාගි කරවා ඇත

මීට අමතරව, සමාලෝචිත කාල සීමාව තුළ පහත ආයතනික කාර්යයන් සිදු කරන ලදී

**වගුව 2.27** ආයතන කටයුතුවල ප්‍රගතිය

| අ. අං. | ක්‍රියාකාරකම | ප්‍රගතිය |
|---|---|---|
| 01 | පාර්ලිමේන්තු වාචික ප්‍රශ්න සඳහා පිළිතුරු | 23 |
| 02 | මහජන පෙත්සම් කාරක සභාවට යොමු කළ වාර්තා | 14 |
| 03 | අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය සඳහා වාර්ෂික වාර්තා ඉදිරිපත් කිරීම | 08 |
| 04 | පාර්ලිමේන්තුවට වාර්ෂික වාර්තා ඉදිරිපත් කිරීම | 07 |
| 05 | අමාත්‍ය මණ්ඩල සංදේශ සඳහා නිරීක්ෂණ | 15 |

### 2.2.28 අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රගතිය

2021 අයවැයෙන් අමාත්‍යාංශයට සහ අනුබද්ධ ආයතනවලට වෙන් කර ඇති මූල්‍ය සම්පත් රාජ්‍ය ප්‍රතිපත්තිවලට අනුකූලව කාර්යක්ෂම, ඵලදායී සහ ආර්ථික පරිපාලනය සඳහා අවශ්‍ය පියවර ගෙන ඇත.

**වගුව 2.28** භාණ්ඩාගාර ප්‍රතිපාදන උපයෝජනය කිරීම


| ආයතනය | පුනරාවර්තන වියදම (රු.)'000 | ප්‍රාග්ධන වියදම (රු.)'000 |
|---|---|---|
| 1. අමාත්‍යාංශ කාර්යාලය | | |
| කම්කරු අංශය | 218,936 | 10,910 |

| | | | |
|---|---|---|---|
| | විදේශ රැකියා අංශය | 701,244 | 139,780 |
| 2 | ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය | 11,686 | 3,301 |
| 3 | ජාතික වෘත්තීය සුරක්ෂිතතා සහ සෞඛ්‍ය ආයතනය | 4,489 | 1,605 |
| 4 | කම්කරු වන්දි කොමසාරිස් කාර්යාලය | 37,272 | 1,624 |
| 5 | ජාතික එලදායිතා ලේකම් කාර්යාලය | 524,637 | 15,906 |
| | **එකතුව** | **1,498,264** | **173,126** |
| 6 | කම්කරු දෙපාර්තමේන්තුව | 2,298,071 | 280,211 |
| 7 | මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව | 499,476 | 20,739 |
| | **මුළු එකතුව** | **4,295,811** | **474,076** |

### 2.2.29 අභ්‍යන්තර විගණන කටයුතු

කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය හා ඒ යටතේ පවතින කම්කරු දෙපාර්තමේන්තුව, මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව, කම්කරු වන්දි කොමසාරිස් කාර්යාලය, ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය, ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය, ශ්‍රම වාසනා අරමුදල, ජාතික එලදායිතා ලේකම් කාර්යාලය, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය හා ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සි පෞද්ගලික සමාගම යන ආයතනයන්හි අදාළ අභ්‍යන්තර විගණන කටයුතු සිදු කිරීමේ වගකීම හා අවශ්‍යතාවය අනුව විශේෂ පරීක්ෂණ ද අභ්‍යන්තර විගණන විෂයට අදාළ විෂයපථය වේ.

**විගණන කළමනාකරණ කමිටු රැස්වීම් සහ සිදුකළ විගණන පරීක්ෂණ**




| | කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය | කම්කරු දෙපාර්තමේන්තුව | ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය | ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය | කම්කරු වන්දි කොමසාරිස් කාර්යාලය | ජාතික එලදායිතා ලේකම් කාර්යාලය | මිනිස්බල රැකීරක්ෂා දෙපාර්තමේන්තුව | ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය | ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සි පුද්ගලික සමාගම |
|---|---|---|---|---|---|---|---|---|---|
| පැවැත්වූ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් ගණන | 4 | 4 | 4 | 4 | 4 | 4 | 4 | 2 | 2 |
| සිදුකළ විගණන පරීක්ෂණ ගණන | 3 | 16 | 1 | 2 | 0 | 5 | 0 | 1 | 0 |

**ප්‍රස්තාරය 2.15** අභ්‍යන්තර විගණන කටයුතුවල ප්‍රගතිය

**සටහන්:**

I. සියලුම ආයතනවල අදාළ තොරතුරු ඇතුළත් කර කාර්තු 04 සඳහා කාර්තු වාර්තාව නිකුත් කරනු ලැබේ

II. වර්ෂය ආරම්භයේ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන සියලුම ආයතන වෙතින් තොරතුරු කැඳවීමෙන් මූලික වාර්තාව ඉදිරිපත් කරනු ලැබේ

III. විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම සඳහා සෑම ආයතනයකම අදාළ රැස්වීම් සාකච්ඡා සටහන් හා රැස්වීම අවසානයේ ඒ ඒ ආයතනය සඳහා රැස්වීම් වාර්තා සකස් කර ඉදිරිපත් කරනු ලබයි